2022 අගෝස්තු 15

2022 ஆகஸ்ட் 15

15 August 2022

NAOSL

# 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව

# 2018 இன் 19 ஆம் இலக்க தேசிய கணக்காய்வு அதிகாரச்சட்டத்தின் 14 ஆவது பிரிவின் பிரகாரம் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படுகின்ற கணக்காய்வாளர் தலைமை அதிபதியின் மூன்றாண்டு அறிக்கை

# Triennial Report of the Auditor General presented in parliament in terms of Section 14 of the National Audit Act, No. 19 of 2018

එකලොස් වන කාණ්ඩය - 01

பதினோராவது தொகுதி - 01

Eleventh Volume - 01

## මුදල් අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක

## நிதி அமைச்சு, நிதி அமைச்சின் கீழான திணைக்களங்கள் மற்றும் விசேட செலவின அலகுகள்

## Ministry of Finance, Departments & Special Expenditure Units under the Ministry of Finance


ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE




පටුන


| අනු අංකය | ශීර්ෂය | අමාත්‍යාංශයේ නම | පිටු අංක |
|---|---|---|---|
| 1. | 01 | ජනාධිපති ලේකම් කාර්යාලය | 4 - 17 |
| 2. | 02 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 18 - 19 |
| 3. | 24 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | 20 - 33 |
| 4. | 102 | මුදල් අමාත්‍යාංශය | 34 - 39 |
| 5. | 413 | මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රත්සංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය | 40 - 41 |
| 6. | 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 42 - 47 |
| 7. | 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 48 - 51 |
| 8. | 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 52 - 62 |
| 9. | 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 63 - 66 |
| 10. | 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේතුව | 67 - 70 |
| 11. | 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 71 - 72 |
| 12. | 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 73 - 75 |
| 13. | 244 | වෙළඳ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 76 - 77 |
| 14. | 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 78 - 79 |
| 15. | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 80 - 87 |
| 16. | 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 88 - 99 |
| 17. | | රජයේ මූල්‍ය ප්‍රකාශන | 100 - 120 |
| 18. | 251 | තක්සේරු දෙපාර්තමේන්තුව | 121 - 124 |
| 19. | 252 | ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව | 125- 128 |
| 20. | 280 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 129 - 132 |
| 21. | 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | 133 - 134 |
| 22. | 324 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 135- 137 |
| 23. | 329 | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | 138 - 141 |
| 24. | 333 | කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය | 142 - 143 |
| 25. | | ඇමුණුම් | 144 - 159 |

**ත්‍රෛවාර්ෂික වාර්තාව 2018 -2020**

1. හැදින්වීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් සෑම මුදල් වර්ෂ තුනක කාලසීමාවක් අවසන් වීමෙන් පසුව මාස නවයක් ඇතුළත සෑම විගණනය කරනු ලබන ආස්ථිතායක ම තත්ත්ව වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුව යුතුව ඇත. මෙම ත්‍රෛවාර්ෂික වාර්තාවේ මුදල් අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුද, විශේෂ වියදම් ඒකක තුනකටද අදාළ විගණන නිරීක්ෂණ ඇතුළත් වේ. විගණන පනතේ විධිවිධාන යටතේ එක් එක් ආස්ථිතායන් යටතේ හඳුනාගත් ප්‍රධාන ඌනතාවයන්, ඒ සඳහා මා විසින් ලබා දෙන ලද නිර්දේශ සහ අදාළ ආස්ථිතාය විසින් එම ඌනතාවයන්ට අදාළව ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග හා මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලබන දිනය වන විට එම නිරීක්ෂණයන් පිළිබඳව පැවැති තත්ත්වයද සඳහන් කර ඇත.

2. පොදු තොරතුරු

2.1 වාර්ෂික විසර්ජන පනත මගින් සලසා තිබුණු ප්‍රතිපාදන හා උපයෝජනය

මෙම වාර්තාවේ නිරීක්ෂණ ඇතුළත් කර ඇති ආස්ථිතායන් 23 කින් 2018 හා 2019 වර්ෂවලදී ආස්ථිතායන් 22 ක් ක්‍රියාත්මක වී තිබුණි. පාර්ලිමේන්තුව විසින් එම ආස්ථිතායන් 22 සඳහා පිළිවෙලින් එකතුව රු.මිලියන 2,171,053 ක් හා රු.මිලියන 2,342,588 ක් වශයෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී රු.මිලියන 171,535 කින් හෙවත් සියයට 7.9 කින් වැඩි කර තිබුණි. 2020 වර්ෂයේදී මෙම ආස්ථිතායන් සංඛ්‍යාවට තවත් එක් රාජ්‍ය අමාත්‍යාංශයක් එකතු වී තිබුණි. ඒ අනුව 2020 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 2,253,357 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණි. එය 2019 වර්ෂය සමඟ සැසඳීමේදී රු.මිලියන 89,231 කින් හෙවත් සියයට 3.8 කින් ප්‍රතිපාදන අඩු කිරීමකි.

ඉහත සඳහන් විගණන ආස්ථිතායන් 22 ක් විසින් 2018 හා 2019 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 2,141,445 ක් හා රු.මිලියන 2,080,233 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. 2019 වර්ෂයේදී ඉකුත් වර්ෂයේ උපයෝජනය හා සැසඳීමේදී රු.මිලියන 61,272 කින් හෙවත් සියයට 2.9 කින් උපයෝජනය අඩු කර තිබුණි. නමුත් 2020 වර්ෂයේදී උපයෝජනය ඉකුත් වර්ෂයේ වාර්තා කරන තිබුණු උපයෝජනය සියයට 3.7 කින් හෙවත් රු.මිලියන 77,148 කින් වැඩි කර රු.මිලියන 2,157,381 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඇමුණුම 1

2.2 ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම

වාර්තාවේ ඇතුළත් විගණන ආස්ථිතායන් 23 කින් ආස්ථිතායන් 05 ක් ප්‍රධානීන් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වශයෙන් කටයුතු කර තිබුණි. වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ආදායම් සංකේත 23 කින් 2018, 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 129,004 ක්, රු.මිලියන 203,000 ක් හා රු.මිලියන 107,700 ක් වශයෙන් ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2018 වර්ෂය සමඟ 2019 වර්ෂය සැසඳීමේදී ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 73,996 ක් හෙවත් සියයට 57 කින් වැඩි වී තිබුණි. නමුත් 2020 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව 2019 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුවට වඩා

රු.මිලියන 95,300 කින් හෙවත් සියයට 46 කින් අඩු වී තිබුණි. 2018 වර්ෂයේදී ඇස්තමේන්තු කළ ආදායම රු.මිලියන 135,775 කින් හෙවත් සියයට 105 කින් ඉක්මවා රු.මිලියන 264,779 ක ආදායම් රැස් කර තිබුණි. 2019 වර්ෂයේදී ඇස්තමේන්තු කළ ආදායමෙන් රු.මිලියන 104,114 ක් හෙවත් සියයට 51 කින් අඩුවෙන් රු.මිලියන 98,886 ක ආදායම් රැස්කර තිබුණි. 2020 වර්ෂයේදී ඇස්තමේන්තු කළ ආදායම රු.මිලියන 107,700 ක් වී තිබුණත්, එම ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 2,557 කින් හෙවත් සියයට 2.3 කින් ඉක්මවා රු.මිලියන 110,257 ක ආදායම් රැස් කර තිබුණි. ඇමුණුම 2

2.2 අග්‍රිම ශේෂ නිරවුල් කිරීම

මුදල් රෙගුලාසි 373 ප්‍රකාරව සෑම ගිණුම් වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පැවැති අග්‍රිම ශේෂය එදිනම භාණ්ඩාගාරයට පියවිය යුතුව තිබුණත්, භාණ්ඩාගාර පොත් අනුව 2018 දෙසැම්බර් 31 දිනට විගණන ආස්ථිතායන් 22 කට අදාළ එකතුව රු.මිලියන 28,107,617 ක නිරවුල් නොකළ ශේෂයයක් පැවැතුණි. එම ශේෂය 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 8,584,402 ක් වි තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට එය රු.මිලියන 50,363,305 ක් වී තිබුණි. ඇමුණුම 3

2.3 තැන්පත් ගිණුම් ශේෂ

ඒකාබද්ධ අරමුදලට අයත් නොවන භාණ්ඩාගාරයේ ප්‍රධාන ලෙජර් ගිණුම් යටතේ පවතින තැන්පත් ගිණුම්වල ශේෂ ඉදිරි දිනයකදි වෙනත් පාර්ශවයන්ට ගෙවිය යුතු මුදලින් සමන්විත වී ඇත. 2018 දෙසැම්බර් 31 දින වන විට ඉහත සඳහන් ආස්ථිතායන් 21 කින් ආස්ථිතායන් 10 කට අදාළව රු..6,847,322,133 ක ශේෂයක් පැවැති අතර 2019 වර්ෂය අවසන් වන විට එම ආස්ථිතායන් 22 කින් ආස්ථිතායන් 12 කට අදාළව එම ශේෂ එකතුව රු.7,357,979,414 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සමගාමිව 2019 වර්ෂය අවසාන වන විට තැන්පතු ශේෂ එකතුව රු. 510,657,281 කින් හෙවත් සියයට 7.46 කින් වැඩි වි තිබුණි. නමුත් 2020 වර්ෂය අවසාන වන විට ආස්ථිතායන් 15 ක තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 3,084,240,644 ක් වි තිබුණි. ඒ අනුව 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී තැන්පත් ශේෂ එකතුව රු. 4,273,738,770 ක් හෙවත් සියයට 58.08 කින් තැන්පත් ශේෂ වටිනාකම අඩු වී තිබුණි. ඇමුණුම 4

2.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

වාර්ෂික විසර්ජන පනතේ තෙවන උපලේඛයේ සඳහන් අනුමත රජයේ කාර්යයන් වෙනුවෙන් අත්තිකාරම් ගිණුම් සීමාවන් නියම කර තිබුණු අතර, ඉහත සඳහන් විගණන ආස්ථිතායන් 22 ක් වෙනුවෙන් රජයේ නිලධාරින්ට අත්තිකාරම් කාර්යයන් වෙනුවෙන් පනවා තිබුණු සීමාවන් තුළ අත්තිකාරම් ගිණුම් පවත්වා තිබුණි. එම අත්තිකාරම් ගිණුම්වලින් 2018 දෙසැම්බර් 31 දින වන විට රු.639,320,943 ක ණයගැති ශේෂයක් පැවැති අතර, එය 2019 දෙසැම්බර් 31 දින වන රු. 2,191,615 ක් අඩු වී රු.මිලියන 637,129,328 ක් වී තිබුණි. 2020 වර්ෂයේදී එකතු වු රාජ්‍ය අමාත්‍යාංශයද ඇතුළුව විගණන ආස්ථිතායන් 23 ක 2020 දෙසැම්බර් 31 දින වන විට අත්තිකාරම් ණයගැතී ශේෂ එකතුව රු.මිලියන 594,119,225 ක් වී තිබුණි. ඇමුණුම 5

## 2.5 මූල්‍ය නොවන වත්කම්

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 8.2 ඡේදය ප්‍රකාරව සියළුම විගණන ආස්ථිතයන් විසින් තමන් භාරයේ පවතින වත්කම් හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු බවත්, එම සියළුම වත්කම් 2020 වර්ෂය අවසාන වන විට හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරිම සඳහා අවස්ථාවන් ලබා දි තිබුණි. මෙම වාර්තාවට අදාළ 2018 දෙසැම්බර් 31 දින වන විට ආස්ථිතයන් 22 කින් ආස්ථිතයන් 18 කට අදාළව එකතුව රු.මිලියන 61,660 ක වත්කම් හඳුනා ගෙන ගිණුම්ගත කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට ආස්ථිතයන් 22 කින් රු.මිලියන 101,970 ක වත්කම් හඳුනා ගෙන තිබුණු අතර,එය 2018 වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 65 ක වර්ධනයක් වී තිබුණි. 2020 වර්ෂය අවසාන වන විට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව හැර අනෙක් ආස්ථිතයන් 22 ක් විසින් රු.මිලියන 103,304 ක මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණි. එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 1.3 ක වර්ධනයක් වී තිබුණි. ඇමුණුම 6

## 2.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයයන්

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2018 වර්ෂයට පෙර මුදල් රෙගුලාසි 150 හා 151 ප්‍රකාරව වාර්ෂික විසර්ජන ගිණුම් හා ආදායම් ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි. මුදල් රෙගුලාසිවල සඳහන් අවශ්‍යතාවය ඉටු වන පරිදි 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය මගින් රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා 2018 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලෙසත්, එම මූල්‍ය ප්‍රකාශන කට්ටලය සඳහා වන ආකෘති හඳුන්වා දී තිබුණි. මූල්‍ය ප්‍රකාශන රජයේ ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව ඉදිරිපත් කරන ලෙසද දක්වා තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව අප විසින් විගණනය සිදු කර එම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයන් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව තත්ත්වාගණනය නොකළ මතය, තත්ත්වාගණනය කළ මතය, මතය ව්‍යාවනය කිරිම හා අහිත කර මතය වශයෙන් සුදුසු විගණන මතයන් ප්‍රකාශ කරන ලදී.

විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් 2018 වර්ෂයට අදාළ විගණන ආස්ථිතයන් 22 කින් විගණන ආස්ථිතයන් 13 කට තත්ත්වාගණනය නොකළ විගණන මතයන් ප්‍රකාශ කර තිබුණු අතර, ඉතිරි ආස්ථිතයන් 9 ක් වෙනුවෙන් තත්ත්වාගණනය කළ විගණන මතයන් ප්‍රකාශ කර තිබුණි. 2019 වර්ෂයේදී විගණන ආසාථිතයන් 22 කින් ආස්ථිතයන් 16 කට තත්ත්වාගනනය නොකළ විගණන මතයන් ප්‍රකාශ කර තිබුණු අතර, ඉතිරි ආස්ථිතයන් 6 ක් වෙනුවෙන් තත්ත්වාගණනය කළ විගණන මතයන් ප්‍රකාශ කරන ලදී. 2020 වර්ෂයේදී වාර්තාවට අදාළ විගණන ආස්ථිතයන් 23 කින් ආස්ථිතයන් 18 කට තත්ත්වාගණනය නොකළ විගණන මතයන් ප්‍රකාශ කර තිබුණු අතර, ඉතිරි ආස්ථිතයන් 5 ක් වෙනුවෙන් තත්ත්වාගණනය කළ විගණන මතයන් ප්‍රකාශ කරන ලදී. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ගණන්දීමේ නිලධාරීයා වශයෙන් සැලැකෙන රජයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සමාලෝචනයට අදාළ වර්ෂ තුන වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කරන ලදී. ඇමුණුම 7

3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වන වගන්තියේ සඳහන් අවශ්‍යතා ආවරණය වන පරිදි එක් එක් විගණන ආස්ථිතයන් සඳහා වූ වාර්තා පහත පරිදි ඉදිරිපත් කරනු ලැබේ.

**3.1 ශීර්ෂය 1 - ජනාධිපති ලේකම් කාර්යාලය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික්ක වෙත ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදන මත 2018 වර්ෂයේ ආරම්භ කිරීමට සැලැසුම් කර තිබූ ව්‍යාපෘති 15 කින් ව්‍යාපෘති 06 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අත්හැර දමා තිබුණි. ක්‍රියාත්මක තත්ත්වයේ පැවති කර්මාන්තවලද ඉලක්ක හා භෞතික තත්ත්ව පහත පරිදි විය. | | | |
| | (i) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පූඩළුඔය දකුණ ග්‍රාම නිලධාරී වසම තුළ ජීවත්වන ඇඳුම් මැසීමේ කර්මාන්තයේ නියුතු ප්‍රතිලාභීන් 35 දෙනෙකු සඳහා රු.1,559,687 ක වියදමක් දරා මහන මැෂින් ලබාදී තිබුණි. ග්‍රාම ශක්ති විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රතිලාභීන් ලබා ගන්නා ආදායමෙන් කිසියම් | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. | මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා ප්‍රතිලාභීන්ගේ දායකත්වය සඳහා වූ වාරික අය කිරීම ප්‍රමාණවත් නොවන ආකාරයෙන් සිදුවන බව වාර්තා වී ඇත. කොත්මලේ ප්‍රාදේශීය ලේකම් මේ සඳහා පියවර ගන්නා බව වාර්තා කර ඇති බැවින්, සමිතියේ | 2022 මාර්තු 25 දින වන විටත් සමිතියේ සංවර්ධනය සඳහා ප්‍රතිලාභීන්ගේ දායකත්වය ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දායකත්වයක් අදාළ සමිති සංවර්ධනය සඳහා අනෙකුත් ව්‍යාපෘති වලින් ලබාදී තිබුණද මෙම ව්‍යාපෘතිය මඟින් ලබන ආදායමෙන් සමිතියේ සංවර්ධනය සඳහා ප්‍රතිලාභීන්ගේ දායකත්වයක් ලබාගැනීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | | සංවර්ධනය සඳහා ඉදිරියේදී යොදා ගැනීමට හැකි බව ද දැනුම් දී ඇත. | |
| | (ii) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පොරමඩුල්ල ග්‍රාම නිලධාරී වසමෙහි හණ නිෂ්පාදනය ප්‍රවර්ධනය මඟින් වසමේ ජීවත්වන ප්‍රජාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම අරමුණු කරගත් ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.2,589,602 ක වැය කර 2019 මාර්තු 12 දින හණ නිෂ්පාදන යන්ත්‍රය මිලදී ගෙන තිබුණද, 2019 ඔක්තෝබර් මාසයේදී හණ පැළ සිටුවා තිබුණු අතර, දැනට අවට ප්‍රදේශවල ඇති හණ කෙඳි නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගෙන තිබුණි. හණ කෙඳි නිෂ්පාදන යන්ත්‍රයක් රු.120,000 ක් වැය කර මිලදී ගෙන තිබුණද, කර්මාන්තයේ නිරත පුද්ගලයන් බොහෝ | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. | හණ ව්‍යාපෘතිය හඳුන්වාදීමේදී සම්ප්‍රදායානුකූල ක්‍රමවේදයෙන් ඉවත් වී ව්‍යාපෘති සඳහා හඳුන්වාදුන් යන්ත්‍රය යොදා ගැනීමේ යම් පසුබෑමක් සිදුවුවද මේ වන විට රැකියා අවස්ථා 45 ක් ජනිත වී ඇති බවද වාර්තා කර ඇත. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට යන්ත්‍රය භාවිතා කර ආදායම් උපයාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙනෙක් යන්ත්‍රය මඟින් හණ කෙඳි නිෂ්පාදනය කර ගැනීමේදී අතිරේක මුදලක් ගෙවීමට සිදුවන බැවින්, සම්ප්‍රදායික ක්‍රමයට කෙඳි නිෂ්පාදනය සිදුකර තිබුණෙන් 2019 මාර්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා යන්ත්‍රය මඟින් රු.2,505 ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි. | | | |
| (ආ) | 2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ දරිද්‍රතාවය සම්පූර්ණයෙන් තුරන් කිරීමේ තිරසර සංවර්ධන අරමුණ පෙරදැරිව ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය යටතේ තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් තුළ ග්‍රාමශක්ති ජනතා සමිති ස්ථාපිත කර තිබුණි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 හි පළමු අදියර යටතේ 2018 වර්ෂය තුළ සමිති 15 ක් සහ එහි දෙවන අදියර යටතේ 2019 වර්ෂය තුළ සමිති 45 ක් ස්ථාපිත කර තිබුණි. | | | |
| | (i) 2018 වර්ෂයේ එක් සමිතියකට රු.500,000 බැගින් සමිති 07 ක් සඳහා එකතුව රු.3,500,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර විගණිත දිනය වූ 2020 ජනවාරි 16 දින වන විටත් කිසිදු මුදලක් ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා | සලසා ඇති ප්‍රතිපාදන අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් උපයෝජනය කළ යුතු වීම. | ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවශ්‍යතාවය මත සහන පොලී අනුපාතයන් යටතේ ණය ලබා දීමට මෙම මුදල් වෙන් කර ඇතත් මෙතෙක් කිසිවකු ණය ඉල්ලුම්කර නොමැත. මෙම මුදල් සමිති විසින් රාජ්‍ය | 2022 මාර්තු 25 දින වන විටත් ව්‍යාපෘතියේ ප්‍රතිපාදන ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා උපයෝජනය කළේද යන්න පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | උපයෝජනය කර නොතිබුණි. | | බැංකුවක තැන්පත් කර ඇත. | |
| | (ii) හැකියා වර්ධන අරමුදල (ධාරිතා සංවර්ධනය) සඳහා රු.300,000 ක් සමිතියකට වෙන්කර තිබුණු අතර ග්‍රාම ශක්ති සමිති 2 ක් සඳහා ලබාදී තිබූ එකතුව රු.600,000 ක් වූ ප්‍රතිපාදනයෙන් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි. සමිති 07 ක ප්‍රතිපාදන උපයෝජනය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 1 ක සිට සියයට 22 ක් අතර පරාසයක පැවතීමෙන් ප්‍රතිපාදන උපයෝජනය දුර්වල මට්ටමක පැවතුණි. | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළයුතු වීම. | ධාරිතා සංවර්ධනය සඳහා වෙන් කර ඇති මුදල් ද ඒ ඒ සමිතියේ කාලීන අවශ්‍යතාවය මතු වූ පසු උපයෝජනය කරනු ලබන බව දැනුම් දී ඇත. | 2022 මාර්තු 25 දින වන විටත් ධාරිතා සංවර්ධනය සඳහා වෙන් කර ඇති මුදල් ඒ ඒ සමිතියේ කාලීන අවශ්‍යතාවන්ට උපයෝජනය කර තිබුණු බවට තහවුරු කිරීමට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | කොළඹ කොටුව ජනාධිපති මන්දිරයට අදාලව මන්දිර භාරකරු විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, කොටුව ජනාධිපති මන්දිරයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 12 ක ඒකක 24 ක් මහගමසේකර මාවත, ජනාධිපති නිල නිවසේ අවශ්‍යතාවයන් සඳහා නිකුත් කර තිබුණි. මෙම භාණ්ඩ මහගමසේකර මාවත, ජනාධිපති නිල නිවසට නිකුත් කිරීමේදී නිකුත් කිරීමේ නියෝග මඟින් කොටුව ජනාධිපති මන්දිරයේ බඩු වට්ටෝරු පොත්වලින් ඉවත්කොට ලැබීම් | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. | වර්ග 04 ක අයත් භාන්ඩ අයිතම 04 ක් හිටපු ජනාධිපති නිල නිවසට බාර දී ඇති බව ලිඛිතව තහවුරු කර ඇත. අනෙකුත් භාණ්ඩ ලැබී ඇති බව තහවුරු කර ගැනීම සඳහා හිටපු ජනාධිපතිතුමාගේ පෞද්ගලික ලේකම් වෙත දන්වා අදාළ තහවුරු කිරීම් ලබා ගැනීමට කටයුතු කර ඇත. | 2022 මාර්තු 25 දින වන විටත් බඩු වට්ටෝරු පොත්වල අදාල ගැලපීම් සිදු කර ඇති බවට සහ අදාල තහවුරු කිරීම් ලබා ගැනීමට කටයුතු කර ඇති බවට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නියෝග මඟින් මහගමසේකර මාවත ජනාධිපති මන්දිරයේ නිල නිවසේ බඩු වට්ටෝරු පොත්වලට ඇතුළත් කළ යුතු වුවද ඒ අනුව ක්‍රියා කළ බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවූ අතර කොටුව මන්දිරයේ බඩු වට්ටෝරු පොත්වල මේ සම්බන්ධයෙන් ගැලපීමක් හෝ සිදුකර නොතිබුණි. | | | |
| (ඇ) | මු.රෙ.753(2) ප්‍රකාරව පොදු 219 ලැබීම් නියෝගය මඟින් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වට්ටෝරු පොතට ඇතුළත් කර ගබඩාවට ඉදිරිපත් කළ යුතු වුවද, වර්ෂ 2017 සිට 2020 දක්වා එසේ කටයුතු කර නොමැති අවස්ථා නිරීක්ෂණය විය. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. | පෙර වර්ෂවල ලැබීම් නියෝග නිකුත් නොකිරීම සම්බන්ධයෙන් ඒ පිළිබඳ වගකිවයුතු පාර්ශව කැඳවා මූලික විමර්ශනයක් සිදු කිරීමට කටයුතු සූදානම් කර ඇත. | 2022 මාර්තු 25 දින වන විටත් මූලික විමර්ශන කටයුතු කල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | එවකට සිටි මන්දිර භාරකරු විසින් 2019 නොවැම්බර් 18 දින ජනාධිපති මන්දිරයේ භාණ්ඩ භාර ගැනීමේදී, ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අභ්‍යන්තර පාලන) ගේ දුරකථනයෙන් දැනුම් දීමට අනුව නව ගොඩනැගිල්ලේ ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ වර්ග 35 ක ඒකක 61 ඌණතාවයන් තිබෙන බවට අනාවරණය කරගෙන තිබුණද, ඊට අදාල ඉදිරි පියවර ගෙන නොතිබුණි. | වත්කම් කළමනාකරණය විධිමත් කළ යුතු වීම. | ඌණ භාණ්ඩ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කර අනාවරණය වන කරුණු අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | 2022 මාර්තු 25 දින වන විටත් මූලික විමර්ශන කටයුතු කල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) | කාර්යාලය යටතේ ක්‍රියාත්මක වූ ජාතික ආර්ථික සභා කාර්යාලය, එහි ඇති කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ සමඟ තරුණ කටයුතු අමාත්‍යාංශයට භාරදෙන ලෙස | වත්කම් කළමනාකරණය විධිමත් කළ යුතු වීම. | ''ජාතික ආර්ථික සභාවේ'' කාර්යාල පරිශ්‍රය හා එහි කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ 2019.12.17 දින සිට ක්‍රියාත්මක වන | ගෙවා තිබුණු තැන්පතු මුදල භාණ්ඩාගාරය වෙත පියවා ඇති බව තහවුරු කිරීමට |

| | | | | |
|---|---|---|---|---|
| | එවකට සිට පරිපාලන නිලධාරියෙකු වෙත උපදෙස් ලබා දී තිබුණු අතර එම නිලධාරියා ඇතුළු කණ්ඩායමක් විසින් එම භාණ්ඩ අදාල පාර්ශව වෙත භාරදී තිබුණි. මූලික ගිවිසුමට ඇතුළත් වන අවස්ථාවේදී ජනාධිපති කාර්යාලය විසින් සමාගම වෙත ගෙවූ රු. 16,868,576 ක් වූ තැන්පතු මුදල, මේ වන විට ගිවිසුම් කාලය අවසන් වී ඇති බැවින් නැවත ජනාධිපති ලේකම් කාර්යාලය වෙත අයකරගෙන නොතිබුණි. | | පරිදි ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය වෙත පවරා දී ඇති බවට ලිඛිත සාක්ෂි ද ගොනු කර ඇත.<br>ශ්‍රී ලංකා ජාතික ආර්ථික සභාව පිහිටුවීම පිණිස ජනාධිපති කාර්යාලය Overseas Reality (Ceylon) PLC සමග මූලික ගිවිසුමකට ඇතුළත් වන අවස්ථාවේදී ජනාධිපති කාර්යාලය විසින් සමාගම වෙත ගෙවූ තැන්පතු මුදල, මේ වන විට ගිවිසුම් කාලය අවසන් වී ඇති බැවින් නැවත භාණ්ඩාගාරය වෙත ගෙවීමට කටයුතු කරන ලෙස ක්‍රීඩා හා තරුණ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත දන්වා ඇත. | ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) | ජනාධිපති ලේකම් නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී තිබුණු නමුත් භෞතික පැවැත්ම/සන්තකය තහවුරු නොවූ වාහන 50 ක් පිළිබඳව පරීක්ෂාකර බලා නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි. එසේම, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව ජනාධිපති ලේකම් | වත්කම් කළමනාකරණය විධිමත් කළ යුතු වීම. | 2016 වර්ෂයේ සිදු කරන ලද වාහන සමීක්ෂණය මගින් වාහන 14 ක් භෞතිකව පවතින ස්ථාන සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීමට හැකි වී ඇති අතර, මේ වන විට එම වාහනවල ලියාපදිංචි අයිතිය පවරා දීමට කටයුතු කරමින් පවතී. | භෞතික පැවැත්ම/සන්තකය තහවුරු නොවූ වාහන 38 හි ලියාපදිංචි අයිතිය පිළිබඳ නිවැරදි තොරතුරු 2022 මාර්තු 25 දිනට විගණනයට ඉදිරිපත් නොවුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යාලය, ජනාධිපති මන්දිර හා ජනාධිපති ආරක්ෂක අංශවල ලිපිනයන් යටතේ, වෙනත් පුද්ගලයින්ගේ නමින් ලියාපදිංචි වූ වාහන 53 ක් වූ අතර එම වාහන ජනාධිපති ලේකම් කාර්යාලය හා ඒ ආශ්‍රිත අංශවල ලිපින යටතේ ලියාපදිංචි වීමට හෝ එම ලිපින භාවිතා කිරීමට හේතු විගණනයට අනාවරණය නොවුණි. | | එසේ තොරතුරු සොයා ගැනීමට නොහැකි වූ වාහන 38 ක් පිළිබඳ නිවැරදි තොරතුරු ශ්‍රී ලංකා පොලීසිය වෙතින් සොයා ගැනීමට ලිපි යොමු කර ඇත. | |
| (ඍ) | ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන 69 ක් 2016 වර්ෂයේදී යුධ හමුදාවට භාරදී තිබුණු අතර එම වාහන අතරින් වාහන 06 ක් තවදුරටත් ජනාධිපති ලේකම් නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති බව අනාවරණය විය. එසේම, ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් ජනාධිපති ලේකම් නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිකර තිබුණු වාහන 47 ක් විවිධ පුද්ගලයින් හා ආයතන වලට නිකුත් කර තිබුණු නමුත්, මේ දක්වා එම වාහන නැවත පවරා ගැනීමට හෝ ඊට අදාල විධිමත් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන නොතිබුණි. | වත්කම් කළමනාකරණය විධිමත් කළයුතු වීම. | ජනාධිපති ලේකම් කාර්යාලය විසින් යුද්ධ හමුදාවට ලබා දී තිබූ වාහන අතරින් මෙතෙක් පවරාගෙන නොමැති වාහන 06 ක් පවරා ගැනීමට කටයුතු කරන ලෙස යුද්ධ හමුදාවට දැනුම් දී ඇත. වෙනත් ආයතන වෙත ලබා දී ඇති වාහන අතරින් වාහන 27 ක් පිළිබඳ තොරතුරු මේ වන විට ලබාගෙන අදාල පැවරීම් කටයුතු සිදු කරමින් පවතී. අනෙකුත් වාහන 20 පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. එසේ ලබා ගන්නා තොරතුරු අනුව අදාල පැවරීම් සිදු කරනු ඇත. | 2022 මාර්තු 25 දිනට අදාළ පවරා ගැනීම් සිදු කළේද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. |
| (එ) | මාධ්‍ය අංශය ප්‍රධාන ඒකක 04 ක් යටතේ ක්‍රියාත්මක වී තිබුණු අතර | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළයුතු වීම. | 2020 භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව | 2022 මාර්තු 25 දින වන විටත් මාධ්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| | 2019 නොවැම්බර් මාසයේදී නව කාර්ය මණ්ඩලය මාධ්‍ය අංශය භාරගැනීමේදී "නව මාධ්‍ය අංශයේ " හැර වෙනත් කිසිදු අංශයක භාණ්ඩ විධිමත් පරිදි භාර ගැනීමක් සිදුකර නොතිබුණි. ඒ අනුව නව කාර්ය මණ්ඩලය භාණ්ඩ භාරගන්නා අවස්ථාවේදී පැවති තථ්‍ය ශේෂයන් පිළිබඳ පිළිගත හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. කෙසේ වුවද, අංක PMD/ENG/INV/20/01 හා 2020 ජනවාරි 06 දිනැති ජනාධිපති මාධ්‍ය අංශයේ ඉංජිනේරුවන් විසින් ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කර තිබූ " මාධ්‍ය අංශය සතුව තිබී අස්ථාන ගතවූ උපකරණවල දළ වටිනාකම" මැයෙන් වූ වාර්තාව අනුව එම වටිනාකම රු. 34,189,688 ක් පමණ විය. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව මෙතෙක් කටයුතු කර නොතිබුණි. | | ජනාධිපති මාධ්‍ය අංශය තුල දැනට පවතින භාණ්ඩ හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සමස්ථ ඇගයීමක් සිදු කරමින් පවතී. ඒ සඳහා දැනට පවතින භාණ්ඩ හා ඒවායේ ක්‍රියාකාරිත්වය හා පවතින ස්ථානය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් සකස් කිරීම විශේෂ කමිටුවකට පවරා ඇත. ඒ අනුව අනාවරණය කර ගන්නා කරුණු මත වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කැනු ඇත. | අංශය සතුව තිබී අස්ථානගත වූ උපකරණ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළේද යන්න පිළිබඳ විගණනයට තහවුරු නොවුණි. |
| (ඒ) | එම අස්ථානගත වත්කම් තුළ ඇතුළත් 2015 වර්ෂයේ සිට 2020 ජනවාරි මාසය දක්වා මාධ්‍ය අංශය වෙත රු.17,786,325 ක් වටිනා ලැප්ටොප් පරිගණක 104 ක් ලබාදී තිබුණු අතර ඉන් විගණිත දිනය වන විට LAPTOP පරිගණක 26 හා Mac Book Air වර්ගයේ පරිගණක 2 ක් පමණක් නැවත කාර්යාලය වෙත භාරදී තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම. | 2020 භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව ජනාධිපති මාධ්‍ය අංශය තුළ දැනට පවතින භාණ්ඩ හා ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සමස්ත ඇගයීමක් සිදු කරමින් පවතී. ඒ සඳහා පත් කර ඇති කමිටු වාර්තාව අනුව ඌණ හා අක්‍රිය භාණ්ඩ | 2022 මාර්තු 25 වන විටත් අනෙකුත් ලැප්ටොප් පරිගණක නැවත කාර්යාලය වෙත බාර දී තිබේද යන්න පිළිබඳ තොරතුරු සහ ඊට වගකියවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ගත් |

| | | | | |
|---|---|---|---|---|
| | | | සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. |
| (ඔ) | එසේම, ඒ තුළ 2015 වර්ෂයේ සිට 2020 ජනවාරි මාසය දක්වා ලබා දී තිබූ රු.10,380,423 ක් වටිනා DESKTOP පරිගණක 52 කින් පරිගණක 4 ක් නැවත භාරදී තිබුණු අතර පරිගණක 2 ක් නැවත භාවිතයට ගත නොහැකි මට්ටමට පත්ව තිබුණි. එසේම විගණනය විසින් සිදුකල භෞතික පරික්ෂාවේදී බොහෝ desktop පරිගණක භාවිතයට ගත නොහැකි මට්ටමේ තිබූ බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළයුතු වීම. | 2020 භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව ජනාධිපති මාධ්‍ය අංශය තුළ දැනට පවතින භාණ්ඩ හා ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සමස්ත ඇගයීමක් සිදු කරමින් පවතී. ඒ සඳහා පත් කර ඇති කමිටු වාර්තාව අනුව ඌණ හා අක්‍රිය භාණ්ඩ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | 2022 මාර්තු 25 දින වන විටත් භාවිතයට ගත නොහැකි පරිගණක අයිතම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළේද යන්න පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. |
| (ඕ). | අස්ථානගත වත්කම් තුළ 2015 වර්ෂයේ සිට 2020 ජනවාරි මාසය දක්වා මාධ්‍ය අංශයට අනුයුක්තව සිටි නිලධාරීන් වෙත නිකුත් කර තිබූ රු. 3,470,742 ක් වටිනා ජංගම දුරකතන හා I PAD 45 ක් වූ අතර ඉන් ජංගම දුරකථන 14 හා I PAD 03 ක් ආපසු කාර්යාලය වෙත භාරදී ඇති බව දන්වා තිබුණද, ඉන් ජංගම දුරකථන 09 ක් ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණු අතර භාරදී තිබුණු I PAD 02 ක් අක්‍රියව පැවතුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම. | 2020 භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව ජනාධිපති මාධ්‍ය අංශය තුළ දැනට පවතින භාණ්ඩ හා ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සමස්ත ඇගයීමක් සිදු කරමින් පවතී. ඒ සඳහා පත් කර ඇති කමිටු වාර්තාව අනුව ඌණ හා අක්‍රිය භාණ්ඩ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | ඌණ හා අක්‍රිය භාණ්ඩ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු 2022 මාර්තු 25 දිනට විගණනයට ඉදිරිපත් නොවුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ක) | 2017 අගෝස්තු 15 දින අංක 17/1591/701/025 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත “ශ්‍රී ලංකා ජාතික ආර්ථික සභාව” පිහිටුවා තිබුණු අතර අමාත්‍ය මණ්ඩල සටහනට අනුව එහි කාර්යයන් 06 ක් විය. සභාව පිහිටුවීමෙන් පසු එහි අරමුණු / ඉලක්ක ළඟා කර ගැනීම සම්බන්ධව සකස් කළ සැලැසුම් හා එම සැලැසුම් ළඟා කර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධ තොරතුරු විගණනය විසින් ඉල්ලා සිටියද, එම තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය. කෙසේ වුවද, සභාවේ මහලේකම්වරයා 2019 අගෝස්තු 01 දින සිට විදේශ නිවාඩු ලබාගෙන ඇමරිකාව බලා පිටත්ව ගොස් ඇති බවත් එම නිවාඩුව අවස්ථා දෙකකදී 2019 ඔක්තෝබර් 18 දක්වා දීර්ඝ කරන ලෙස ඉල්ලා ඇති බවත්, ඒ අනුව මාස 3 කට ආසන්න කාලයක් විදේශ නිවාඩු ලබා ඇති බැවින් සභාවෙන් ඵලදායි සේවාවක් සිදුවන බව නිරීක්ෂණය නොවන බවත් දක්වා තිබුණි. ඒ අනුව, ආර්ථික සභාවේ කාලය අවසන් කිරීමටත්, තනතුරු අහෝසි කිරීමටත් 2019 ඔක්තෝබර් 09 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, මෙම ආර්ථික සභාව සඳහා 2017 අගෝස්තු මස සිට 2019 දෙසැම්බර් මාසය දක්වා | අපේක්ෂිත අරමුණු/ ඉලක්ක ළඟාකර ගත හැකිවන පරිදි රජයේ මුදල් කළමනාකරණය කළ යුතු වීම. | ශ්‍රී ලංකා ආර්ථික සභාව පිහිටුවීමේ අරමුණු/ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් වූ ලිපිගොනු විගණන අවශ්‍යතාවයන් සඳහා ලබා දීමට හැකිය. | ශ්‍රී ලංකා ආර්ථික සභාව පිහිටුවීමේ අරමුණු/ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් වූ ලිපිගොනු 2022 මාර්තු 25 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොවුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මාස 29 ක කාලය තුල රු. 237,784,472 ක වියදම් දරා තිබුණි. | | | |
| (කා) | විගණිත දිනය වන විට, ජනාධිපති කාර්යාලය විසින් භාවිතා කරමින් තිබූ ගබඩා කළමනාකරණ මෘදුකාංග පද්ධතිය, 2013 වර්ෂයේදී පෞද්ගලික ආයතනයකින් රු.මිලියන 1.6 කට මිලදී ගෙන තිබූ අතර ගබඩා අංශය විසින් එම පද්ධතිය වැඩිදියුණු කිරීමේ යෝජනා 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වරින් වර ඉල්ලීම් ඉදිරිපත් වී තිබුණද, ඒ පිළිබඳව ඉදිරි කටයුතු සිදු කර නොතිබුණි. | පද්ධතිය යාවත්කාලීන කළ යුතු වීම. | ජනාධිපති කාර්යාලයේ ගබඩා කළමනාකරණ පද්ධතිය මේ වන විටත් නිසි ක්‍රියාකාරී මට්ටමේ පවතී. පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා හඳුනාගත් ඇතැම් කාර්යයන් සඳහා යෝජනා පමණක් වරින් වර ඉදිරිපත් කර ඇති අතර, එම කටයුතු සිදු කරනු ඇත. | ජනාධිපති කාර්යාලයේ ගබඩා කළමනාකරණ පද්ධතිය නිසි ක්‍රියාකාරී මට්ටමේ පවතීද යන්න පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු 2022 මාර්තු 25 දිනට විගණනයට අනාවරණය නොවුණි. |
| (කැ) | අනුරාධපුර ජනාධිපති මන්දිරයේ වර්ෂ කිහිපයක් පුරාම සමීක්ෂණ මණ්ඩලවලින් ඌනතාවයක් වශයෙන් අනාවරණය වූ රූපවාහිණී යන්ත්‍ර 02 ක් සම්බන්ධයෙන් මු.රෙ.760 ප්‍රකාරව ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විධිමත් උපදෙස් ලබාදී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | මෙම රූපවාහිනී යන්ත්‍ර දෙක (02) අළුත්වැඩියාව සඳහා තොරතුරු තාක්ෂණ ඒකකය වෙත ගෙන ගොස් ඇති බවත්, එම රූපවාහිනී යන්ත්‍ර දෙක (02) සම්බන්ධයෙන් නිර්දේශ ලබා දෙන ලෙස අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) වෙත අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන හා මෙහෙයුම්) විසින් උපදෙස් ලබා දී ඇති බව. | ඌණතාවයක් වශයෙන් ඉදිරිපත් කළ රූපවාහිනී 02 සම්බන්ධයෙන් ලබා දුන් විධිමත් උපදෙස් හා නිර්දේශ 2022 මාර්තු 25 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොවුණි. |
| (කෑ) | කතරගම ජනාධිපති මන්දිරයේ භෞතික පරීක්ෂාවේදී අයිතම 12 ක ඌනතාවයක් තිබුණි. ඉන් භාණ්ඩ 02 ක් අලුත්වැඩියා සඳහා 2017 හා 2013 වර්ෂයන්හි භාරදී තිබූ අතර, | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | මෙම රූපවාහිනී යන්ත්‍රය සහ ෆැක්ස් යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා තොරතුරු තාක්ෂණ ඒකකය වෙත ගෙන | 2022 මාර්තු 25 දින වන විටත් අදාල අයිතම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි |

| | | | | |
|---|---|---|---|---|
| | එම භාණ්ඩ අලුත්වැඩියාවන් නිම කර 2021 වර්ෂය වන විටත් ආපසු ලැබී නොතිබුණි. | | ගොස් ඇති බවත්, එම රූපවාහිනී යන්ත්‍රය සහ ෆැක්ස් යන්ත්‍රය සම්බන්ධයෙන් නිර්දේශ ලබා දෙන ලෙස අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) වෙත අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන හා මෙහෙයුම්) විසින් උපදෙස් ලබා දී ඇති බව. | ප්‍රකාරව කටයුතු කර තිබේද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. |
| (කෙ) | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ව්‍යවස්ථාපිත කටයුතු අංශයේ 2019 වර්ෂයේදී අපහරණය කිරීම සඳහා භාරදී තිබූ පරිගණක UPS 02 ක් සඳහා මු.රෙ.772 ප්‍රකාරව කිසිඳු නියෝගයක් 2021 ජූලි 09 දිනට විෂය නිලධාරියා වෙත ලබාදී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ව්‍යවස්ථාපිත කටයුතු අංශයේ අපහරණය කිරීමට භාරදී තිබූ පරිගණක UPS 02ක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකයේ ගබඩා කර ඇති බවත්, එම උපාංග වෙන්දේසි කිරීමට සැලසුම් කර ඇති බැවින් එම වෙන්දේසියෙන් පසු අදාල අයිතමයන්, වට්ටෝරු ලේඛනවලින් කපා හැරීමට අදාල නියෝග නිකුත් කිරීමට කටයුතු කරන බව. | අදාල අයිතමයන්, වට්ටෝරු ලේඛනවලින් කපා හැරීමට අදාල නියෝග නිකුත් කිරීමට 2022 මාර්තු 25 දින වන විටත් අදාළ භාණ්ඩ අපහරණය කර පොත්වලින් ඉවත් කර නොතිබුණි. |
| (කේ) | "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව සැමට පානීය ජලය ලබාදීම සම්බන්ධයෙන් ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව සහ එම | තිරසර සංවර්ධන අරමුණු ඉටු කරගැනීමේ ප්‍රගතිය සංඛ්‍යාත්මකව මැනිය හැකි දර්ශක කාර්යසාධන | අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ සහ ආයතන වෙත පවරා ඇති ව්‍යාපෘති සහ වැඩසටහන් | 2021 සඳහා කාර්යසාධන වාර්තාව විගණනය වෙත 2022 මාර්තු 25 දින |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාවෙහි ඇතුළත්වී නොතිබුණි. | වාර්තාවට ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය | ක්‍රියාත්මක කිරීම සඳහා අදාල පාර්ශවයන් අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම සහ අවශ්‍ය රැස්වීම් සංවිධානය කිරීම ජනාධිපති කාර්යාලයේ අදාල එක් එක් අංශ විසින් සිදු කරනු ලබයි. එමෙන්ම, එම සියලුම සංවර්ධන කාර්යයන්ට අදාල කාර්යසාධනය අඛණ්ඩව අධීක්ෂණය කිරිම සහ අවස්ථානුකූලව ඒවායේ ප්‍රගතිය අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම ද එම අංශ මගින් සිදු කරන බව.<br>ඒ අනුව, ව්‍යාපෘති සංඛ්‍යාව හෝ වැඩසටහන් පිළිබඳ තොරතුරු අදාල අමාත්‍යාංශ හෝ ආයතනයන්හි කාර්යසාධනය යටතට ගැනෙන බව. | වන විට ඉදිරිපත් වී නොමැති බැවින් ප්‍රගතිය නිශ්චය කර ගැනීමට නොහැකි විය. |
| (කො) | "දැයට එළිය" ව්‍යාපෘතිය යටතේ ලක්ෂයකට අධික ඉතාම දිළිඳු පවුල් සඳහා කිසිඳු අයකිරීමකින් තොරව විදුලිය ලබාදීම යන ඉලක්කය සඳහා ජයග්‍රහණ දර්ශකය ලෙස පවත්වනු ලබන රැස්වීම්/ සාකච්ඡා සංඛ්‍යාව ලෙස | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය මැනිය හැකි දර්ශක, කාර්යසාධන වාර්තාවට ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය | - එම - | 2021 සඳහා කාර්යසාධන වාර්තාව විගණනය වෙත 2022 මාර්තු 25 දින වන විට ඉදිරිපත් වී නොමැති බැවින් ප්‍රගතිය නිශ්චය කර |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහන් කර තිබුණි. ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග හෝ ඉටුකල ව්‍යාපෘති පිළිබඳ සංඛ්‍යාත්මකව මැනිය හැකි දර්ශක කාර්යසාධන වාර්තාවෙහි ඇතුලත්වී නොතිබුණි. | | | ගැනීමට නොහැකි විය. |
| (කෝ) | පරිපූර්ණ සහ සාධාරණ අධ්‍යාපනයක් සුරක්ෂිත කිරීම සහ සැමට ජීවිත කාලය පුරා අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කිරීම යන අරමුණ යටතේ පාසල් සඳහා ෆයිබර් ඔප්ටික්ස් තාක්ෂණික සම්බන්ධතා ලබාදීමේ ඉලක්කය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළ ෆයිබර් ඔප්ටික්ස් තාක්ෂණික සම්බන්ධතා ලබාදුන් පාසල් සංඛ්‍යාව කාර්යසාධන වාර්තාවෙහි ඇතුළත්වී නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය සංඛ්‍යාත්මකව මැනිය හැකි දර්ශක කාර්යසාධන වාර්තාවට ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය | - එම - | 2021 සඳහා කාර්යසාධන වාර්තාව විගණනය වෙත 2022 මාර්තු 25 දින වන විට ඉදිරිපත් වී නොමැති බැවින් ප්‍රගතිය නිශ්චය කර ගැනීමට නොහැකි විය. |

### 3.2 ශීර්ෂය 2 - අග්‍රාමාත්‍ය කාර්යාලය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය තුළදී ප්‍රාග්ධන වැය විෂයයන් දෙකක් සඳහා සලසා තිබුණු එකතුව රු.44,500,000 ක සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල කළ යුතුවීම | අදහස් දක්වා නොතිබුණි. | තාත්ත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා 2021 වර්ෂයේදීද වැය විෂයයන් 03 ක් වෙනුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 17 ක සිට සියයට 53 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. |
| (ආ) | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ සංහිඳියා ක්ෂේත්‍රය යටතේ දක්වා තිබූ සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය මඟින් සම්බන්ධීකරණය කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණි. | 2020 වර්ෂයේදීද මාස 03 ක් ක්‍රියාත්මක වී ඇති බැවින් හා එහි කටයුතු එම වර්ෂයේ අවසන් වී ඇති බැවින් එහි ප්‍රගතිය දැක්වීමට කටයුතු කළ යුතු වීම. | 2020 මාර්තු 31 දිනෙන් සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලයේ කටයුතු අවසන් වී ඇති බැවින් ඒ සඳහා ප්‍රගතියක් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව | 2022 මාර්තු 23 දින වන විටත් 2020 මාර්තු මාසයෙන් අවසන් කාල පරිච්ඡේදයට අදාළව ප්‍රගතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | සහශ්‍ර අභියෝගිතා සංස්ථා ව්‍යාපෘති කාර්යාලය යටතේ වූ ඉඩම් පරිපාලන | සැලසුම් කළ කාර්යයන් එපරිදි ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය | ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කලද රටේ පැවති වාතාවරණය හා ව්‍යාපෘතිවල ස්වභාවය අනුව නිසිපරිදි | 2021 වර්ෂයේදීද, මූලධන වියදම් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 7.26 |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යාපෘතිය හා ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය 2019 වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි. | | ක්‍රියාත්මක නොවූ බව දන්වා එවා තිබුණි. | ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. |
| (ඇ) | 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ග්‍රාම රාජ්‍ය ඒකක 2500 පිහිටුවීමේ සහ පොදු සේවා සැපයුම් අධිකාරිය (Public Service Delivery Authority) පිහිටුවීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටු කිරීමට කටයුතු කල යුතුවීම. | ප්‍රමුඛ පදනම මත වෙනත් විවිධ වැඩසටහන් හා කාර්යයන් ඉටුකිරීමට සිදු වූ හෙයින් මේ සම්බන්ධව කරුණු ඉදිරියට පවත්වාගෙන යාමක් සිදුවී නොමැති බව. | 2022 මාර්තු 23 දින වන විටත් එම අරමුණු ඉටු කර නොතිබුණි. |

### 3.3 ශීර්ෂය 24 - ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156(ඇ)(2) ව්‍යවස්ථාව ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ඉටු කළ යුතු කාර්යයන් අතර ලංසුකරුවන්ට ලංසු කැඳවීමේ ක්‍රියාවලියට සහභාගිවීම පිණිස සමාන අවස්ථාවන් ලබාදී ඇද්ද යන්න නියාමනය කර උචිත බලධරයන් වෙත වාර්තා කිරිම මෙන්ම, ප්‍රසම්පාදනයන්ට සම්බන්ධ සැපයුම් කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන්ට යෝග්‍ය පරිදි සුදුසුකම් තිබේද යන්න පිළිබඳ වාර්තා කිරීම කළ යුතුව තිබුණි. ලැබෙන පැමිණිලිවලට පමණක් එම කාර්යයන් සිදුකර තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පවත්නා කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම මේ සඳහා හේතු වී ඇති අතර මාර්ගගත පරීක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වාදෙමින් ලංසු ඇගයීමේ කමිටුවක සාමාජිකයකු වීම සඳහා ලබාගත යුතු අවම සුදුසුකම් මට්ටමක් හඳුන්වාදීම අපේක්ෂා කෙරේ. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ආ) | ආයතනයේ මෙහෙවරට අදාලව ඉදිරිපත් කර තිබූ | අදාල මෙහෙවර ඉටුකිරීම සඳහා බලය පැවරෙන | මෙම ක්‍රියාවලිය ප්‍රමාදවීම ප්‍රසම්පාදන කොමිෂන් | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට |

| | | | | |
|---|---|---|---|---|
| | භාණ්ඩ, වැඩ හා සේවා, තොරතුරු පද්ධති හා උපදේශකයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් වූ මගපෙන්වීම් සඳහා 2019 මැයි මාසය වන විටත් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | නීතිමය රාමුව සකස් කළ යුතු වීම. | සභාවට කිසිසේත් වලක්වා ගත නොහැකි හේතූන් මත සිදුවී ඇති බව දන්වනු කැමැත්තෙමි. | අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ඇ) | ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් 2018 වර්ෂය තුළදී ලැබී තිබුණු පැමිණිලි 151 කින් 67 ක් පරීක්ෂා කර වාර්තා නිකුත් කර තිබූ අතර 10 ක විමර්ෂණ කටයුතු අවසන් කර වාර්තා නිකුත් කර නොතිබුණි. පැමිණිලි 27 ක් තොරතුරු කැඳවීම්වලට පමණක් සීමාවී තිබුණි. | සැලසුම් කළ කාර්යයන් නියමිත කාල රාමුව තුළ ඉටු කළ යුතු වීම. | එකඟ වෙමි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ඈ) | 2018 ජුලි 31 දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වාගෙන ගිය කොමිෂන් සභා කාර්යාලය සඳහා මාසික කුලිය රු.931,834 ක් වී තිබුණත්, බත්තරමුල්ලේ පිහිටා ඇති නව කාර්යාලීය ගොඩනැගිල්ලේ මාසික කුලිය රු. 2,028,600 ක් විය. පැරණි කාර්යාලය පවත්වාගෙන යාමේදී ඇරීමට සිදු නොවූ නමුත් නව | වැයවන මුදලට උපරිම කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පිහිටි ගොඩනැගිලි දෙකක ස්ථාන හයක මුලු ඉඩ ප්‍රමාණය වර්ග අඩි 2231 ක් වූ ඉඩ ප්‍රමාණයක ස්ථාපිත කර තිබූ අතර ඒ සඳහා වූ කුලිය මාසිකව වර්ග අඩියක් සඳහා රු.375.00 ක් විය (බදු රහිත).<br>එවකට සිටි කාර්ය මණ්ඩලයටද ප්‍රමාණවත් නොවූ අතර කොමිෂන් සභාවේ සභාපති තුමාටද භාවිතා කිරීමට සිදු වූයේ පොදු | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලට පැමිණීම හේතුවෙන් විදුලිබලය, පවිත්‍රතා, ජලය හා ආරක්ෂක වැනි වියදම් සඳහා 2018 අගෝස්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා මාස 05 ක කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.1,885,496 ක අතිරේක වැයක් දැරීමට සිදුව තිබුණි. | | වැසිකිළි සහ පොදු ජල කරාම බැව් දන්වනු කැමැත්තෙමි. ඉඩ පහසුකම් අඩුවීම නිසා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා පිටතින් ඉඩකඩ සපයා ගැනීමටද කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමටද නොහැකි විය. කාර්යාල කටයුතු ඉටුකර ගැනීමේදි විවිධ ගැටලු උද්ගත විය. | |
| (ඉ) | උක්ත ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා 2017 සැප්තැම්බර් 29 දින පළකර තිබුණු පුවත්පත් දැන්වීමේ සඳහන් පරිදි අවශ්‍ය ඉඩ ප්‍රමාණය වර්ග අඩි 6000 ක් ලෙසද, 2018 ජනවාරි මාසයේ පළකර තිබූ දැන්වීම අනුව අවශ්‍ය වර්ග අඩි ප්‍රමාණය 8500-10500 ක් අතර ප්‍රමාණයක් ලෙසද සඳහන් කර තිබුණි. තවද කොමිෂන් සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරියෙන් විමසා තිබුණේ වර්ග අඩි 1500-2000 අතර ඉඩ ප්‍රමාණයක් පිළිබඳව වේ. කෙසේ වුවද දැනට කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිල්ල වර්ග අඩි 13400 ක් වූ අතර අනුමත | වැයවන මුදලට උපරිම කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය වර්ග අඩි 8500 – 10500 කට ආසන්න විය යුතු බව හා වාහන 10ක් වත් ගාල් කිරීමේ හැකියාව ද සලකා බලන ලදී.<br>මහල් වෙන්කොට භාවිතයට ගැනීම ගැටළු සහිත විය හැකි බව හා කුලී මුදලේ සාධාරණභාවයත් සලකා මුළු ගොඩනැගිල්ල කුලියට ගෙන ඇත. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්ය මණ්ඩලය 50 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 27 ක් පමණක් විය. එහෙත් කොමිෂන් සභාව සඳහා වර්ග අඩි 13,400 ප්‍රමාණයම වර්ග අඩි 12,000 ක් වෙනුවෙන් වර්ග අඩියක් සඳහා (එකතු කළ අගය මත බදු රහිත මිලට) රු.147 බැගින් මාසිකව ගෙවීම් කර ගොඩනැගිල්ල කුලී පදනම මත ලබාගෙන තිබුණි. | | | |
| (ඊ) | නව ගොඩනැගිල්ල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර තිබුණ තක්සේරු වාර්තාව අනුව මාසික කුලී වටිනාකම රු.1,600,000 ක් වූ අතර මෙම තක්සේරුව ඉක්මවා මාසයක් සඳහා ගෙවන කුලී මුදල රු.164,000 ක් විය. ඒ අනුව වර්ෂයක් සඳහා එසේ වැඩිපුර ගෙවීමට සිදුවන මුදල රු.1,968,000 ක් බව නිරීක්ෂණය විය. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන තක්සේරු වාර්තා පදනම් කරගෙන කුලී ගෙවීම් කළ යුතු වීම. | නව ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකමත් ගොඩනැගිලි හිමිකරු විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් වලත් වෙනසක් ඇති බව පිළිගනිමි. ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ වැදගත්කම සහ අවට කාර්යාලවල කුලිය සැලකිල්ලට ගෙන එම කුලිය සැලකිය යුතු කරුණක් සේ නොසලකා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදී. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (උ) | වැය විෂයයන් 10 ක් සම්බන්ධයෙන් මූලික වියදම් ඇස්තමේන්තුවට සාපේක්ෂව සංශෝධිත වියදම් ඇස්තමේන්තුවෙහි වෙනස සියයට සෘණ 30 සිට | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කිරීමට කටයුතු කළයුතු වේ. | පුරප්පාඩු සඳහා නව කාර්යය මණ්ඩල බඳවා ගැනීම, ගමන් වියදම්, වැඩිපුර ලිපි ද්‍රව්‍ය අවශ්‍යතා මතු වීම, වෙනත් සැපයීම් සඳහා වියදම් අවශ්‍යතා වැඩි වීම, වාහන වල හදිසි අලුත්වැඩියා, | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | සියයට 257 දක්වා වූ පරාසයක පැවතුණි. | | මෙහෙයුම් කල්බදු අත්හිටුවීම, රාජ්‍ය සේවක සහනදායී ණය පදනම යටතේ දේපල මිලදී ගැනීම, වාහනයක් සඳහා කල්බදු වාරික ගෙවීම, ප්‍රතිපාදන 2019 අයවැයට ඇතුළත් කිරීමට නොහැකි වීම ආදී කරුණු හේතු විය. | |
| (ඩ) | වාර්ෂික විසර්ජන පනත ප්‍රකාරව අත්තිකාරම් කාර්යය සඳහා වියදමෙහි උපරිම සීමාව ලෙස රු.1,200,000 ක්ද, හර ශේෂයේ උපරිම සීමාව ලෙස රු.3,000,000 ක්ද වශයෙන් දක්වා තිබුණි. එම සිමාවන්ට අදාළව තථ්‍ය අගයන් පිළිවෙලින් රු.2,266,762 ක් හා රු.3,287,856 ක් වී තිබුණි. ඒ අනුව සිමා ඉක්මවීම පිළිවෙලින් රු.1,066,762 ක් හා රු.287,856 ක් වී තිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ 5 ආකෘතියේ මෙම උපරිම සීමා අගයන් පිළිවෙලින් රු.2,100,000 ක් ලෙස හා රු.4,000,000 ක් ලෙස සටහන් කර තිබුණි. | විසර්ජන පනතින් පනවා ඇති සීමාවන් තුළ කටයුතු කළ යුතු වේ. | විගණන විමසුම හා එකඟ වෙමි.<br>මෙම සීමාවන් සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදුවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ඪ) | රාජ්‍ය ආයතනයන් විසින් සිදුකරනු ලබන භාණ්ඩ හා සේවා, වැඩ , උපදේශක සේවා සහ තොරතුරු පද්ධති | අදාල මෙහෙවර ඉටුකිරීම සඳහා බලය පැවරෙන නීතිමය රාමුව සකස් වියයුතු වේ. | 2019 වර්ෂයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද මාර්ගෝපදේශ පාර්ලිමේන්තුවේ අනුමැතිය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදුවන සංශෝධනයට අනුව ජාතික |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රසම්පාදනය සඳහා සාධාරණ අපක්ෂපාතී විනිවිදභාවයකින් සහ තරඟකාරීත්වයකින් යුතු පිරිවැය ඵලදායීත්වය සහිත ප්‍රතිපත්ති, කාර්යපටිපාටිය සහ ක්‍රියාවලි කාලානුරූපීව සම්පාදනය කිරීම යන ආයතනයේ මෙහෙවරට අදාලව ඉදිරිපත් කර තිබූ භාණ්ඩ, වැඩ හා සේවා, තොරතුරු පද්ධති හා උපදේශකයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් වූ මගපෙන්වීම් සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීමට නොහැකිවී තිබුණි. | | සඳහා සභාගත නොවීම හේතුවෙන් මෙම ගැටළුව පැන නැගී ඇති බව දන්වා සිටින අතර මෙම ක්‍රියාවලිය ප්‍රමාදවීම ප්‍රසම්පාදන කොමිෂන් සභාවට කිසිසේත් වලක්වා ගත නොහැකි හේතූන් මත සිදුවී ඇති බවද දන්වනු කැමැත්තෙමි. | ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ඒ) | කොමිෂන් සභාව ස්ථාපිත කර වසර 2 ක කාලයක් ගතවීමෙන් පසු, භාණ්ඩ හා සේවා, වැඩ, තොරතුරු පද්ධති සඳහා මෙන්ම උපදේශකවරුන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම පිළිබඳ නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි අවසන් කෙටුම්පතට කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතුව තිබුණි. ඒ අනුව යෝජිත නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අත්පොත් රජයේ ගැසට් පත්‍රයේ පල කර මාස 3 ක් | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුමැතිය ලබාදීම තුළින් ප්‍රසම්පාදන යාන්ත්‍රනය වඩාත් කාර්යක්ෂම හා ඵලදායී කළ යුතු වීම. | භාණ්ඩ හා සේවා, වැඩ, තොරතුරු පද්ධති සඳහා මෙන්ම උපදේශකවරුන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම පිළිබඳ නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි අවසන් කෙටුම්පත් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහ නීතිපතිවරයාගේ එකඟතාව ඇතිව ගැසට් කර පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇතත් එය මෙතෙක් පාර්ලිමේන්තුවේ සභාගත නොවීම කොමිෂන් සභාවේ පාලනයෙන් බැහැර | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදුවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ නමුත් 2020 සැප්තැම්බර් මාසය වනවිටත් එම අනුමැතිය ලබාදී නොතිබුණි. | | කරුණක් බව කාරුණිකව දන්වමි. | |
| (ඔ) | රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළියෙල කිරීම, ඖෂධ ප්‍රසම්පාදනය සඳහා ක්‍රියාපටිපාටි අත්පොත් පිළියෙල කිරීම, හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සකස් කිරීම මේ දක්වා අවසන් කිරීමට සමත් වී නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම තුළින් ප්‍රසම්පාදන යාන්ත්‍රනය වඩාත් කාර්යක්ෂම හා ඵලදායී කළ යුතු වේ. | 2018 දී රාජ්‍ය පුද්ගල හවුල්කාරිත්වය පිළිබඳ ජාතික නියෝජිත ආයතනය (NAPP) පිහිටුවීමෙන් අනතුරුව මෙම කොමිෂන් සභාව සමඟ ඔවුන් ඇතිකර ගන්නා ලද එකඟතාව මත හවුල් ව්‍යාපෘතියක් වශයෙන් නැවත රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති සඳහා අදාල වන මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීම ආරම්භ කරන ලදී.<br>හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සකස් කිරීම පරිසර අමාත්‍යාංශය එක්ව ක්‍රියා කළ යුත්තක් වන අතර මෙතෙක් එකී අමාත්‍යාංශය මගින් හරිත නිෂ්පාදන සඳහා ඇගයීම සඳහා වන නිර්ණායකයන් පිළියෙල කර නොතිබීම හේතුවෙන් එවැනි මාර්ගෝපදේශයන් සකස් කිරීමට අපොහොසත්ව ඇත. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ඕ) | කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයට අදාළව අමාත්‍යාංශ 47 ක අවසන් කරන ලද | නිම කරන ලද ප්‍රසම්පාදන සම්බන්ධ පරීක්ෂා කිරීම ඉදිරි ප්‍රසම්පාදන කටයුතු | මෙහි අරමුණු සැලසුම්ගත ප්‍රසම්පාදනය අදාල ආයතනයේ අරමුණු සමඟ | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රසම්පාදනයන් 1471 ක් සම්බන්ධයෙන් නියදි පදනම මත පරීක්ෂා කිරීම සඳහා ප්‍රසම්පාදනයන් 83 ක් තෝරා ගෙන තිබූ අතර 2019 වර්ෂය තුළ ඉන් ප්‍රසම්පාදන 30 ක් පමණක් පරීක්ෂා කර අවසන් කර තිබුණි. | ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කිරීමට ඉවහල් වන හෙයින් ඒ අනුව කටයුතු කළ යුතු වීම. | සමපාත වන්නේද යන්න නිශ්චය කර එකී ප්‍රසම්පාදනය ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට සඳහා තුඩු දෙන බවට සහතික කර ගැනීමයි. කෙසේ වුවද දැනට ක්‍රියාත්මක කරනු ලබන ආකාරයට මීට වඩා වැඩි අවධානයක් ඒ ඒ ආයතන වල ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම ලබා ගැනීමට දැක්විය යුතු බව මෙම කොමිෂන් සභාව විසින්ද නිරීක්ෂණය කර ඇත. | ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ක) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වන වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතු අතර එපරිදි කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතු වේ. | අභ්‍යන්තර විගණකයෙකු පත්කර ගැනීමට කටයුතු කරමින් පවතී. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (කා) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | ආයතනයේ යහපැවැත්ම උදෙසා විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ | අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොමැති නිසා විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට නොහැකි වී ඇති අතර අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට අවශ්‍ය අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇතත් එයට අනුමැතිය හිමිව නොමැත. ඒ අනුව පැවරුම් පදනම මත මෙම සේවාව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | |
| (කැ) | 2019 වර්ෂය අවසන් වනවිට අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා 05 දෙනෙකු අනියම් පදනම මතද නිලධාරීන් 09 දෙනෙක් කොන්ත්‍රාත් පදනම මතද බඳවා ගෙන තිබුණි. අනියම් පදනම මත රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරක් සඳහා නිලධාරියකු අනුමත ක්‍රමවේදයකින් තොරව බඳවා ගෙන තිබූ අතර එම නිලධාරියාට 2019 වර්ෂය තුළදී රු.213,514 ක් ගෙවීම් කර තිබුණි. | කාර්ය මණ්ඩලය පත්කිරීම විධිමත් විය යුතුය. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 (ඉ) (1) අනු ව්‍යවස්ථාව අනුව කොමිෂන් සභාවේ කාර්ය ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධාරීන් පත්කර ගැනීමට ලබාදී ඇති බලතල සැලකිල්ලට ගෙන කොමිෂන් සභාවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා එකී පත්වීම සිදු කර ඇති අතර ඒකාබද්ධ අරමුදලින් වැටුප් ගෙවීම සැලකිල්ලට ගෙන විධිමත් පරිදි කාර්ය මණ්ඩලය අනුමත කරගනු ලැබ ඇති බව දන්වනු කැමැත්තෙමි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (කෑ) | කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන අධීක්ෂණ ඒකකයේ කාර්ය මණ්ඩලය විධායක ශ්‍රේණියේ නිලධාරීන් 01 ක් හා විධායක නොවන ශ්‍රේණියේ නිලධාරීන් 02 ක් සමන්විත වීම නිසා එහි කටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති බව නිරික්ෂණය කෙරේ. | අධීක්ෂණ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කරවා ගත යුතු වීම. | කළ යුතු වැඩ පිළිබඳ අධ්‍යනයක් සිදුකර අවශ්‍ය කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට සටහන් කරගෙන ඇත. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (කෙ) | 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ලැබීම රු.3,487,279 ක් වුවද, මූල්‍ය | අත්තිකාරම් ලැබීම් සියල්ල කාර්යසාධන ප්‍රකාශයේ සඳහන් කිරීමේ අවශ්‍යතාවය. | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු. 3,014,879 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් අත්තිකාරම් ලැබීම් රු.472,400 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | | ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (කේ) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA 52) සහ ආකෘති පත්‍ර අංක ඒසීඒ - 5 අනුව 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු. 2,515,056 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු.2,267,656 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් අත්තිකාරම් ගෙවීම් රු.247,400 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් ගෙවීම් සියල්ල කාර්යසාධන ප්‍රකාශයේ සටහන් කිරීමේ අවශ්‍යතාවය. | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (කො) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA 52) සහ ආකෘති පත්‍ර අංක ඒසීඒ - 5 අනුව 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.2,315,633 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.2,123,133 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් අත්තිකාරම් ගිණුමේ ශේෂය | අත්තිකාරම් ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කිරීමේ අවශ්‍යතාවය. | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | රු. 192,500 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | | |
| (කෝ) | භාණ්ඩාගාර පොත් අනුව 2020 දෙසැම්බර් 31 දිනට නොපිය වූ අග්‍රිම ශේෂය රු.1,222,837 ක් වුවත්, එම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | අග්‍රිම ශේෂය භාණ්ඩාගාර පොත් අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කිරීමේ අවශ්‍යතාවය. | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ග) | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ලැබීම්, ගෙවීම් අතර වෙනස රු.1,108,776 ක් වුවත් එය අග්‍රිම ගැලපුම් ගිණුමට රු.883,776 ක් ලෙස ගැලපීම් කර තිබුණි. | මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවය. | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ගා) | දෙපාර්තමේන්තු පොත් අනුව භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් රු.74,360,000 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ අග්‍රිම ලැබීම රු.79,655,747 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.5,295,747 ක් වැඩිපුර දක්වා තිබුණි. | මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවය. | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ගැ) | දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂය තුළ ආදායම් නොවන ලැබීම ලෙස රු.4,207,050 ක් ලැබී | ආදායම් නොවන ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වීමේ අවශ්‍යතාවය. | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණත්, එය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබුණි. | | | ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ගැ) | දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂය තුළ අත්තිකාරම් අයකරගැනීම් රු.2,131,103ක් වුවත් එය ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබීම හේතුවෙන් මුදල් ගලාඒම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් අයකර ගැනීම් වල දළ වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීමේ අවශ්‍යතාවය | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදුවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ගෙ) | දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු.2,267,656 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 1,225,250 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,042,406 ක් මුදල් ගලායාම් අඩුවෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් ගෙවීම්වල දළ වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය. | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදුවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ගේ) | සමාලෝචිත වර්ෂයේ ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම මූලධන වැය විෂයයෙහි රු.200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම වැය කිරීමකින් තොරව ඉතිරි කර තිබුණි. | ඇස්තමේන්තු ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. | කොවිඩ් වසංගත තත්ත්වය නිසා කාර්යාල කටයුතු සීමා කිරීම නිසා ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීමේ කටයුතු කල් දැමීමට සිදුවූ අතර පසුව කොමිෂන් සභාව අහෝසි කිරීමට තීරණය වූ හෙයින් මිලදී ගැනීමේ කටයුතු නවතා දමන ලද බව. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදුවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ගො) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA 52) සහ ආකෘති පත්‍ර අංක ඒසීඒ - 5 අනුව 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 2,315,633 ක් වුවද, දෙපාර්තමේන්තු පොත්, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමඟ සැසඳුම් ප්‍රකාශය [මු.රෙ. 427(1)] අනුව වර්ෂය අවසානයේ ශේෂය රු.2,540,633 ක් විය. ඒ අනුව රු. 225,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර පොත් අනුව ශේෂය නිවැරදිව සටහන් කිරීමේ අවශ්‍යතාවය. | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ගෝ) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA 52) සහ ආකෘති පත්‍ර අංක ඒසීඒ - 5 අනුව 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 2,315,633 ක් වුවද, ලේජර ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ලේජර ශේෂ මුලු එකතුව රු.2,540,633 ක් විය. ඒ අනුව රු. 225,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර පොත් අනුව ශේෂය නිවැරදිව සටහන් කිරීමේ අවශ්‍යතාවය. | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |
| (ච) | වැය විෂයන් 02 ක් සම්බන්ධයෙන් වටිනාකම රු. 48,892 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන සටහන් අංක | මූල්‍ය ප්‍රකාශන තුලින් බැරකම් සියල්ල හෙළිදරව් කළයුතු වීම. | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | (iii) හි සඳහන් කර නොතිබුණි. | | | |
| (චා) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA 92) අනුව 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු බැදීම් හා බැරකම් වශයෙන් දක්වා තිබූ අයිතමයන් 02 ක වටිනාකම් සහ මූල්‍ය ප්‍රකාශයන්හි සටහන (iii) හි දක්වා ඇති වටිනාකම් අතර රු. 59,780 ක වෙනස්කම් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන තුලින් බැරකම් සියල්ල හෙළිදරව් කළයුතු වීම. | එකඟ වන බව දන්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කර ඇත. |

3.4 **ශීර්ෂය 102 - මුදල් අමාත්‍යාංශය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2018 අයවැය යෝජනා පිළිබඳ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීම සඳහා හා එම දැන්වීම් නිර්මාණය හා නිෂ්පාදනය සඳහා 2018 වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් එකතුව රු.73,892,963 ක් වැය කර තිබුණද, ප්‍රචාරණ කාර්යයට අදාල පිරිවිතර සකස් කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබාගැනීම රජයේ ප්‍රසම්පාදන පරිපාටිය අනුව ක්‍රියාත්මක කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වීම | විගණන නිරීක්ෂණ හා එකඟ වන බව | 2022 මාර්තු 23 දින වන විටත් එම වරද නිවැරදි කිරිම සඳහා ප්‍රසම්පාදනයන් සිදු කරනු ලබන නිලධාරීන් වෙත උපදෙස් ලබා දී නොතිබුණි. |
| (ආ) | අමාත්‍යාංශය විසින් දෙවසරක මාධ්‍ය නිදහසේ වෙනස පිළිබඳ මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පුවත්පත් දැන්වීම් පළකිරීම, රූපවාහිනී දැන්වීම් පළකිරීම, සමාජ මාධ්‍ය ජාලා වෙබ් අඩවිවල දැන්වීම් ප්‍රචාරණය කිරීම හා වැඩසටහන් නිෂ්පාදනය සඳහා රජයේ ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය නොකර, | අමාත්‍යාංශයේ අරමුණුවලට අදාළ වන පරිදි හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතු වීම | විගණන නිරීක්ෂණ හා එකඟ වන බව | 2022 මාර්තු 23 දින වන විටත් එම වරද නිවැරදි කිරිම සඳහා ප්‍රසම්පාදනයන් සිදු කරනු ලබන නිලධාරීන් වෙත උපදෙස් ලබා දී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | එකතුව රු.20,382,180 ක් වැය කර තිබුණි. | | | |
| (ඇ) | 2019 වර්ෂයේදී මුදල් අමාත්‍යවරයා සමඟ අමාත්‍යාංශය නිලධාරීන්/ අමාත්‍ය කාර්ය මණ්ඩලය විසින් විවිධ දේශීය උත්සව හා රැස්වීම් සඳහා සහභාගිවීමට යොදාගත් අභ්‍යන්තර ගුවන් සේවා සඳහා ගාස්තු ලෙස රු. 9,101,453 ක් වැයකර තිබුණි. | අමාත්‍යවරයා සමඟ අමාත්‍යාංශ නිලධාරීන්/ අමාත්‍ය කාර්ය මණ්ඩලයට ගුවන්සේවා යොදාගැනීම පිළිබඳව මුදල් අමාත්‍යාංශය විසින් උපදෙස් ඇතුළත් චක්‍රලේඛ නිකුත් කළ යුතුවීම. | ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ගේ කාර්යභාරය හා සැලසීමේදී දුර ගමන් සඳහා දිගු කාල වේලාවක් ගතවන මහාමාර්ග හරහා ගමන් කිරීම ප්‍රායෝගිකව දුෂ්කර කරුණකි. මෙම සංචාරයන් ඉතා හදිසි හා ඉතා අත්‍යාවශ්‍ය වීමත්, ගරු අමාත්‍යතුමා හා අනෙකුත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගේ හදිසි රාජකාරීමය තත්ත්වයන් සලකා ඉතා ඉක්මනින් කොළඹට පැමිණීම අත්‍යාවශ්‍ය බැවින්ද ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් උප සමාගමක් වන Helitours (Pvt) Ltd වෙතින් මෙම සංචාරයන් සඳහා ප්‍රවාහන පහසුකම් ලබාගැනීමට ක්‍රියාකර ඇති බව දන්වා එවා තිබුණි. | 2022 මාර්තු 23 දින වන විටත් රජයේ නිලධාරින්ට දේශීය උත්සව සඳහා ගුවන් සේවා යොදා ගැනීම සම්බන්ධ විවිධිවිධාන ඇතුළත් උපදෙස් නිකුත් කර නොතිබීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2020 වර්ෂයේ වැය වැය විෂයයන් 10 ක් යටතේ සළසා තිබුණු එකතුව රු.5,050,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණ හා එකඟ වන බව | 2021 වර්සයේදිද වැය විෂයයන් 32 ක් වෙනුවෙන් සළසා තිබුණු රු.57,190,000 ක ප්‍රතිපාදන මුළුමණින්ම ඉතිරි කර තිබුණි. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු වසරකට වැඩි රජයේ නිලධාරීන්ගේ ණය ශේෂවල එකතුව රු. 920,110 ක් විය. | හිඟ ණය සම්බන්ධව කටයුතු සොයා බලා නොපමාව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ. | අයකර ගැනීමට හැකියාවක් නොමැති ණය මු.රෙ. 113 අනුව අත්හැර දැමීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇති බවත්, එක් නිලධාරියෙකුගේ ණය ගොනුව සොයාගත නොහැකි බවත්, ඉතිරි ණය මුදල් අය කර ගැනීම සඳහා නීති කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව | 2021දෙසැම්බර් 31 දිනට හිඟහිටිව රජයේ නිලධාරීන්ගේ ණය ශේෂයෙන් වර්ෂය ඉක්මවූ ණය ශේෂවල එකතුව රු. 556,146.00 කි වී තිබුණි. |
| (ඊ) | ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අංශයේ අවස්ථා 07 ක් යටතේ වසර 05 ක් හා වසර 04 ක් ඉක්මවූ නිලධාරීන් 54 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු. 3,334,459 ක් විය. | හිඟ ණය සම්බන්ධව කටයුතු සොයා බලා නොපමාව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ. | මෙම ණය ශේෂ එවකට පැවති ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අංශයේ තිබූ අත්තිකාරම් ගිණුමට අදාළ වන අතර ඉදිරියේදී මෙම ණය ශේෂ අයවිය යුතු පුද්ගලයින් සේවය කරන සේවා ස්ථාන | 2022 මාර්තු 23 දින වන විටත් අදාළ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | හඳුනාගෙන අයකර ගැනීමට හෝ එසේ අයකර ගත නොහැකි ණය ශේෂයන් මු.රෙ. 113 (3) ප්‍රකාරව ණය ශේෂ කපා හැරීමට කටයුතු කරන බව | |
| (උ) | අමාත්‍යාංශය සතු වාහන 30 ක්, විධිමත් පවරාදීමකින් තොරව වෙනත් ආයතන වෙත ලබාදී තිබුණි. | විධිමත් පරිදි පවරාදීමට හෝ නැවත අමාත්‍යාංශය වෙත ලබාගැනීමට හෝ කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. | එක් වාහනයක් පමණක් විධිමත පරිදි පවරා දී ඇති අතර, අනෙක් වාහන 2022 මාර්තු 23 දින වන විටත් විධිමත් පරිදි පවරාදීමට අහොහොසත් වී තිබුණි. |
| (ඌ) | විධිමත් පවරාගැනීමකින් තොරව වාහන 10 ක් වෙනත් ආයතන වෙතින් අමාත්‍යාංශය වෙත ලබාගෙන තිබුණි. | විධිමත් පරිදි පවරාගැනීමට හෝ නැවත එම ආයතන වෙත ලබාදීමට හෝ කටයුතු කළයුතු වීම. | අදහස් දක්වා නැත. | වාහන 09 ක් අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණු අතර, එක් වාහනයක් වෙනත් කාර්යාලයක් වෙත තාවකාලික පදනමක් මත ලබා දි තිබුණි. |
| (එ) | හිල්ටන් හෝටලය හා ග්‍රෑන්ඩ් හයිට් කලම්බුහි කොටස් අයිතිය අලෙවි කිරීම සඳහා 2018 ජූලි 17 දින අනුමත කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් පත්කල උපදේශක ප්‍රසම්පාදන කමිටුව විසින් එම්.ටී.අයි. කන්සල්ටින් ඔෆ් බහරේන් ඇන්ඩ් ශ්‍රී ලංකා (MTI Consulting of Bahrain and Sri Lanka) සමඟ අනුබද්ධිත සිංගප්පූරුවේ ලැසර්ඩ් ඒෂියා සමාගම (Lazard Asia) උපදේශකවරු ලෙස තෝරා | | | |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනීම නිර්දේශ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | | |
| i. | ඉහත උපදේශක ආයතන සමග ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් 2018 සැප්තැම්බර් 27 දින ඇති කර ගන්නා ලද ගිවිසුම ප්‍රකාරව සංධිස්ථාන (Milestone) 04 ක් යටතේ අදාල කාර්යයන් නිමකිරීමට එකඟ වී තිබුණද, මෙම කාර්යයන් නිමකළ යුතු දින වකවානු ගිවිසුමේ දක්වා නොතිබුණි. | ගිවිසුම අංග සම්පූර්ණ ලෙස පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවීම. | නිරීක්ෂණය හා එකඟ වන බව | 2022 මාර්තු 23 දින වන විටත් කාලවකවානු ගිවිසුමකට එක් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| ii. | Lazard Asia ආයතනය හා MTI Consulting ආයතනය සංධිස්ථාන 04 කින් 02 ක් නිමකොට 2019 මැයි 07 දින ඒ සඳහා පිළිවෙලින් රු.13,032,986 (USD 68523) ක් හා රු.4,628,607 ක් වශයෙන් මුදල් අමාත්‍යාංශය වෙත ඉන්වොයිස් ඉදිරිපත් කර තිබුණු අතර මාස 19 කට පසුව 102-1-2-1409 (වෙනත්) වැය විෂයය යටතේ 2020 දෙසැම්බර් 31 දින රු. 17,500,000 ක පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන ඉහත එකතුව වූ රු. 17,661,593 ක් උපදේශක ආයතන වෙත ගෙවා තිබුණි. | ගිවිසුම ප්‍රකාරව කාර්යසාධනය ලබා කර ගෙන අදාළ මුදල් නියමිත දින වකවානුවල ගෙවීමට කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වන බව | ඉතිරි සංධිස්ථාන දෙක නිම කළ බවට තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට මුදල් අමාත්‍යාංශයෙන් වැටුප් ගෙවමින් වෙනත් ආයතනවල සේවය සඳහා නිලධාරීන් 07 දෙනෙකු නිදහස් කර තිබුණි. | සේවය කරන ලද ආයතනවලින් වැටුප් හා දීමනා ලබාගැනීමට හැකිවන පරිදි විධිමත් ලෙස මුදාහැරීමට කටයුතු කළයුතු වීම. | ආයතනවල ඉල්ලීම මත නිලධාරීන් මුදාහැර ඇති බව | 2022 මාර්තු 23 දින වන විට එක් නිලධාරියෙකු පමණක් මෙම අමාත්‍යාංශය වෙත නැවත මුදා හැර තිබුණි. |

### 3.5 ශීර්ෂය 413 - මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේදී පුනරාවර්තන හා මූලධන වියදම් වැය විෂයය 18 ක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර සියයට 99 සිට සියයට 433 දක්වා පරාසයක විචලතාවයක් නිරීක්ෂණය විය. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායී ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ 2020 ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා වැය ශීර්ෂ 104, ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධන අංශය යටතේ වැය කරන ලද වියදම් ගිණුම්ගත කිරීම සඳහා එම අංශයට අදාල ප්‍රතිපාදන වැරදීමකින් මෙම අමාත්‍යාංශ වැය ශීර්ෂයට අන්තර්ගත කර තිබුණි. | 2021ඔක්තෝබර් 06 දිනැති අංක 2248/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ කටයුතු අහෝසි කර මුදල් අමාත්‍යාංශ ශීර්ෂය යටතට පවරා ඇත. |
| (ආ) | මූලධන වැය විෂයයන් 3 කට හා පුනරාවර්තන වැය විෂයයන් 3 කට සලසා තිබුණු එකතුව රු.2,540,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායී ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | මෙම රාජ්‍ය අමාත්‍යාංශය 2020 අගෝස්තු මස පිහිටුවන ලද අතර, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලද ඇස්තමේන්තුවක් මෙම මාස 05 සඳහා ලබා දී ඇති අතර එබැවින් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | 2021.10.06 දිනැති අංක 2248/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ කටයුතු අහෝසි කර මුදල් අමාත්‍යාංශ ශීර්ෂය යටතට පවරා ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 17 ක් සඳහා එකතුව රු. 16,820,000 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු.8,221,133 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එම ඉතිරිය | වාර්ෂික ඇස්තමේන්තු මඟින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කළ යුතු වීම. | මෙම රාජ්‍ය අමාත්‍යාංශය 2020 අගෝස්තු මස පිහිටුවන ලද අතර, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලද ඇස්තමේන්තුවක් මෙම මාස 05 සඳහා ලබා දී ඇති අතර එබැවින් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | 2021.10.06 දිනැති අංක 2248/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ කටයුතු අහෝසි කර මුදල් අමාත්‍යාංශ ශීර්ෂය යටතට පවරා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 ක සිට සියයට 84 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | | | |

### 3.6 ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් සැළසුම් ක්‍රමවේද පිළියෙල කිරීම (Preparation of Planning Techniques) යන ක්‍රියාකාරකම 2018 වර්ෂය තුළදී සිදු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් ඉටුකිරීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය හා සාර්ථකත්වය පෙන්නුම් කරයි | ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබූ සැලසුම් ක්‍රමවේද පිළියෙල කිරීම (Preparation of Planning Techniques) පිළිබඳව සකස් කර ඇති පොත යාවත්කාලීන කිරීමට මූල්‍ය අනුග්‍රහය බාහිර ආයතනයකින් ලබා ගැනීමට සැලසුම් කර තිබුණද , ලබා ගැනීමට නොහැකි වීම නිසා එම කාර්ය සිදු කිරීමට නොහැකි විය. | 2022 මාර්තු 23 දින වන විටත් සැලැසුම් ක්‍රමවේද පිළියෙල කිරීමේ ක්‍රියාකාරම ඉටු කර නොතිබුණි. |
| (ආ) | 2019 හා 2020 වර්ෂවලට අදාලව රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන වී නොතිබුණ අතර මුදල් රෙගුලාසි සංග්‍රහයේ ඇතුළත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පැහැදිලි කරන්නාවූ රෙගුලාසි වර්තමානයට උචිත වන පරිදි සංශෝදනය කර නොතිබුණි. | ආර්ථිකයට ජාතික වශයෙන් වැදගත්කමක් ඇති රාජ්‍ය ආයෝජන වැඩසටහන වාර්ෂිකව යාවත්කාලීන වීම හා මුදල් රෙගුලාසි සංශෝධනයවීම කාලෝචිතය. | දක්වා ඇති නිරීක්ෂණයන් සඳහා ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම නිවැරදි වේ. නිර්දේශ සටහන් කර ගනිමි. | 2022 මාර්තු 23 දින වන විටත් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පැහැදිලි කරන්නා වූ මුදල් රෙගුලාසිය වර්තමනායට ගැලැපෙන පරිදි සංශෝධනය කර නොතිබුණි. |
| (ඇ) | බටහිර වෙරළ තීරයේ වැලි පෝෂණය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන | ව්‍යාපෘතීන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට පෙර ජාතික ක්‍රමසම්පාදන | දක්වා ඇති නිරීක්ෂණයන් සඳහා ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | 2022 මාර්තු 23 දින වන විටත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පරිදි නිසි ආර්ථික, සමාජීය, පාරිසරික විශ්ලේෂණයක් සිදුකර නොමැති බැවින් එවැන්නක් සිදුකිරිම සඳහා තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා වූ ව්‍යාපෘති යෝජනාවක් හා ඒ මත පදනම්ව නව ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස අදාල දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත දන්වා තිබුණද, එවැන්නක් සිදුවී නොමැති බව නිරීක්ෂණය කරන අතර ව්‍යාපෘතිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු රාජ්‍ය ආයෝජන වැඩසටහන ප්‍රකාරව අයවැය ප්‍රතිපාදන සැලසිය යුතු වුවද නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර අයවැය ප්‍රතිපාදන සලසා තිබූ බව නිරීක්ෂණය කෙරේ.<br><br>තවද එම ව්‍යාපෘති යෝජනාව කාලීන අවශ්‍යතාවයක් ලෙස සලකා ක්‍රියාත්මක කිරීම තිරසාර විසඳුමක් ලෙස හැඟේ නම් යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විරුද්ධත්වයක් නොමැති බව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අදහස | දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගැනීම කළ යුතු වේ. | නිවැරදි වේ. නිර්දේශ සටහන් කර ගතිමි. | ව්‍යාපෘති සම්බන්ධ නියාමනය ශක්මත් වන පරිදි විධිවිධාන සලසා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලෙස දක්වා තිබුණ ද එමගින් අවශ්‍ය නියාමනය ගිලිහී යා හැකි බවද නිරීක්ෂණය කෙරේ. | | | |
| (ඈ) | භාණ්ඩාගාරයේ SA 92 දරණ සමුච්චිත බැරකම් වාර්තාවේ දැක්වෙන එකතුව රු.783, 629 ක් වූ බැරකම් 04 ක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | බැඳීම් හා බැරකම් නිසි පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම | මේ යටතේ දක්වා ඇති බැරකම් CIGAS වැඩසටහනෙහි අතපසු වීමකින් අගෝස්තු මසදී ඇතුලත් කරන ලද ගණුදෙනු වන අතර, ඒවා එම මාසය තුළදීම ගෙවීම් සිදු කර ඇත. තවද මෙම ගණුදෙනු දෙසැම්බර් මස CIGAS වැඩසටහනට ඇතුළත් කර නොමැති බව SA 92 භාණ්ඩාගාර මුද්‍රිත පත්‍රිකාවේ දිනවලින් තහවුරු වේ. ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට උපදෙස් ලබාදුන් බව කාරුණිකව දන්වමි. | CIGAS වැඩසටහනට ඇතුළත් කරනු ලබන බැරකම් සඳහා ගෙවීම් සිදුකර ඇතිද යන්න පිළිබඳව පරීක්ෂා කරනු ලබන අතර, දී ඇති උපදෙස් ක්‍රියාත්මක කරන්නේද යන්න පිළිබඳව අධීක්ෂණය කරනු ලැබේ. මෙවැනි සිදුවීම් ඊට පසු වාර්තා වී නැත. |
| (ඉ) | 2020 ඔක්තෝබර් 09 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.4 ඡේදය පරිදි සටහන් අංක (iii) යටතේ වන බැඳීම් හා බැරකම් ප්‍රකාශය යටතේ වන බැඳීම් හා බැරකම්, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට නිකුත් කරනු ලබන බැඳීම් හා | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | රු. 264,291 ක බැරකම් 2021 වර්ෂයේදී මු.රෙ. 94 (1) සහ (2) පරිදි නිරවුල් කර ඇත. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව භාණ්ඩාගාරය විසින් අනුමතිය ලබා නොගෙන එකතුව රු.776,593 ක් වූ |

| | | | | |
|---|---|---|---|---|
| | බැරකම් ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතු අතර එලෙස වාර්තා නොකළ කිසිදු බැඳීමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස ප්‍රවර්ථන වර්ෂයේ නිරවුල් නොකළ යුතු වුවත් භාණ්ඩාගාරයේ SA 92 සමුච්චිත බැරකම් වාර්තාවේ දක්වා නොතිබුණු එකතුව රු. 264,291 ක බැරකම් 2021 වර්ෂයේ නිරවුල් කර තිබුණි. | | | බැරකම්වලට එළඹ තිබුණි. |
| (ඊ) | මු.රෙ. 880 අනුව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැන්පත් තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම | අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | 2022 මාර්තු 23 දින වන විටත් අදාළ නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි. |
| (උ) | දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාව ඇතුළත් කර යාවත්කාලීන කළ යුතු වුවද, විගණනය දිනය වූ මැයි 12 වනවිටත් 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා 2017 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පමණක් ඇතුළත් කර තිබු බව නිරීක්ෂණය විය. | වෙබ් අඩවිය නිසි පරිදි යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව | වෙබ් අඩවිය නිසි පරිදි යාවත්කාලීන කිරීමට සටහන් කර ගන්නා ලදී. | 2022 මාර්තු 23 දින වන විට 2020 වාර්ෂය දක්වා දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තා වෙබ් අඩවියේ සඳහන් කර තිබුණත්, 2018 වර්ෂයෙන් පසු ක්‍රියාකාරී සැලැසුම් වෙබ් අඩවියේ ඇතුළත් කර නොතිබුණි. . |
| (ඌ) | තිරසර සංවර්ධන අරමුණු හා ඒ යටතේ වූ දර්ශක ප්‍රධාන කරගනිමින් ආයතනයේ අරමුණු හා දර්ශක හඳුනාගැනීම හා ළඟා | ළඟා කර ගැනීමට හැකි තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය යොමු කරමින් අදාල සැලසුම් සකස් | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූලික කාර්යය භාරය වනුයේ ජාතික සංවර්ධන වැඩසටහන (National Development | 2022 මාර්තු 22 දින වන විටත් දර්ශක හඳුනා ගෙන ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කරගැනීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අවධානය යොමුකල යුතු වුවද, ඒ අනුව සමාලෝචිත වර්ෂයේ තිරසර සංවර්ධනයට අදාළව කටයුතු කර තිබූ බවට විගණනය වෙත විස්තර ඉදිරිපත් නොකෙරුණි. | කිරීම හා අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කිරීම | Framework) සකස් කිරීම හා එය සමග අනුගත වෙමින් අදාල අමාත්‍යාංශ සමඟ ප්‍රතිපත්ති තීරණ සහ එම අමාත්‍යාංශ වලින් සකස් කරන ව්‍යාපෘති යෝජනා ඇගයීම වේ. ඒ අනුව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින්, රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව සකස් කිරීමේදී තිරසාර සංවර්ධන ඉලක්ක සහ අරමුණු සැලකිල්ලට ගන්නා ලදී. එමෙන්ම, ව්‍යාපෘති ඇගයීමේදී ද තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් නිරතුරුව දායකත්වය ලබා දෙන ආයතනයකි. | |
| (එ) | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව වූ තනතුරු 118 න් තනතුරු 25 ක් පුරප්පාඩුව පැවතීම නිසා එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 21ක් වී තිබුණු අතර,ජ්‍යෙෂ්ඨ මට්ටමේ අයත් අධ්‍යක්ෂ තනතුරු 05 ක්ද, සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 06 ක්ද ඇතුලත්ව තනතුරු 11 ක් වසර කිහිපයක සිට පුරප්පාඩුව පවතින බවත් | දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම | දෙපාර්තමේන්තුවට අවශ්‍යය ඉඩකඩ පහසුකම් ලබාදෙන මෙන් මුදල් අමාත්‍යාංශය වෙත කිහිප අවස්ථාවකදී ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. ඉඩ පහසුකම් ලද පසු පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ඇත. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩු 10 ක් පැවැතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | බඳවා ගැනීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති බවත් දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණි. මෙම තත්ත්වය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ප්‍රශස්ත මට්ටමක තබාගැනීම කෙරෙහි බලපානු ලැබිය හැකි බව නිරීක්ෂණය විය. | | | |
| (ඒ) | ආයතන සංග්‍රහයේ 13.3 වගන්තිය ප්‍රකාරව, තනතුරකට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍යා නම් නිත්‍ය පත් කිරීම නොපමාව කළයුතු වුවද, දෙපාර්තමේන්තුවේ පුස්තකාලාධිපති තනතුර අවුරුදු 08 කට වැඩි කාලයක් පුරප්පාඩුව ඇති බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම | දෙපාර්තමේන්තුවේ පුස්තකාලයාධිපති තනතුරේ පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස රාජ්‍ය රාජ්‍ය සේවා අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | 2022 මාර්තු 23 දින වන විටත් පුස්තකාල තනතුර පුරප්පාඩුව පැවැතුණි. |

**3.7 ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි රෙගුලාසි 756 හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.5 ඡේදය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය අවසන් කර ලබාදුන් සමීක්ෂණ වාර්තාවේ දැක්වෙන නිර්දේශ විගණිත දිනය වූ 2018 අප්‍රේල් 19 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් දක්වා ඇති නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කඩිනමින් ක්‍රියාකාරි විය යුතු වීම. | ඉදිරි වර්ෂයේදි චක්‍රලේඛය පරිදි භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නිම කිරීමට සටහන් කර ගතිමි. | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ දැක්වෙන නිර්දේශ 2022 මාර්තු 23 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | පුනරාවර්තන වියදම් තුළ 2006/2007 වර්ෂවල සිංගප්පූරුවේ පැවැත්වූ ජාත්‍යන්තර බේරුම්කරණයේදී පෞද්ගලික සමාගමක ගැටළු නිරාකරණය කිරීමට රු.1,670,000,000 ක ප්‍රතිපාදන 2019 වර්ෂයේදී සලසා තිබුණත්,2019 වර්ෂය අවසන් වන විටත් ඒම ප්‍රතිපාදන | වාර්ෂික ඇස්තමේන්තු තාත්ත්වික හා ඵලදායි ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ලත යුතු වීම. | මේ සඳහා ජාත්‍යන්තර බේරුම්කරණ ප්‍රධානය අනුව අදාල සමාගම සමඟ ගිවිසුමක් අත්සන් කළ යුතුව ඇති බවත් ඒ දක්වා ගිවිසුම්ගත නොවූ හෙයින් එම මුදල් ගෙවීම සඳහා ඉදිරිපත් වී නොමැති හෙයින් ගෙවීම සඳහා ඉදිරිපත් වන තෙක් ඒ සඳහා වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කර ගත යුතුව ඇති බව දන්වා එවා තිබුණි. | 2021 වර්ෂයේදි මේ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි | | | |
| **(ඇ)** | බදු ආදායම් යටතේ වූ මත්පැන් බදු ආදායමෙහි 1994 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු.986,683,292 ක හිග ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් හෝ දෙපාර්තමේන්තුව විසින් ඊට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිග ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වීම. | සුරාබදු දෙපාර්තමේන්තුව විසින් මෙම හිඟ බදු මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු කරමින් පවතින බව දන්වා එවා තිබුණි. | 2022 මාර්තු 23 දින වන විටත් හිඟ මුදල් අයකර ගෙන නොතිබුණි |
| **(ඈ)** | නියැදි විගණන පරීක්ෂාවේදී දෙපාර්තමේන්තු 12 කට අදාළව 2017 දෙසැම්බර් 31 දිනට රු.3,684,742,481 ක සමුච්චිත හිඟ මුදලක්ද, 2018 වර්ෂය සඳහා රු.813,737,824 ක හිඟ මුදලක්ද හා 2019 වර්ෂය සඳහා රු.938,291,785 ක සමුච්චිත හිඟ මුදලක්ද වශයෙන් එකතුව රු.5,434,916,146 ක් වූ හිඟ මුදල් පැවැතුණි. | හිග ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. | රජයේ බදු හා බදු නොවන ආදායම් සඳහා මෙතෙක් ඇති සියළුම ආදායම් සංකේතාංකයන් හා සබැදි හිඟ ආදායම් සම්බන්ධයෙන් මේ වනවිට දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ඉදිරි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම උදෙසා විස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකරමින් සිටින බවත්, පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන්ද මෙහිදී විශේෂ අවධානයක් යොමුකිරීමට කටයුතු කරන බවත් දන්වා එවා තිබුණි. | 2022 මාර්තු 23 දින වන විටත් හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. |
| **(ඉ)** | ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 20.03.06.00 දරන ආදායම් සංකේතය යටතේ එක්සත් ජාතීන්ගේ | හිග ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වීම. | රජයේ බදු හා බදු නොවන ආදායම් සඳහා මෙතෙක් ඇති සියළුම ආදායම් සංකේතාංකයන් හා සබැදි හිඟ | 2022 මාර්තු 23 දින වන විටත් හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට |

| | | | | |
|---|---|---|---|---|
| | සාමසාධක මෙහෙයුමේ රාජකාරී වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දින දක්වා එ.ජ.ඩොලර් 1,544,118 ක්ද, 2018 වර්ෂයට අදාලව එ.ජ.ඩොලර් 3,228,591 ක්ද, 2019 වර්ෂයට අදාලව එ.ජ.ඩොලර් 7,271,434 ක්ද, වශයෙන් එකතුව එ.ජ.ඩොලර් 12,044,143 ක් හිඟහිට පැවතුණි. | | ආදායම් සම්බන්ධයෙන් මේ වනවිට දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ඉදිරි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම උදෙසා විස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකරමින් සිටින අතර, ඔබ විසින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන්ද මෙහිදී විශේෂ අවධානයක් යොමුකිරීමට කටයුතු කරන බව දන්වා එවා තිබුණි. | අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. |
| (ඊ) | දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන, අංක 1002.10.00 දරන සමාජ වගකීම් බද්ද ආදායම් සංකේතය යටතේ, රු.64,630,699 ක් හිඟහිටව පැවතුණි. 2020 වර්ෂයේදි ඉන් රු. 15,838 ක් අය කර ගෙන තිබුණු අතර, එය අයකර ගත යුතු මුළු මුදලෙන් සියයට 0.025 ක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 128(ඉ) ප්‍රකාරව හිඟ ආදායම් අප්‍රමාදව රැස් කර ගත යුතු වීම. | හිඟහිටි ආදායම් වාර්තා අර්ධ වාර්ෂිකව විගණන දෙපාර්තමේන්තුව වෙත නොකඩවා ඉදිරිපත් කර ඇති අතර, කාල විශ්ලේෂණය අනුව එම වාර්තා ලබා දීමට කටයුතු කරන මෙන් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව හා රේගු දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. එය ලද පසු ඔබ වෙත යොමු කිරීමට කටයුතු කරන අතර මේ සම්බන්ධයෙන් සිහි කැඳවීමක් ද යොමු කිරිමට කටයුතු කරමි. | 2021 වර්ෂයේ රු. 5,820 ආදායමක් එකතු කර තිබුණු අතර රු.1,449,239 ක හිඟ හිටි ආදායමක් කපා හැර තිබුණි. |
| (උ) | දෙපාර්තමේන්තුව තුළ අනුමත තනතුරු 56 ක් වී තිබුණු අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 50 ක් වී තිබුණි. ඒ අනුව තනතුරු 06 ක පුරප්පාඩු පැවතුණු අතර | දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම. | නව කාර්යමණ්ඩලය අනුව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩුව මේ වනවිට සම්පූර්ණ වී ඇත. නව කාර්ය මණ්ඩලය යටතේ පරිපාලන සේවයේ අනුමත | 2021 දෙසැම්බර් 31 දිනට තනතුරු 06 ක පුරප්පාඩුව පැවතුණි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂක ජනරාල් විවෘත තනතුර යටපත් කර දෙන මෙන් කළමනාකරණ |

| | | | | |
|---|---|---|---|---|
| | එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 11 ක් වි තිබුණි. ඒ තුළ ජොෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් පුරප්පාඩුව පැවැතුණි. | | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ තනතුරු 06 ක් පවතින අතර ඉන් 04 ක් දැනටමත් සම්පූර්ණ වී ඇත. කාර්යාල කාමර ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බැවින්, කාර්යාල කාමර ඉදිකළ විගස මෙම පුරප්පාඩු පිරවීමට පියවර ගනිමි. | සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. |
| (ඓ) | තෘතියික මට්ටමේ භාෂා පරිවර්තක (ඉංග්‍රීසි / සිංහල) තනතුර සඳහා වසර 04 ට ආසන්න කාලයක් පුරප්පාඩුව පැවැතුණි. | අවශ්‍යතාවය පරිදි අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. | කාර්යාල කාමර ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බැවින්, කාර්යාල කාමර ඉදිකළ විගස මෙම පුරප්පාඩු පිරවීමට පියවර ගනිමි. | භාෂා පරිවර්තක යටපත් කර දෙන මෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. |

**3.8 ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2018 වර්ෂය තුළ නව ණය ගිවිසුම් මගින් එ.ජ.ඩො. මිලියන 2,004 ක අරමුදල් සපයා ගැනීමට අපේක්ෂා කර තිබුණද, 2018 වර්ෂය තුළ ණය ගිවිසුම් 40 ක් සම්බන්ධව එළඹ තිබූ මූල්‍යයන එකඟතාවල වටිනාකම එ.ජ.ඩො. මිලියන 1,242 ක් විය. ඒ අතර ලෝක බැංකුව, චීනය, ජපානය සහ කොරියාව යන රටවලින් ලබාගැනීමට අපේක්ෂිත අරමුදල් ප්‍රමාණය පිළිවෙලින් එ.ජ.ඩො. මිලියන 200, 400, 500 හා 40 ක් වූ අතර 2018 වර්ෂය තුළ පිළිවෙලින් එ.ජ.ඩො. මිලියන 104, 165, 98 හා 22 ක අරමුදල් ලබා ගැනීමට හැකි වී තිබුණි. | හැකිතාක් දුරට අපේක්ෂිත පරිදි ඉලක්ක ලගා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඔබගේ වාර්තාවේ සඳහන් කරුණු සත්‍ය වන අතර ඒ සඳහා හේතු වූ ඉතාමත් ප්‍රායෝගික වූ හා අපගේ විෂය පථයෙන් ඔබ්බෙහි වූ දේශපාලන වෙනස්වීම්, නීතිමය ගැටළු හා ප්‍රතිපත්තිමය තීරණ වෙනස්වීම් වැනි කරුණු හේතුවෙන් 2018 වර්ෂයේ සැලසුම් කළ පරිදි ගිවිසුම් අත්සන් කිරීමට නොහැකි විය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කොට තිබූ එහෙත් පැවති රජය සහ අමාත්‍ය මණ්ඩලයේ යම් යම් තීරණයන්ට අනුව යමින් ක්‍රියාකාරී සැලැස්මේ යම් යම් වෙනස්කම් සිදු කර තිබුණි. |
| (ආ) | පහත සඳහන් ණය ගිවිසුම් සඳහා එළඹ සැලකිය යුතු කාලයක් ගතවී තිබුණද ඒ සම්බන්ධ ව්‍යාපෘති 2018 වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි. | | | |
| (i) | **ණය අංකය 2014023** භෞමික රූපවාහිනී සම්ප්‍රේෂණය ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය - 2014.09.23 | ගිවිසුම් ගත වූ ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. | 2014 සැප්තැම්බර් 24 දින ව්‍යාපෘතිය සඳහා ණය ගිවිසුම අත්සන් කර තිබුණි. මෙතෙක් JICA ආයතනය ණය ගිවිසුම | ණය ගිවිසුමේ ණය උපයෝජන කාලසීමාව 2028 |

| | | | | |
|---|---|---|---|---|
| | | | සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නොමැත. | දෙසැම්බර් 17 දක්වා දීර්ඝ කර ඇත. |
| (ii) | **ණය අංක 2014039** රුවන්වැල්ල ජල සැපයුම් ව්‍යාපෘතිය - 2014.12.30 | -එම- | අදාළ ණය ගිවිසුමට 2014 දෙසැම්බර් මාසයේදී එළැඹිණි. ලංසුව, ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා ඉතා ඉහළ අගයක් ගැනීම හේතුවෙන් දෙපාර්ශවය අතර අවසන් එකඟතාවයක් ඇතිවී නොමැත. | සිවිල් කොන්ත්‍රාත්තුව සඳහා වූ හිඟ මුදල ශ්‍රී ලංකා රජයෙන් දැරීමට එකඟ වී තිබුණු අතර 2022 මාර්තු 23 දින වන විට ව්‍යාපෘතියේ සියයට 20 ක පමණ වැඩ කොටස් අවසන් කර ඇත. |
| (iii) | **ණය අංක 2013052** ආර්ථික සහ තාක්ෂණ සහයෝගීතාවය | -එම- | මෙය පොළී රහිත ණයක් වන අතර ගැටළු කිසිවක් නොමැති ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට චීන තානාපති කාර්යාලය එකඟතාව බලාපොරොත්තුවෙන් සිටී. | 2022 මාර්තු 23 දින වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (iv) | **ණය අංක 2014021** නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය (බී කොටස) – 2014.09.12 | -එම- | සාකච්ඡා වාර ගණනාවක් සිදුකර ඇතත් නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියාකාරකම් ඉටුකිරීම පිළිබඳව විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් සෑහීමකට පත්වන තුරු අදාල මුදල් විධිමත් ලෙස උපයෝජනය නොවීය. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර අවසන් අතර, උපයෝජනය නොවූ අරමුදල් අවලංගු කර ඇත. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශයේ වියදමින් දෙපාර්තමේන්තුවේ සිදුකරන ලද නවීකරණ කටයුතුවල එකතුව | දෙපාර්තමේන්තුවට අදාළ වත්කම් භාරගැනීම හා | දෙපාර්තමේන්තුවෙහි නවීකරණ කටයුතු මුදල් අමාත්‍යාංශයේ වියදමින් | 2020 මාර්තු 23 දින වන විටත් අදාළ වත්කම් පවරා |

| | | | | |
|---|---|---|---|---|
| | රු. 22,160,324 ක් වූ වත්කම් නිසි පරිදි දෙපාර්තමේන්තුව වෙත භාරගෙන, ලේඛනගත කිරීමට අවශ්‍ය කටයුතු 2020 වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබුණි. | ලේඛනගත කිරීම කඩිනම් කළ යුතු වීම. | සිදුකරන ලද අතර, මුදල් අමාත්‍යාංශය විසින් අවශ්‍ය ලේඛන විධිමත් පරිදි මෙම දෙපාර්තමේන්තුව වෙත 2020.12.31 දිනට පෙර භාරදී නොතිබීම නිසා ඒවා පරීක්ෂාකර දෙපාර්තමේන්තු පොත්වලට ඇතුළත් කිරීමේ කටයුතු ප්‍රමාද විය. | ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. |
| (ඇ) | රජයේ ණයවලට අදාළ දත්ත පදනමක් පවත්වා ගැනීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් විය. එම ණය ලබාගැනීම, ආපසු ගෙවීම හා සේවාකරණයට අදාළ පද්ධතියේ ඇතුළත් තොරතුරු හා ඒ හා සම්බන්ධ අනෙකුත් පාර්ශව සතු තොරතුරු එකවර යාවත්කාලීන වන අයුරින් පද්ධතිය සංවර්ධනය කර නොතිබීම හේතුවෙන් එම පාර්ශව හා දෙපාර්තමේන්තු සතු තොරතුරුවල පහත වෙනස්කම් නිරීක්ෂණය විය. | | | |
| (i) | ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ තොරතුරු වල අඩංගු වූ විදේශ ණය සේවාකරණයට අදාළ රු.මිලියන 222.6 ක් දෙපාර්තමේන්තු පද්ධතියේ ඇතුළත් වී නොතිබීම. | අදාළ සියළු පාර්ශව සමඟ නිවැරදි හා යාවත්කාලීන තොරතුරු ඇතුළත් පද්ධතියක් සංවර්ධනය කර පවත්වාගෙන යායුතු වීම. | ණය මුදල් 02 ක් සඳහා ගෙවන ලද නියෝජිත හා ඇපකර ගාස්තු වෙනත් වර්ගීකරණයකින් දක්වා ඇති අතර අනෙක් ණය ගිවිසුම් සෘජුවම අදාළ ආයතන සමඟ ගිවිසුම් ගතවූ ව්‍යාපෘති වේ. ඊට අදාළ බැඳීම් ගාස්තු පද්ධතියේ සටහන් කර ඇත. | මුදල් ප්‍රවාහ කළමණාකරණය හා ගිණුම්කරණ කටයුතු සඳහා (CS DRMS) දත්ත පද්ධතිය සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | දෙපාර්තමේන්තුවේ පද්ධතියේ ඇතුළත් වූ විදේශ ණය සේවාකරණයට අදාළ රු.මිලියන 461 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තු තොරතුරුවල ඇතුළත් වී නොතිබුණි. | -එම- | ගිවිසුම් ප්‍රකාරව මෙම ණය සඳහා උපයෝජන කාලය තුළ පොළිය හා බැඳීම් ගාස්තු ප්‍රාග්ධනිත කරනු ලැබේ. ඒ අනුව එම ආයතනවලට අදාළ ප්‍රාග්ධනිත කරන ලද බැඳීම් ගාස්තු පද්ධතිය තුළ ඇතුළත් වන නමුත් මුදලින් ගෙවීමක් නොවීම මත ශ්‍රී ලංකා මහ බැංකු තොරතුරුවල ඇතුළත් නොවේ. | මුදලින් ගෙවීමක් නොවන බැවින් එය ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවල ඇතුළත් වී නොතිබුණි. |
| (ඉ) | විදේශ ආධාර ලබාගැනීම හා ඒවා කාර්යක්ෂමව යෙදවීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් අදාළ පාර්ශව සමඟ කතිකාවත් සිදුකිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද, ඊට අදාළව මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛවලට අනුගත නොවූ පහත සඳහන් අවස්ථා පැවතිණි. | | | |
| (i) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ ආධාර සම්බන්ධ සියළු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කළ යුතු වුවත්, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, 2018 හා 2019 වර්ෂවල මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 24 ක් විසින් ව්‍යාපෘති 77 ක් සඳහා | අදාළ සියළු පාර්ශව සමඟ නිවැරදි හා යාවත්කාලීන තොරතුරු ඇතුළත් පද්ධතියක් සංවර්ධනය කර පවත්වා ගත යුතු වීම. | මෙම දෙපාර්තමේන්තුව මඟින් සහ භාණ්ඩාගාරයේ අනෙකුත් දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණයෙන් යුක්තව සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන වෙත විදේශ ප්‍රදාන ලබාගැනීමේ නිවැරදි ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කරමින් ඒ අනුව කටයුතු කරන ලෙස | චක්‍රලේඛ හා මාර්ගෝපදේශ අනුව අදාළ ආයතන ක්‍රියාත්මක විය යුතු අතර, එසේ වන බවට වග බලාගැනීම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ වගකීමක් වුවත්, විදේශ සම්පත් |

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 2,026 ක විදේශ ප්‍රදාන සෘජුවම අදාළ ආයතන විසින් ලබාගෙන තිබුණි. | | චක්‍රලේඛ හා උපදෙස් නිකුත් කර ඇත. | දෙපාර්තමේන්තුව විසින් ඊට අදාළ පසුවිපරම් කටයුතු සිදු කර නොතිබුණි. |
| (ii) | එසේම, නියැදි පදනම මත ලබාගත් තොරතුරු අනුව, 2020 වර්ෂය තුළ එසේ මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් එකතුව රු. මිලියන 1,266 ක විදේශ ප්‍රදාන සෘජුව ලබාගෙන තිබුණි. | -එම- | අදාළ චක්‍රලේඛ අනුව ප්‍රතිපාදන සලසා ගැනීම අමාත්‍යාංශ ලේකම්වරයා සතු වගකීමකි. | - එම - |
| (ඊ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු අතර, ප්‍රමුඛ අංශ සංවර්ධන මූල්‍යනයන් සඳහා දැරිය හැකි පිරිවැයක් යටතේ විදේශ ණය ලබාගැනීමට හා විදේශ ණය කාර්යක්ෂම හා ඵලදායී භාවිතය සඳහා පහසුකම් සැලසීම ඇතුළත් විය. එසේ වුවද, විගණනයේදී නිරීක්ෂණය වූ පහත කරුණු හේතුවෙන් එම අරමුණු ලඟාකරගැනීමේදී දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම කොතරම් දුරට සාර්ථක වීද යන්න විගණනයේදී ප්‍රශ්නකාරී විය. | | | |
| (i) | 2020 වර්ෂය තුළදී ගිවිසුම්ගතව ලබාගත් විදේශ ණයවල වටිනාකම එ.ජ.ඩො.මිලියන 1,281.1 ක් වූ අතර ඉන් සියයට 39 ක් චීන සංවර්ධන බැංකුවෙන් ලබාගත් | අදාළ සියළු පාර්ශව සමඟ නිවැරදි හා යාවත්කාලීන තොරතුරු ඇතුළත් පද්ධතියක් සංවර්ධනය කර පවත්වාගෙන යායුතු වීම. | 2020 වර්ෂය පුරා පැවති කොවිඩ් වසංගත තත්ත්වය ඇතුළු රටේ ආර්ථික වර්ධනය අඩාල වීමට බලපාන අනෙකුත් කරුණු හේතුවෙන් | අයවැය මූල්‍යනය සඳහා වෙළඳපොළ ණය ලබා ගෙන තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන 500 ක වෙළඳපොල ණය බව නිරීක්ෂණය විය. | | වඩාත් පුළුල් වූ රටේ ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීම ඇතුළු කරුණු සඳහා එ.ජ.ඩො. මිලියන 500 ක කාලීන ණය පහසුකමක් ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් උපදෙස් ප්‍රකාරව මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ කටයුතු ක්‍රියාත්මක කොට ඇත. | |
| (ii) | 2020 වර්ෂයේදී එ.ජ.ඩො. මිලියන 4,057.9 ක් ණය සේවාකරණ ගෙවීම් සිදුකර තිබූණු අතර ඉන් එ.ජ.ඩො. මිලියන 1,419.4 ක් හෙවත් සියයට 35 ක් පමණ ණය පොළී ගෙවා තිබුණි. එය වර්ෂය තුළදී ගිවිසුම්ගතව ලබාගත් විදේශ ණයට වඩා ඉහළ අගයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | -එම- | 2020 වර්ෂය අවසාන වනවිට විදේශ ණය ප්‍රමාණය එ.ජ.ඩො. බිලියන 35 කට ආසන්නවේ. ඒ අනුව වාර්ෂිකව ගෙවිය යුතු පොළී ප්‍රමාණය මේ වන විට වැඩිවී ඇත. | වාර්ෂික ලබා ගෙන තිබූණු ණය ප්‍රමාණය වැඩිවීම නිසා වාර්ෂික ලබා ගන්නා ණය ප්‍රමාණයට වඩා පොළී ප්‍රමාණය වැඩි වී තිබුණි. |
| (iii) | විදේශ ණය ලබාගැනීමේදී ගිවිසගත් ණය මුදලින් උපයෝජනය නොකළ වටිනාකම සඳහා ගිවිසුම් ප්‍රකාරව බොහෝ අවස්ථාවලදී රජය විසින් විශාල වියදමක් දරන බව නිරීක්ෂණය විය. ඒ වෙනුවට ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළදී ණය මුදල ලබාගෙන අදාළ ව්‍යාපෘතියට යොදවා එම ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිලාභවලින් ණය පොළී සහ වාරික ගෙවීම කාර්යක්ෂම ණය | | | |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණයක් තුළින් සිදුවිය යුතු වුවද, විදේශ ණය ලබාගැනීම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවලදී එසේ නොවන අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය. | | | |
| * | **ණය අංක 2015025**<br>මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් එ.ජ.ඩො. මිලියන 76 ක ණය මුදලක් වසර 05 ක සහන කාල පරිච්ඡේදයක් සහිතව වසර 26 කින් ගෙවීමේ පදනම මත ලබාගැනීමට 2015 සැප්තැම්බර් 17 දින ගිවිසුම ගතවී තිබුණු අතර එහිදී ණය මුදලින් උපයෝජනය නොවූ ණය ශේෂය සඳහා සියයට 0.15 ක වගකීම් ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි.<br>විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව 2020 ජූනි 20 දින වන විට ණය ලබාගෙන අවසන් කළයුතු වුවත් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් එම ණය මුදලින් එ.ජ.ඩොලර් 31,973,267 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ණය මුදලෙන් සියයට 58 ක් හෙවත් එ.ජ.ඩො. 44,026,733 ක් උපයෝජනය කර නොතිබුණි. ඒ සඳහා සියයට 0.15 වගකීම් ගාස්තුව ලෙස, 2020 වර්ෂයේ ජූනි | ගිවිසුම් ගත ණය මුදල් උපයෝජනය කාර්යක්ෂම හා කඩිනම් කිරීම තුළින් රජයට දැරිය යුතු අමතර පිරිවැය අවම කර ගැනීම. | සුදුසුකම් ලැබූ කොන්ත්‍රාත්කරුගේ මූල්‍යමය හැකියාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙනත් ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබුවේ 2020 දෙසැම්බර් මාසයේදීය. ඒ අනුව කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රගතිය සැලසුම් කළ පරිදි සිදු නොවීම නිසා අදාළ දිනට ලබා ගැනීමට බලාපොරොත්තු වූ ප්‍රගතිය ලබා ගැනීමට නොහැකි වී ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට මුළු භෞතික ප්‍රගතිය සියයට 29 ක් වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සහ දෙසැම්බර් මාස වලදී එකතුව රු. 14,410,871 ක් ගෙවා තිබුණි. | | | |
| * | **ණය අංක 2015019**<br>බඩල්ගම කිරි සැපයුම් මධ්‍යස්ථානය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියෙහි පිරිවැය මූල්‍යනය කිරීම සඳහා HSBC බැංකුවෙන් අපනයන ණය පහසුකම් යටතේ යුරෝ 56,580,214 ණය මුදලක් වසර 03 ක සහන කාලයක් සහිතව වසර 13 ක ආපසු ගෙවීම් කාලයක් සහ ණය මුදලේ උපයෝජනය නොකළ ශේෂය සඳහා වාර්ෂිකව සියයට 0.5 එකඟතා ගාස්තුවක් යටතේ ලබාගැනීමටද එසේම යුරෝ 9,975,863 ණය මුදලක් වසර 02 ක සහන කාලයක් සහිතව වසර 06 ක ආපසු ගෙවීමේ කාලයක් සමඟ ලබාගැනීමටද 2015 අගෝස්තු 14 වන දින ගිවිසුම් ගත වී තිබුණි.<br>විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව 2020 දෙසැම්බර් 31 දින වනවිට ඉන් යුරෝ 59,190,497 ක් උපයෝජනය කර තිබූ අතර එදිනට උපයෝජනය නොකළ වටිනාකම යුරෝ 7,365,580 ක් විය. ඒ අනුව උපයෝජනය නොවූ එම වටිනාකම සඳහා ගිවිසුම් ප්‍රකාරව සියයට 0.5 ක වාර්ෂික එකඟතා ගාස්තුව ලෙස | -එම- | ඉඩම් පවරාගැනීම ප්‍රමාදවීම, යන්ත්‍රෝපකරණ ඉදිකිරීම් පරිශ්‍රය වෙත ලඟා වීම ප්‍රමාදවීම හා කොවිඩ් - 19 වසංගත තත්ත්වය නිසා නියමිත දිනට ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකි වී ඇත. | මෙම ව්‍යාපෘතිය 2022 මාර්තු 23 දින වන විට සියයට 90 ක පමණ ප්‍රගතියක් වාර්තා කර ඇති අතර, ව්‍යාපෘතිය 2022 වර්ෂය තුළ අවසන් වීමට නියමිතව ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.7,890,913 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. | | | |
| (උ) | ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව අංක 2019011 දරන "සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති" ව්‍යාපෘති ගිවිසුම අවසන් කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | | |
| (i) | අදාළ ණය ගිවිසුම අවසන් කිරීම හේතුවෙන් එම ව්‍යාපෘතියට අදාළ පෙර ගෙවුම් ගාස්තු (Front End Fee) ලෙස දැනටමත් වැය කර ඇති ජපන් යෙන් (¥) 60,080,000 ක මුදල සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව 2020 දෙසැම්බර් 31 දින වන විටත් තීරණයකට පැමිණ නොතිබුණු අතර ලබාගත් ණය මුදල ආපසු ගෙවන අවස්ථාවේදී මේ පිළිබඳව සාකච්ඡා කිරීමට නියමිත බව විගණනයට දන්වා තිබුණි. | නිවැරදි අධ්‍යනයනයන් හා විශ්ලේෂණ මත ව්‍යාපෘති කාර්යක්ෂම හා ඵලදායී භාවිතය සඳහා පහසුකම් සැලසිය යුතුවීම. | ණය මුදල ආපසු ගෙවන අවස්ථාවේදී සාකච්ඡා කර එකඟතාවයකට එළඹීමට නියමිතය. | 2022 මාර්තු 23 දින වන විට ව්‍යාපෘතිය කාර්යාලයද වසා තිබුණු අතර, ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා තීරණයකට එළඹ නොතිබුණි. |
| (ii) | එසේම, 2020 දෙසැම්බර් 31 දින සිට උපදේශන කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීම හේතුවෙන්, අදාළ උපදේශන ආයතනය විසින් අලාභ හා හානි වෙනුවෙන් US$ 23,657,761 ද ඇතුළුව US$ 31,364,767 ක් සඳහා හිමිකම් පා තිබුණු අතර මුළු හිමිකම් පෑමට සාපේක්ෂව අලාභ හානි අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 75 ක් විය. | -එම- | මීට අදාළ කමිටු වාර දෙකක් රැස් වී ඇති අතර ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී . | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | 2021 ජනවාරි 19 දින වන විට අදාළ ණය මුදලින් ජපාන යෙන් (¥) 2,905,525 එනම් රු.4,886,234,915 ක් උපයෝජනය කර තිබුණ අතර ණය ගිවිසුම අවසන් කිරීමට තීරණය කිරීම හේතුවෙන් උපයෝජිත මුදල නැවත ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳව එකඟතාවයකට මෙතෙක් පැමිණ නොතිබුණි. | -එම- | කමිටුවේ තීරණය මත මෙම ගිවිසුමට අදාළ ඉදිරි කටයුතු සිදුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ. | -එම- |
| (iv) | 2021 ජනවාරි මාසය වනවිටත් මෙම ව්‍යාපෘතියේ කාර්යාලය වසාදැමීම ඇතුළුව ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු අවසන් කර නොමැති බවට වාර්තා වූ අතරම ලිපිගොනු අනුව මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට සමගාමීව විකල්ප ව්‍යාපෘතියක් පිළිබඳ තොරතුරු හා දැනටමත් ලබාගෙන තිබූ උපදේශන සේවා ප්‍රමාණය වෙනත් ව්‍යාපෘතියක් සඳහා කාර්යක්ෂමව යෙදවීමට සැලසුම් කර ඇති බවත් නිරීක්ෂණය වුවත් ඒ පිළිබඳව විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | මෙම කටයුතු මූලික අදියරයේ පවතින බැවින්, මේ වන තෙක් එහි ප්‍රගතිය පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව දැනුවත් කොට නොමැත. | 2021 ඔක්තෝබර් 16 දිනැති හා 2021 දෙසැම්බර් 09 දිනැති පිළිවෙලින් අංක MUDFH/F/9/1-Budget හා MUDFH/F/LRT දරන නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපි මගින් වන්දි මුදල් ගෙවීම් කිරීමට සලකා බැලීම සඳහා පත් කළ කමිටුවේ කාර්යයන්ට සහයවීම සඳහා නිලධාරීන් කිහිප දෙනෙකු යොදවා ඔවුන් වැටුප් හා දීමනා ගෙවීම සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | රු.මිලියන 8 ක ප්‍රතිපාදන ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලා තිබුණි. |

### 3.9 ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ අයවැය යෝජනා යටතේ ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබාදුන් යතුරුපැදි ආනයනය කිරීමේදී බදුවලින් නිදහස් කර තිබුණද, සැපයුම්කාර සමාගම ඒ වන විටත් නිෂ්පාදන බදු ගෙවා ආනයනය කර තිබූ යතුරුපැදි 2000 ක් ලබාගෙන බෙදාදීමට කටයුතු කර තිබුණි. එම යතුරුපැදි 2000 ට අදාළ රු. 109,612,000 ක් වූ නිෂ්පාදන බදුවලින් රු. 12,505,974 ක් 2020 දෙසැම්බර් 31 දින වර්ෂ 05 කට පසු එනම් කල්බදු වාහන සඳහා ලබාගත් ණය මුදල් ආපසු ගෙවීම සඳහා වූ 2108 - කල්බදු වාහන සඳහා ලබාගත් ණය මුදල් ආපසු ගෙවීම වැය විෂයය යටතේ දරා තිබුණි. ඉතිරි බදු මුදල් ඉදිරියේදී ගෙවීමට සිදුවිය හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා රජයේ වියදම කුමන මට්ටමක තබා ගත යුතුද, යන්න තීරණය කිරීම සඳහාත්, අයවැය පරතරය කෙතරම්ද යන්න තීරණය කිරීම සඳහාත් අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකතනය හා වාර්තා තබා ගැනීම විධිමත් කළ යුතුවීම. | සංශෝධිත විචලතාවන්ට හේතු පැහැදිලිව මූල්‍ය ප්‍රකාශ තුළ දක්වා ඇති අතර ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේදී හඳුනා නොගත් ප්‍රමුඛ වියදම් දැරීම් සඳහා ඇස්තමේන්තු සංශෝධනය කිරීමට සිදුවේ. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් දුරට නිවැරදිව වියදම් තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී වැය විෂයයන් 08 ක විචලතාවය සියයට 88 ක අඩුවීමේ සිට සියයට 64 ක වැඩිවීම | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා රජයේ වියදම කුමන මට්ටමක තබා ගත යුතුද යන්න තීරණය කිරීම සඳහාත්, අයවැය පරතරය | සංශෝධිත විචලතාවන්ට හේතු පැහැදිලිව මූල්‍ය ප්‍රකාශ තුළ දක්වා ඇති අතර ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේදී | 2021 වර්ෂය අවසානයේදීත් වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 1,518.92 ක ප්‍රතිපාදන මුළුමුලින්මද, වැය විෂයයන් 07 ක් සඳහා සලසා |

| | | | | |
|---|---|---|---|---|
| | දක්වා පරාසයක් තුළ වෙනස් වී තිබුණි. | කෙතරම්ද යන්න තීරණය කිරීම සඳහාත් අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකතනය හා වාර්තා තබා ගැනීම විධිමත් කළ යුතුවීම. | හඳුනා නොගත් ප්‍රමුඛ වියදම් දැරීම් සඳහා ඇස්තමේන්තු සංශෝධනය කිරීමට සිදුවේ. | තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 27 ක සිට සියයට 95 ක් දක්වා පරාසයක ප්‍රමාණය වූ එකතුව රු.මිලියන 29,012.59 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. |
| (ඈ) | 2001 පෙබරවාරි 16 දින මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.102,497.60 වූ ණය ශේෂය වසර 20 කට අධික කාල සීමාවක සිට හිඟහිටව පැවැත එමින් තිබුණි. එම ණය ශේෂ අයකර ගැනීමට 2014 පෙබරවාරි 26 දිනෙන් පසු කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා හෝ නිරාකරණය සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | මේ සම්බන්ධව නීති මගින් කටයුතු කරන බවට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දී ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමි. | 2022 මාර්තු 23 දින වන විටත් හිඟහිටි ණය ශේෂය අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) | 2000 සැප්තැම්බර් 18 දින මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.101,561.30 ක් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා හෝ නිරාකරණය සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | ඔහුගේ සම්බන්ධිත පාර්ශවයන්ට විරුද්ධව නීති මගින් කටයුතු කරන බවට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දී ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමි. | 2022 මාර්තු 23 දින වන විටත් අදාළ හිඟහිටි ණය ශේෂය අයකර ගෙන නොතිබුණි. |
| (ඉ) | 2015 සැප්තැම්බර් 23 දින සිට රාජකාරී කටයුතු සඳහා වාර්තා නොකිරීම හේතුවෙන් 2015 ඔක්තෝබර් 13 සේවය අතහැරයාමේ නියෝගයක් නිකුත් කර තිබූ නිලධාරියා විසින් 2017 අප්‍රේල් 26 දින ඉදිරිපත් කල අභියාචනාව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිෂ්ප්‍රභා කරමින් ඒ බව 2018 අගෝස්තු 17 දින | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා හෝ නිරාකරණය සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | නීති මගින් කටයුතු කරන බවට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දී ඇති අතර, ඒ සඳහා පිළිතුරු නොලදහොත් නඩු පැවරීමට අදහස් කරමි. | 2022 මාර්තු 23 දින වන විටත් හිඟහිටි ණය ශේෂය අයකර ගැනිමට අපොහොසත් වී තිබුනි. |

| | | | | |
|---|---|---|---|---|
| | අයවැය අධ්‍යක්ෂක ජනරාල්ට දන්වා යවා තිබුණි. එම නිලධාරියාගේ 2020 දෙසැම්බර් 31 දින වනවිටත් අයවිය යුතු රු. 150,119 ක් වූ ණය ශේෂය අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඊ) | අයවැය දෙපාර්තමේන්තුවේ අංක 150 දරණ චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් රාජ්‍ය ආයතන වෙනුවෙන් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගන්නා ලද එකතුව රු.2,824,733,981 ක් වූ වාහනවල කල්බදු කාලය සමාලෝචිත වර්ෂයෙන් අවසාන වී තිබුණත්, ඒවා අදාළ ආයතනවලට පවරා දීමට කටයුතු කර නොතිබුණි. | කල්බදු කාලය අවසන් වාහන විධිමත් පරිදි හා කඩිනමින් පවරාදීම කටයුතු කළ යුතු වීම. | රජය විසින් මිලදීගෙන, වෙනත් ආයතන වෙත මෙතෙක් පවරා නොදුන් රු.2,824,733,981 ක කල්බදු වාහන 2020 වර්ෂය පුරාම පැවති COVID 19 වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා රජය ගත් යම් යම් ක්‍රියාමාර්ග හේතුවෙන් වර්ෂය තුළදී නිසි පරිදි පවරාදීමට නොහැකිවිය. | 2022 මාර්තු 23 දින වන විටත් වාහන පැවරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. |
| (උ) | 2014 ජූලි 23 දිනැති අංක 2/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව, ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබාදුන් යතුරුපැදි වල ලියාපදිංචි අයිතිය වසර 5ක කාලයකට පසුව පුද්ගලික නමට පැවරෙන නමුත් මහා භාණ්ඩාගාරය විසින් රු.16,792,961,055 ක් වටිනා යතුරුපැදිවල එම කාලය අවසන් වී තිබුණද ඒවා නිසිලෙස පවරා දීමට කටයුතු කර නොතිබුණි. | කල්බදු කාලය අවසන් වාහන විධිමත් පරිදි හා කඩිනමින් පවරාදීම සිදුකළ යුතුවීම. | 2020 දක්වා ගෙවීම් අවසන් යතුරුපැදි පවරා දීම සඳහා ලේඛන සකස් කර තිබුණත් COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් එම කටයුතු ප්‍රමාද විය. | 2022 මාර්තු 23 දින වන විටත් කල් බදු කාලය වර්ෂ 5 ක් ඉක්මවා තිබුණු යතුරු පැදි අදාළ පාර්ශවයන්ට අයිතිය පැවැරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2020 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 09 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක් ලෙස පුරප්පාඩු 25 ක් පැවැතුණි. | මේ අයුරින් කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ නොමැති නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළයුතු වීම. | පුරප්පාඩු පවතින තනතුරු සම්පූර්ණ කරන ලෙස වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇති නමුත්, මෙතෙක් ඒ සඳහා නිලධාරීන් ලැබී නොමැත. | 2022 මාර්තු 23 දින වන විටත් පුරප්පාඩු පැවැතුණි. |

### 3.10 ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 6 ක කාල පරිච්ඡේදය තුළ කිසිදු වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 5 කින් වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාරවල වාර්ෂික වාර්තා ප්‍රමාදයකින් තොරව ගෙන්වා ගැනීමට කටයුතු කළයුතු වීම. | එකඟ වෙමි.<br>ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා නියමිත කාලවකවානුව තුළදී ඉදිරිපත් කරන ලෙස ලිඛිතව අඛණ්ඩවම මෙම ආයතන දැනුවත් කර ඇතත්, ඒ සම්බන්ධව එම ආයතන විසින් නිසි පියවර ගෙන නොමැත. | **2022 මාර්තු 23 දින වන විටත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වාත්, ජනතා වතු සංවර්ධන මණ්ඩලය 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වාත්, ශ්‍රී ලංකා අපනයන රක්ෂණ සංස්ථාව 2019 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වාත්, වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.** |
| (ආ) | මුදල් අමාත්‍යාංශයේ 2019 වාර්ෂික වාර්තාවට අනුව 2016, 2017 හා 2018 වර්ෂ සලකා බැලීමේදී රාජ්‍ය ව්‍යාපාර 52 කින් පිළිවෙලින් ආයතන 9 ක්, 20 ක් හා 37 ක් වශයෙන් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාරවල වාර්ෂික වාර්තා ප්‍රමාදයකින් තොරව ගෙන්වා ගැනීමට කටයුතු කළයුතු වීම. | එකඟ වෙමි.<br>සටහන් කර ගතිමි.වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳව තවදුරටත් අධීක්ෂණ කටයුතු පුළුල් කිරීම සම්බන්ධයෙන් සටහන් කරගත් අතර,ඒ පිළිබඳව අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. | 2022 මාර්තු 16 දින වන විට රාජ්‍ය ආයතන 11 ක 2020 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඇ)** | 2020 වර්ෂය සඳහා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.30,961,000,000 වූ අතර තථ්‍ය ආදායම රු.14,768,452,766 ක් වීම හේතුවෙන් එය සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 48 ක් වී තිබුණි. | නිවැරදි ලෙස ආදායම් ඇස්තමේන්තු කළ යුතු වීම. | 2020 වර්ෂයේ ඇතිවූ කොවිඩ් වසංගතය නිසා රාජ්‍ය ව්‍යවසායන්හි ලාභ හා ලාභාංශ අඩුවීම සිදුවී ඇත. | 2021 වර්ෂයේදී තථ්‍ය ආදායම ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 55.61 ක් වී තිබුණි. |
| (ඈ) | ආයතන 7 කට අදාලව සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට සාපේක්ෂව තථ්‍ය ආදායමේ අඩුවීම සියයට 33 ක සිට සියයට 84 ක් දක්වා පරාසයක පැවතුණි. | නිවැරදි ලෙස ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවිම | සියලුම රාජ්‍ය ව්‍යාපාරවලින් රජයේ ලාභ හා ලාභාංශ අයකරනු නොලැබේ. | 2021 වර්ෂයේදීද ආදායම් ඇස්තමේන්තුවට සාපේකෂව තථ්‍ය ආදායම අඩු වී තිබුණි. |
| (ඉ) | ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය හා ජාතික ලොතරැයි මණ්ඩලය යන ආයතන 03 න් පසුගිය වර්ෂ 03 කට අධික කාලයක සිට ලාභ ආදායමට කිසිඳු දායකත්වයක් ලබාදී නොතිබුණි. | නිවැරදි ලෙස ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවිම | 2020 වර්ෂයේ ඇතිවූ කොවිඩ් වසංගතය නිසා රාජ්‍ය ව්‍යවසායන්හි ලාභ හා ලාභාංශ අඩුවීම සිදුවී ඇත. | ජාතික ලොතරැයි මණ්ඩලය විසින් 2021 වර්ෂයේදී ලාභ දායකත්වය ලෙස රු.මිලියන 900 ක් මහා භාණ්ඩාගාරයට ලබාදී ඇත. |
| (ඊ) | 2020 වර්ෂය තුළ 2301 - හිමිකම් දායක මුදල් වැය විෂයය යටතේ ලබාදී තිබූ සමාගම් 02 ක් සඳහා වූ ආරම්භක ප්‍රාග්ධනයට අදාළ රු.40,000,000 ක් වූ චෙක්පත් පහත සඳහන් සමාගම් සංස්ථාපනය කළද, මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොමැති වීම හේතුවෙන් 2021 ජුනි 16 වන තෙක් අදාළ පාර්ශවය වෙත භාරදී නොතිබුණි. | කාර්යක්ෂමව හා ඵලදායීව ආයෝජනය සිදු කළයුතු වීම. | චෙක්පත් භාරදීම 2021.06.17 දින සිදු කර ඇත. | 2021 නොවැම්බර් 30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මෙම චෙක්පත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස දක්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | (i) Center for Excellence Robotics Applications (pvt) Ltd.<br>(ii) Sahasya Investments Ltd. | | | |
| (උ) | සමාලෝචිත වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලයට අතිරේක ප්‍රාග්ධනයක් ලෙස රු.48,000,000,000 ක් ලබාදී තිබුණද ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම පිළිබඳව දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි. | ඒකාබද්ධ අරමුදලින් වියදම් කිරීම සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගත යුතු වීම. | ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල මඟින් කරන ලද අතිරේක ප්‍රාග්ධන සම්පාදනයකි. | අතිරේක ප්‍රාග්ධන සම්පාදනය සඳහා ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු මුදලකින් ගෙවීම සිදු කර ඇති බැවින් ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය 2022 මාර්තු 23 දින වන විටත් ලබා ගෙන නොතිබුණි. |
| (ඌ) | දෙපාර්තමේන්තුව විසින් රජය සතු ව්‍යාපාර වෙත සිදුකරන ලද ප්‍රාග්ධන දායකත්වය, අදාල ආයතන විසින් නිවැරදිව ගිණුම් ගත කර නොමැති බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා දෙපාර්තමේන්තුව විධිමත් මඟපෙන්වීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය නොවීය. | විධිමත් මඟපෙන්වීම් යටතේ ප්‍රාග්ධන දායකත්වය ගිණුම් ගත වන බව තහවුරු කරගැනීමේ ක්‍රමවේදයක් සකස් කළයුතු වීම. | ප්‍රාග්ධන දායකත්වයන් ලබාදෙන අවස්ථාවේ එම මුදල් අතිරේක ප්‍රාග්ධනයක් ලෙස සලකා ගිණුම්ගත කිරීමට ලිඛිතව දැනුම් දී ඇත. | 2022 මාර්තු 23 දින වන විටත් එසේ ගිණුම්ගත නොකළ ආයතන සම්බන්ධයෙන් පසුවිපරම් කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් වී නොතිබුණි. |
| (එ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරමින් පැවති ව්‍යාපාර 118 කින් ආයතන 18 ක මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් වි නොතිබුණි. ඉන් සමහර ආයතනවල මූල්‍ය ප්‍රකාශන වර්ෂ කිහිපයක සිට ඉදිරිපත් වි නොතිබුණි. | අදාල ආයතනවලින් නියමිත කාලවකවානු තුළ මූල්‍ය ප්‍රකාශන ලබා ගැනිමට කටයුතු කළ යුතු වීම. | පිළිතුර ඉදිරිපත් කර නොමැත. | 2022 මාර්තු 23 දින වන විටත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ආයතන ඒවා ඉදිරිපත් කර ඇති බව සනාථ කෙරෙන තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | 2019 වර්ෂයෙහි රාජ්‍ය වාණිජ ව්‍යවසායන්හි ලාභ ආදායම හා ලාභාංශ ආදායම පිළිවෙලින් රු. මිලියන 22,833 ක් හා රු. මිලියන 5,024 ක් වූ අතර 2020 වර්ෂයේ එය පිළිවෙලින් රු. මිලියන 14,708 ක් සහ රු. මිලියන 2,855 දක්වා සියයට 36 කින් හා 44 කින් පහළ බැස තිබුණි. 2020 මූල්‍ය ප්‍රකාශනවල ආදායම් සංකේත 20:02:03 (ලාභ) යටතේ ආයතන 33 ක විස්තර ඇතුළත්ව තිබූ අතර ආදායම් සංකේත 20:02:04 (ලාභාංශ) යටතේ ආයතන 43 ක් දක්වා තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, රජයේ වාණිජ වෙළඳ ව්‍යාපාර සංඛ්‍යාව 206 කි. මේ අනුව රාජ්‍ය ව්‍යාපාර 150 කට අධික සංඛ්‍යාවක ආදායම/ ලාභය/ අලාභය සැලකිල්ලට ගෙන නොතිබුණු අතර ඊට හේතු ඉදිරිපත් නොවීය. | නිවැරදි හා යාවත්කාලීන දත්ත හා නිවැරදි තොරතුරු පවත්වාගත යුතුවීම හා ඒ මත අවශ්‍ය අධීක්ෂණය සිදුකළ යුතුවීම. | කොවිඩ් වසංගතය හේතුවෙන් රාජ්‍ය ව්‍යවසායන්හි ලාභ හා ලාභාංශ අඩුවීමට හේතු වී ඇත. සියලුම රාජ්‍ය ව්‍යාපාරවල ලාභ හා ලාභාංශ අයකරනු නොලබන අතර ලාභාංශ තීරණය කරනු ලබන්නේ අදාළ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. | 2022 මාර්තු 23 දින වන විටත් සියළු ආයතනවලින් මූල්‍ය ප්‍රගතිය දැක්වෙන් දත්තයන් ලබා ගෙන නොතිබුණි. |

## 3.11 ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ විශ්වවිද්‍යාලවල අධ්‍යයන, අනධ්‍යයන හා අධ්‍යයන සහය සේවා සඳහා බඳවා ගැනීමේ පටිපාටි අනුමත කිරීම ඇතුළත් වී තිබුණද, 2019 මැයි මාසය වන විටත් ඒවා අනුමත කර නොතිබුණි. | අදාළ බඳවා ගැනීමේ පටිපාටි අනුමත කිරීම කළ යුතු වීම | ඒ සම්බන්ධයෙන් අධ්‍යයන කර අනුමත කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | 2022 මාර්තු 23 දින වන විටත් විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර නොතිබුණි. |
| (ආ) | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල අනුමත කිරීමට අදාල නිර්ණායක සකස් කර නොතිබුණි. | කාර්ය මණ්ඩල අනුමත කිරීමට අදාළව සකස් කරනු ලබන නිර්ණායක විධිමත් පරිදි ගොනුගත කර පවත්වා ගත යුතු වීම. | අමාත්‍ය මණ්ඩලය විසින් විටින් විට ගනු ලබන ප්‍රතිපත්තිමය කරුණු මත නිර්ණායක නිරන්තරයෙන් සංශෝධනය කිරීමට සිදුවීම නිසා නිර්ණායක ප්‍රමාදයකින් තොරව සකස් කිරීමට නොහැකිවී ඇත. | 2022 මාර්තු 23 දින වන විටත් සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල අනුමත කිරීමේ නිර්නායක පිලියෙල කර නොතිබුණි |
| (ඇ) | තිරසර සංවර්ධන අරමුණු හා ඒ යටතේ වූ දර්ශක ප්‍රධාන කර ගනිමින් අරමුණු හා දර්ශක හඳුනාගැනීමේ හා ලඟා කර ගැනීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කළ යුතු වුවද, 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේද අදාළ තිරසර | තිරසර සංවර්ධන අරමුණු හා ඒ යටතේ වූ දර්ශක ප්‍රධාන කරගනිමින් අරමුණු හා දර්ශක හඳුනාගැනීම හා ලගා කර ගැනීම කෙරේ අවධානය යොමු කළ යුතුය. | එම අරමුණු හා දර්ශක සෘජු ලෙස දෙපාර්තමේන්තුවේ කාර්යභාරයට අදාළ නොවන බව නිරීක්ෂණය කරන අතර ආයතනවල අදාළ අංශයන්හි වැඩසටහන් යටතේ මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාර්ය තීරණය වන | 2022 මාර්තු 23 දින වන විටත් හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඒ සඳහා වන කාර්යසාධක දර්ශක අනුව කාර්යසාධනය මිණුම් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කිරීමට සැලසුම් සකස් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | | බවත්, එම ආයතන වැඩසටහන් ප්‍රකාශයට පත්කර දෙපාර්තමේන්තුවට යොමුකිරීමෙන් පසු ඒ සඳහා වන වැඩ සැලැස්ම සකස් කර කාර්යභාරය වෙත ඇතුළත් කරගනිමින් කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා මානව සම්පත් තොරතුරු ප්‍රසිද්ධ කිරීම හා 2020 වර්ෂයේ රාජ්‍ය සේවා මානව සම්පත් සම්බන්ධ තොරතුරු ඇතුළත් කරමින්, දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන යාවත්කාලීන කර නොතිබුණි. | කාර්යභාරයන් යම් නියමිත කාලවකවාණුව තුල සම්පූර්ණ කලයුතු වීමේ අවශ්‍යතාවය | කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවලින් තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතාවය මතුවීම හේතුවෙන් අදාළ ප්‍රකාශ යාවත්කාලීන කිරීමට නොහැකි විය. | 2022 මාර්තු 23 දින වන විටත් දෙපාර්තමේන්තු ප්‍රකාශන යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඉ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු වී පවතින මානව සම්පත් කළමණාකරන විශේෂඥ තනතුර, වැඩ අධ්‍යයන විශේෂඥ තනතුර හා නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ තනතුරු 02ක්, 2019 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවත එන අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු, ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 40 ක ප්‍රතිශතයක් වී තිබුණි. | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම. | නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ තනතුරුවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී ඇතත් මෙතෙක් නිලධාරීන් ලබාදීමක් සිදුවී නොමැත. | 2022 මාර්තු 23 දින වන විටත් පුරප්පාඩු පිරවීමට නොහැකි වී තිබුණි. |

### 3.12 ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා වැය විෂයය 21 ක් වෙනුවෙන් රු.15,988,107,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් එකතුව රු.11,995,799,491 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 28 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි | සලසාගත් ප්‍රතිපාදන උපරිමව උපයෝජනය කිරීම කළ යුතු විම. | මින් රු. මිලියන 8,455ක් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොළී සහනාධාර ගෙවීම සඳහා වෙන් වූ ප්‍රතිපාදන වලට අක්මුදල් නොලැබීම මත මෙම ඉතිරිවීම් සිදු වී ඇති බවත්, රු. මි.3,541ක් අනෙකුත් සහනාධාර ගෙවීම් සඳහා වූ අතර එය පවතින ඉල්ලුම මත තීරණය වී ඇති බවත්, බැංකු සමඟ එළඹී ඇති ගිවිසුම් ප්‍රකාරව වර්ෂයේ අවසාන කාර්තුවට අදාළව බැංකුව විසින් අප වෙත ලබාදෙන සහනාධාර ඉල්ලීම් සඳහා ගෙවනු ලබන්නේ ඊළඟ වර්ෂයේ මුල් කාර්තුව තුළ දී බවත්, ඉතිරි ප්‍රතිපාදන 2019 වර්ෂයේ බැඳීම් වෙනුවෙන් වෙන්කර ඇති බවත් දන්වා එවා තිබුණි. | 2021 වර්ෂය සඳහා වැය විෂයයන් 22 ක් සඳහා එකතුව රු.2,072,060,400 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.972,111,854 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව වර්ෂය අවසාන වන විට එකතුව රු.1,099,948,546 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 7 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. |
| (ආ) | 2015 අයවැය යෝජනාවක් අනුව 2017 වර්ෂයේ සිට බලපත්‍රලාභී වාණිජ බැංකු හා | සලසා තිබුණු ප්‍රතිපාදන අදාල කාර්යයට විධිමත්ව | ගෙවිය යුතු මෙම මුදල සඳහා 2020 දෙසැම්බර් 15 දින රු.59,605,490,495 ක් | 2021 වර්ෂය වෙනුවෙන් රු.31,365,500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, |

| | | | | |
|---|---|---|---|---|
| | විශේෂ බලපත්‍රලාභී බැංකු වල රු.මිලියන 1.5 ක් හෝ ඊට අඩුවෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතු සඳහා සියයට 15 ක වාර්ෂික පොලී ප්‍රතිශතයක් ගෙවනු ලබයි. සාමාන්‍ය පොලී අනුපාතය හා ගෙවනු ලබන සියයට 15 ක පොලී අනුපාතය අතර වෙනසට අදාල මුදල් මහා භාණ්ඩාගාරය විසින් අදාල බැංකු වලට ප්‍රතිපූර්ණය කිරීම සිදුකරනු ලබයි. 2019 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය බැංකු 7 කට හා පෞද්ගලික බැංකු 22 කට අදාලව ගෙවිය යුතු මුළු පොලී සහනාධාර මුදල රු.50,038,492,608 ක් විය. 2019 වර්ෂයේ මෙම ගෙවීම් කිරීම සඳහා රු.9,697,360,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, වර්ෂය අවසන් වන විට ඉන් රු.1,242,324,885 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව වර්ෂය අවසාන වන විට රු.8,455,035,115 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | උපයෝජනයන් සිදු කල යුතු විම. | භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කළ අතර ඉතිරි මුදල වන රු.2,262,927,825 ක් පියවීම 2020 දෙසැම්බර් 18 දින සිදු කරන ලද අතර ඒ අනුව 2020 දෙසැම්බර් 18 දින වන විට ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතු වෙනුවෙන් වාණිජ බැංකු සඳහා 2020 දෙවන කාර්තුව (2020 ජුනි 30) වන විට ගෙවිය යුතු පොලී සහනාධාරය සම්පූර්ණයෙන්ම වාණිජ බැංකු වෙත ගෙවා නිමකර ඇති බව දන්වා එවා තිබුණි. | ඉන් රු.31,356,447,996 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.9,052,003 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දින වනවිට අනුමත සේවක සංඛ්‍යාවෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක් පුරප්පාඩු පැවතුණි. | මේ අයුරින් කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් එම පුරප්පාඩුව පිරවීමට | ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ පත්වීම් බලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුප්‍රාප්තිකයන් ලබානොදී මෙම දෙපාර්තමේන්තුවෙන් | 2021 දෙසැම්බර් 31 දින වන විටත් විධායක මට්ටමේ තනතුරු 09 ක් පුරප්පාඩුව පැවැතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | හෝ එසේ නොවන්නේ නම් එම කාර්යමණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | පිටතට ස්ථානමාරු කර ඇත. කෙසේ වෙතත් පවතින පුරප්පාඩු පිළිබඳව කාර්තුමය වශයෙන් රාජ්‍ය සේවා පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම්දීම සිදුකර ඇත.<br>පුරප්පාඩු පුරවන තෙක් දැනට සිටින නිලධාරීන් හැකි උපරිමයෙන් කාර්යාල කටයුතුවලට දායක වූ නිසාත් කාර්යමණ්ඩල පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට අහිතකර අයුරින් බල නොපාන ලෙස කටයුතු කිරීමට හැකි විය.<br>අදාළ අංශ නැවත වරක් දැනුවත් කර ඉක්මනින් මෙම පුරප්පාඩු පුරවා ගැනීමට සටහන් කර ගනිමි. | |

### 3.13 ශීර්ෂය 244 - වෙළඳ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අනුව රේගු ආඥා පනතේ 19 (අ) වගන්තිවල සඳහන් විධිවිධානයන්ට හා රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව තීරු බදු කපාහැරීම්, අත්හැරීම් හා තීරුබදු සහන ලබාදීම්වලට අදාල කටයුතු වෙළඳ හා ආයෝජන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන බවට අනාවරණය වූ නමුත් එම කටයුතුවලට අදාල 2019 වර්ෂයේ ගැසට් පත්‍රය විගණිත දිනය වූ 2020 ඔක්තෝබර් 05 දින වන විටත් සහාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ විධිවිධානයන්ට හා රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව තීරු බදු කපාහැරීම්, අත්හැරීම් හා තීරුබදු සහන ලබා දීමට අදාලව ගැසට් පත්‍රය පලකිරීම් සිදු කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. | නිරීක්ෂණ සමඟ එකඟ වන බවත් රට තුළ පවතින කොරෝනා වසංගත තත්ත්වය නිසා සැලසුම් කළ පරිදි නියමිත දිනට පල කිරීමට නොහැකි වූ බවත් 2020 දෙසැම්බර් අවසන්වීමට පෙර සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වා එවා තිබුණි. | 2021 වර්ෂයට අදාල තොරතුරු ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙතින් ලබාගෙන තිබුණත්, 2022 මාර්තු 23 දින වන විටත් ගැසට් පත්‍රයේ පල කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා රජය විසින් අත්සන් කර වර්තමානයේ ක්‍රියාත්මක තත්ත්වයේ පවතින BIMSTEC හා SAFTA යන ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් 02 කට අදාලව මූල්‍යමය හෝ භෞතික ප්‍රගතියක් ලඟාකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | වෙළඳ ගිවිසුම් මඟින් මූල්‍යමය හා භෞතික ප්‍රගතීන් ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම | SAFTA සහ BIMSTEC ගිවිසුම්වලට අදාළව 2020 වසර සඳහා සැලසුම් කර තිබූ වැඩසටහන් කීපයක් කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කල් තැබීමට සිදුවූ බව දන්වා ඇත. | BIMSTEC බහුපාර්ශ්වීය ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම සාකච්ඡා මට්ටමේ පවතින ගිවිසුමක් වන අතර ඒ සඳහා 2022 මාර්තු 23 දින වන විටත් ශ්‍රී ලංකාව ද ඇතුළුව සාමාජික රටවල් අත්සන් තබා නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුව තුළ අනුමත තනතුරු 62 ක් පවතින අතර තථ්‍ය කාර්යමණ්ඩලය අනුයුක්ත කර ඇත්තේ තනතුරු 53 ක් සඳහා පමණක් වන අතර, තනතුරු 09 ක පුරප්පාඩු පවතින අතර එය අනුමත කාර්යමණ්ඩලයේ සියයට 15 ක ප්‍රතිශතයක් විය. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 01 ක් පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම | මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන මෙන් මුදල් අමාත්‍යාංශයෙන් අවස්ථා කිහිපයකදී ඉල්ලීම් කර ඇත. ප්‍රාථමික ද්විතීයික හා තෘතීයික මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීමට විටින් විට කටයුතු කළද රේගු දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් අංශ වෙත සිදුකල අභ්‍යන්තර ස්ථානමාරු කිරීම් නිසා නැවත පුරප්පාඩු ඇති විය. | 2021 වර්ෂය අවසන් වන විට අනුමත කාර්ය මණ්ඩලය 64 ක් වී තිබුණත්, තථ්‍ය කාර්ය මණ්ඩලය 48 ක් වී තිබුණි. ඒ අනුව පුරප්පාඩු 16 ක් පැවතුණි. |

## 3.14 ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2017 මාර්තු 31 දින ඉදිරිපත් කළ ව්‍යවස්ථාපිත, ව්‍යවස්ථාපිත නොවන අරමුදල් හා භාර අරමුදල් සමාලෝචන වාර්තාව හා ඊට අදාලව දෙපාර්තමේන්තුව නිකුත් කළ 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අරමුදල් 13 ක් වසා දැමීමට නිර්දේශ කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. 2020 සැප්තැම්බර් 22 දින වන විට අරමුදල් 05 ක් පමණක් වසා දැමීමට පියවර ගෙන තිබුණු අතර අරමුදල් 08 ක් වසා දැමීමට කටයුතු සිදුකෙරෙමින් පැවැතුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව කටයුතු කළ යුතුවීම. | අරමුදල් 9 ක් වසා ඉතිරි අරමුදල් වසාදැමීමට කටයුතු කරමින් පවතින බව | ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 10 ක් ඇවර කළ බව දෙපාර්තමේන්තුව විගණනය වෙත දන්වා එවා තිබුණත්, එම අරමුදල් වෙනුවෙන් ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන 2022 මාර්තු 23 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කළ බවට තොරතුරු දෙපාර්තමේන්තුවේ නොතිබුණි. |
| (ආ) | 2015 අයවැය යෝජනාවක් මත ආරම්භ කෙරුණු රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත කෙටුම්පත් කිරීම වසර ගණනාවක සිට නව මුහුණුවරකින් හා රජයේ | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුවීම. | දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ප්‍රධානීන්ගේ රැස්වීමේදී භාණ්ඩාගාර ලේකම්ගෙන් ලද උපදෙස් අනුව මෙම කටයුත්ත තාවකාලිකව අත්හිටුවන | 2022 මාර්තු 23 දින වන විටත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත සම්මත කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල් වැය කරමින් ආරම්භ කළද, එය 2019 වසර අවසාන වනතුරු නිම කර නොමැති බව නිරීක්ෂණය විය. | | බවත් රාජ්‍ය මූල්‍ය සම්බන්ධව සකස් කරන ලද සියළුම චක්‍රලේඛ අවලංගු කර එම කරුණු සංග්‍රහිත කරමින් හා මුදල් රෙගුලාසි සඳහා අවශ්‍ය කාලීන සංශෝධනයන්ද කරමින් 9/2020 හා 02/2020 චක්‍රලේඛ නිකුත් කරන ලද බවත් දන්වා ඇත. | |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව වූ තනතුරු 78 ක් තනතුරු 12 ක පුරප්පාඩුව පැවතීම නිසා එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 15 ක් වී තිබුණු අතර, මෙම පුරප්පාඩු තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂක/සහකාර අධ්‍යක්ෂ යනාදී තනතුරු 11 ක් ද පැවතුණි. | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම | මුදල් අමාත්‍යාංශය මගින් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සම්බන්ධව 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කළ නව සංවිධාන ව්‍යුහයට අදාල කාර්යමණ්ඩල සම්බන්ධ ස්ථාන මාරුවීම් ක්‍රියාවලිය සම්පූර්ණ වූ පසුව මෙම ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත. | 2022 පෙබරවාරි 07 දින වන විට මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සංඛ්‍යාව 79 ක් වන අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 65 ක් වේ. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සංඛ්‍යාව 07 ක් පැවැතුණි. |

### 3.15 ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දින වන විට 2017 හා ඊට පෙර වර්ෂයන්ට අදාල මුළු හිඟ ආදායම රු.5,361,931,137 ක් වූ අතර එය | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. ඉන් 2021මාර්තු 31 දිනට රු.මිලියන 3,215 ක් අයකරගෙන ඇත. | 2021 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 3,227 ක් අයකරගෙන ඇත. |
| (ආ) | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 4 වන ඡේදය ප්‍රකාරව හිඟ මුදල් අයකර ගත යුතු බව දක්වා තිබුණද, 2020 දෙසැම්බර් 31 දිනට පැවැති රු.9,896,017,350 ක මුළු හිඟ හිටි ආදායමෙන් සියයට 89 ක් පූර්ව වර්ෂයන්ට අදාල හිඟ හිටි ආදායම වී තිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2021.03.31 දිනට පූර්ව වර්ෂයන්ට අදාළව රු. මිලියන 6,480 ක් නිරවුල් කර ඇත. | 2021 දෙසැම්බර් 31 දින වන විට පූර්ව වර්ෂයන්ට අදාළව රු.මිලියන 6,493 ක් නිරවුල් කර ඇත. |
| (ඇ) | 2017 හා ඊට පෙර වර්ෂයන්ට අදාල හිඟ හිටි ආදායම සම්බන්ධ සිදුකළ පරීක්ෂාවේදී ගිවිසුම් ප්‍රකාරව ණය පොළී හා ණය වාරික නොගෙවීම මත ආයතන 5 කට අදාලව රු.5,361,288,685 ක හිඟ හිටි ආදායමක් අයකර ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතින බව දන්වා තිබුණි. මෙම හිඟ හිටි ණය මුදල සමස්ථ හිඟ හිටි ආදායමින් සියයට 54 ක් වී තිබුණි. | හිඟ හිටි ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මින් එක් ආයතනයක ණය මුදල හා පොළිය අත්හැර දැමීම සඳහා කටයුතු කරමින් පවතින අතර තවත් ආයතනයකට අදාළව නීති කටයුතු සිදුකරමින් පවතී. තවත් ආයතනයක පොළී අත්හැරීම සඳහා අනුමැතිය ලැබී ඇති අතර අනෙක් ආයතන 02 හි ණය මුදල ප්‍රාග්ධනිත කිරීමට හා ණය මුදල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත. | මිල්කො ආයතනය 2020 දෙසැම්බර් 31 දිනට පවතින හිඟ උප ණය ශේෂය ප්‍රාග්ධනිත කිරීමටත් පොලී මුදල් අත්හැර දැමීමටත් කටයුතු කර ඇත.<br>ලංකා ධීවර සංස්ථාව හිඟ ණය මුදල කපා හැර ඇති අතර පොලී මුදල් අත්හැර දැමීමටත් කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සර්වෝදය ආයතනය 2021 වර්ෂය තුල රු.මිලියන 13 ක් පියවා ගැනීමට කටයුතු කර ඇත.<br>සණස ආයතනය හිඟ ණය මුදල ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරමින් පවතින අතර නොහැකි නම් නීතිමය ක්‍රියාමාර්ග මගින් අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| (ඈ) | ආදායම් සංකේතය 20.02.01.99 යටතේ රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - අනෙකුත් කුලීවලට අදාල හිඟ හිටි ආදායම 2019 දෙසැම්බර් 31 දිනට රු.147,356 ක් වී තිබුණු අතර එය 2020 මාර්තු 31 දින වනවිට රු.1,134,484 කින් හෙවත් සියයට 670 කින් ඉහළ ගොස් තිබූ බව නිරීක්ෂණය විය. | හිඟමුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | හිඟ මුදලින් කොටසක් මේ වනවිට අයකර ගෙන ඇත. | 2021 දෙසැම්බර් 31 දින වන විට හිඟ ආදායමෙන් රු.450,000 ක් පමණක් අයකර ගැනීමට තිබුණි. |
| (ඉ) | 30.01.01.00 දරන විදේශ ප්‍රදාන ආදායම් සංකේතයට අදාලව 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන විදේශාධාර ගිණුම් තැබීමට අදාළ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ ආධාර සම්බන්ධ සියළු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කළ යුතුව තිබුණි. නියැදි පරීක්ෂාවක් | විදේශ ආධාර ලබාගැනීමේ හා ගිණුම් තැබීමේ ක්‍රියාවලිය විධිමත් කළ යුතු වීම හා නියාමනය ශක්තිමත් කර චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම පිළිබඳව දැඩි පියවර ගැනීම. | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව සියළු විදේශ ආධාර ප්‍රදාන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හරහා ලබාගැනීම සිදු කළ යුතුවේ. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් එසේ ලැබී තිබුණු විදේශ ප්‍රදාන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මත ලබාගත් තොරතුරු අනුව, 2018 වර්සයේ සිට 2020 වර්ෂය අවසාන වන විට මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව රු. මිලියන 3,292 ක විදේශ ප්‍රදාන සෘජුවම අදාළ ආයතන විසින් ලබාගෙන තිබුණි. මෙම ප්‍රදානයන් පිළිබඳ තොරතුරු මහා භාණ්ඩාගාරයේ වාර්තාවල ඇතුළත් වී නොතිබුණු අතරම ප්‍රතිපාදන සලසාගෙන මෙම ප්‍රදාන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම මෙවැනි ප්‍රදාන වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත ලැබී තිබේද යන වග තහවුරු කර ගැනීමේ ඵලදායී කාර්යක්ෂම ක්‍රමවේදයක් මහා භාණ්ඩාගාරය සතුව නොමැති බව නිරීක්ෂණය විය. | | | |
| (ඊ) | 2020 ජනවාරි 01 දිනට විශේෂ ප්‍රදාන ලෙස ලැබී ඇති නමුත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අදාල අරමුණට නොයොදවා අක්‍රීයව පැවති විදේශ ප්‍රදාන වටිනාකම රු.79,716,465 ක් විය. | ප්‍රදායකයින්ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාල අරමුණුවලට යෙදවීම පිළිබඳව සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කිරීම. | නියමිත කාර්යයන් සඳහා විදේශ ආධාර ප්‍රදාන උපයෝජනය නොකිරීමේ වගකීම අදාළ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ ගණන්දීමේ නිලධාරීන් සතුවේ. | 2022 මාර්තු 23 දින වන විටත් එම අක්‍රියව පැවැති විදේශ ප්‍රදාන උපයෝජනය කළ බව තහවුරු කිරීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගනුදෙනු සිදු නොවන තැන්පත් ගිණුම් 19 ක එකතුව | පොත්පත් වාර්තා යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. | මෙහි සඳහන් තැන්පතු ගිණුම් 19 න් 02 ක් තවදුරටත් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. තවත් ගිණුමක පවතින ශේෂය | 2022 මාර්තු 23 දින වන විටත් උපයෝජනය නොකළ තැන්පත් ශේෂ රාජ්‍ය ආදායමට බැර |

| | | | | |
|---|---|---|---|---|
| | රු.79,716,727 ක ශේසයක් පැවැතුණි.. මෙම තැන්පත් ගිණුම් විදේශ ප්‍රදාන ලැබීම් වලට අදාල වන අතර මෙසේ තැන්පතු අක්‍රීයව පැවතීම හේතුවෙන් එම ප්‍රදාන අදාල අරමුණට යෙදවීමේ අවස්ථාවන් අහිමි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබූ රු.5,306,026 ක් රාජ්‍ය ආදායමට බැර කිරීම හා රු.9,655,159 ක් අදාල අරමුණට නොයොදවා ප්‍රදායක වෙත ආපසු හරවා යැවීම සිදු කර තිබුණි. | | උපයෝජනය කරන ලෙස අඛණ්ඩවම අදාළ අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. අනෙකුත් ගිණුම් ශේෂ 2018 හා 2019 වර්ෂවල භාවිතා කළද 2020 වර්ෂයේදී භාවිතා කර නොමැත. ඒ පිළිබඳව නැවත වරක් දැනුම් දීමට කටයුතු කරන අතර එසේ නොවුණහොත් රජයේ ආදායමට බැර කිරීමට හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | කළ බව තහවුරු කෙරෙන සාක්ෂි විගනනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඌ) | 2021 මාර්තු මාසය අවසන් වනවිට ද, අංක 7002 හා 7003 දරන අග්‍රිම ගිණුම් 03 ක වර්ෂ ගණනාවක් මුළුල්ලේ පැවැත එන එකතුව රු.118,227,633 ක ශේෂ පැවැතුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | මෙම ගිණුම් 03 කින් එක් ශේෂයක් ධීවර සංස්ථාවේ පවතින දැඩි මූල්‍ය දුෂ්කරතා මත පියවීමට නොහැකි වී ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා ඇත. තවත් ශේෂයක් නිරවුල් කිරීම සඳහා විදේශ දූත මණ්ඩල වලින් තොරතුරු රැස්කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇති අතර අනෙක් ශේෂය පියවිය යුතු ආකාරය පිළිබඳ උපදෙස් දෙමින් අදාළ අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇත. | 2022 මාර්තු 23 දින වන විටත් එම අග්‍රිම ශේෂ නිරවුල් කර ඇති බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (එ) | ඉහත කී ගිණුම් තුළ පැවති 7002-0-0-035/13 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.91,530,099 ක් වූ අතර එය 2013 වර්ෂයට හා ඊට පෙර කාල පරිච්ඡේදයන්ට | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් සිදුකිරීම | 2013 වර්ෂයේ නොපියවූ අත්තිකාරම් පියවා ගැනීමට එක් එක් දූත මණ්ඩලවලින් විස්තර මේ වනවිට ලබාගෙන | 2022 මාර්තු 23 දින වන විටත් නිරවුල් නොකළ අග්‍රිම ශේෂ පැවැතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අදාළ නොපියවූ අත්තිකාරම් වලින් සකස් වී තිබුණි. එම අත්තිකාරම් වලින් රු.51,979,371 ක් විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබාදෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු 173 කින් සමන්විත වී තිබුණි. එම වටිනාකමින් රු. 4,285,061 ක් වර්ෂ 20 ඉක්මවා තිබුණු අතර රු.44,284,956 ක් වර්ෂ 10 ත් 20 ත් අතරද රු.3,409,354 ක් වූ අතර ඉතිරිය වර්ෂ 07 ඉක්මවා තිබුණි. | | නැවත අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.. | |
| (ඒ) | විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබාදෙන නිවාස ඇප / ආරක්ෂිත තැන්පතු 173 කින් තැන්පතු 165 කට අදාළ රු.47,954,750 ක් මේ වනවිට විදේශ දූත මණ්ඩල කාර්යය මණ්ඩලය විසින් භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිවෙස් සඳහා තබා ඇති තැන්පතු අයකර ගැනීම සඳහා අමාත්‍යාංශය පියවර ගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් ප්‍රගතිය 2021.09.30 දිනට වාර්තා කරනු ලැබේ. | 2022 මාර්තු 23 දින වන විටත් නිරවුල් නොකළ අග්‍රිම ශේෂ පැවතුණි. |
| (ඔ) | දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරම් රු.23,293,715 ක් තත්කාර්යය අතුරු අග්‍රිම වූ අතර, එම අත්තිකාරම් තුළ 2018 වර්ෂයට පෙර කාලයට අදාළ රු.9,168,655 ක් ද 2018 වර්ෂයට අදාළ රු. 813,741 ක් හා 2019 වර්ෂයට අදාළ රු. 3,912,255 ක් ද විය. ඒ අනුව මු.රෙ. 371 ප්‍රකාරව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ඉදිරියේදී තත්කාර්යය අතුරු අග්‍රිම අදාළ කාලය අවශ්‍ය වූ වහාම අයකර ගැනීමට අදාළ විදේශ දූත මණ්ඩල වෙත උපදෙස් ලබාදී ඇත. | 2022 මාර්තු 23 දින වන විටත් නිරවුල් නොකළ අග්‍රිම ශේෂ පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය නිමකළ වහාම පියවිය යුතු නමුත් එම රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | | |
| (ඕ) | 2020 වර්ෂය තුළ උපලබ්දි වූ විදේශ ණය ගිවිසුම් 19 කට අදාලව හා 2019 වර්ෂය තුළ හෝ ඊට පෙර උපලබ්ධි වූ 2019 වර්ෂය තුළ හෝ ඊට පෙර උපලබ්ධි වූ විදේශ ණය ගිවිසුම් 5 කට අදාලව එකතුව රු.මිලියන 6,124 ක් 2020 දෙසැම්බර් 31 දින වනවිටත්, විදේශ ණය ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම් ගතකිරීම විධිමත් කළයුතුවීම | අදාළ අමාත්‍යාංශ සතුව ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන නොමැති වීම හා 2020.12.31 දිනට ව්‍යාපෘති විසින් වියදම් සහතික නොකිරීම හේතුවෙන් මෙම ණය ගිණුම්ගත වී නොමැත. | 2021.12.31 දින වනවිට ගිණුම් ගත නොවූ විදේශ ණය පැවැතුණි. |
| (ක) | 2020 දෙසැම්බර් 31 දින වන විට බාහිර ආයතන වෙත අවස්ථා 230 යටතේ රු.මිලියන 1,340,612.19 ක බැංකු ඇපකර / සහන ලිපි නිකුත් කරන තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට කල් ඉකුත් වී තිබුණි. රු.මිලියන 880 ක වටිනාකමකින් යුත් භාණ්ඩාගාර ඇපකර වලට අදාලව කාලය දීර්ඝ කර නොතිබුණි. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරිමේ ක්‍රියාවලිය විධිමත් හා යාවත්කාලීනව පවත්වා ගතයුතුවීම. | මෙම සහන ලිපි නිකුත් කිරිම සඳහා නිර්දේශ කර තිබුණේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවෙන් වන අතර එම ලිපිවල කාලය දීර්ඝ කිරීම එම දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලද වහාම සිදුකරනු ලැබේ. | 2022 මාර්තු 23 දින වන විට කල් ඉකුත් වූ බැංකු ඇපකර/ සහන ලිපි වල කාලය දිර්ඝ කළ බව තහවුරු වන තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (කා) | 2016 ඔක්තෝබර් මාසයේ සිට මිහින් ලංකා සමාගමේ මෙහෙයුම් කටයුතු අවසන් වුවද, උක්ත සමාගම ඈවර කටයුතු ආරම්භ කරන ලද්දේ 2018 මාර්තු 09 වන දිනදීය. ඒ අනුව ඈවර කිරීමේ ක්‍රියාවලිය මාස 06 ක් තුළදී අවසන් කළ යුතු බවත් ඉන් | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරිමේ ක්‍රියාවලිය විධිමත් කිරීම. | මෙම සහන ලිපි නිකුත් කර ඇත්තේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශය මතවේ. | 2022 මාර්තු 23 දින වනව විටත් ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඔබ්බට දීර්ඝ කිරීම් සඳහා අනුමැතිය ලබා නොදිය යුතු බවත් අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 18/1001/810/005 යටතේ පෙන්වා දී තිබුණද මේ වන විටත් ඇවර කිරීමේ කටයුතු අවසන් කර තිබූ බවක් නිරීක්ෂණය නොවීය. | | | |
| (කැ) | මිහින් ලංකා සමාගම ලංකා බැංකුවෙන් ලබාගත් රු.මිලියන 1,650 ක ණය මුදලට අදාලව 2020 දෙසැම්බර් 31 දින, 2020 ඔක්තෝබර් 30 දිනට රු.831,400,000 ක් ගෙවා තිබුණු අතර, ණය මුදල වූ රු.මිලියන 1,650 ක් තවදුරටත් ගෙවිය යුතුව තිබුණි. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම. | මෙම සහන ලිපි නිකුත් කර ඇත්තේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශය මතවේ. | 2022 මාර්තු 23 දින වන විටත් ණය මුදල ගෙවා නොතිබුණි. |
| (කෑ) | විදේශ ආධාර ගිණුම් තැබීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද, නියැදි පරික්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, 2018 හා 2019 වර්ෂවල මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 24 ක් විසින් ව්‍යාපෘති 77 ක් සඳහා රු. මිලියන 2,026 ක විදේශ ප්‍රදාන ඍජුවම අදාළ ආයතන වෙත ලබාගෙන තිබුණු අතර මෙම ප්‍රදානයන් පිළිබඳ තොරතුරු මහා භාණ්ඩාගාරයේ වාර්තාවල ඇතුළත් වී නොතිබුණි. එසේම, වෙනත් අමාත්‍යාංශ/ | විදේශ ආධාර ලබා ගැනීමේ හා ගිණුම් තැබීමේ ක්‍රියාවලිය විධිමත් කළයුතු වීම සහ නියාමනය ශක්තිමත් කර චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම පිළිබඳව දැඩි පියවර ගැනීම | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 න් සංශෝධිත 2.0 ඡේදය ප්‍රකාරව හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ XI පරිච්ඡේදයෙහි වූ විධිවිධාන නොසළකා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනු දැනුමකින් තොරව ඍජුවම විදේශ ප්‍රදාන ලබාගන්නා රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස රේඛීය අමාත්‍යාංශය භාර ලේකම්වරුන් වෙත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2022 මාර්තු 23 දින වන විටත් වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත විදේශ ප්‍රදාන ලැබීම හුනා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තු වෙත මෙවැනි ප්‍රදාන ලැබී තිබේද යන වග තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් මහා භාණ්ඩාගාරය සතුව නොමැති බව නිරීක්ෂණය විය. | | (i) චක්‍රලේඛ විධිවිධාන නොසළකා ලබාගත් ඍජු විදේශ ප්‍රදාන වහාම විධිමත් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙස.<br>(ii) ඉදිරියේදී කිසිදු හේතුවක් නිසාවෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමකින් තොරව/ අනුමැතිය ලබාගැනීමකින් තොරව විදේශ ප්‍රදාන ලබාගැනීමට කටයුතු නොකළ යුතු බව. | |

## 3.16 ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබු වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2013 දෙසැම්බර් 04 දින සේවය අතහැර ගිය පර්යේෂණ සහකාර තනතුර දැරූ නිලධාරියෙකුගෙන් එදිනට අයවිය යුතු ණය ශේෂය රු. 132,846 ක් වී තිබුණි. එම නිලධාරියා සේවය හැර ගොස් වර්ෂ 07 ක කාලයක් ගත වී තිබුණත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් එම ශේෂය අයකර ගැනිමට අපොහොසත් වී තිබුණි. | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා හෝ නිරාකරණය සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | මෙම ශේෂය වන රු. 132,846 අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක 309/2018/DMR යටතේ නඩු පවරා ඇත. | 2022 මාර්තු 23 දින වන විටත් එම ණය ශේෂය අයකර ගැනිමට අපොහොසත් වී තිබුණි. |
| (ආ) | 2008 දෙසැම්බර් 17 දින මියගිය රාජ්‍ය කළමනාකරණ තනතුරක් දැරූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය රු.164,953 ක් වී තිබුණි. එම නිලධාරියා මිය ගොස් 2020 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 12 ක පමණ කාලයක් ගත වී තිබුණත්, එම ණය ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. . | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා හෝ නිරාකරණය සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | ණය මුදල ලබා ගන්නා අවස්ථාවේදී දේපළ ණය සුරැකුම් රක්ෂණාවරණය පැවති ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවත් පසුව එම ණය සුරැකුම් රක්ෂණය පැවති ජාතික රක්ෂණ භාර අරමුදලත් ආයතන ද්විත්වයම වගකීම ප්‍රතික්ෂේප කිරීම නිසා මිය ගිය නිළධාරියාගේ හිඟව පවතින ණය ශේෂය අයකර ගැනීම ප්‍රශ්ණගත වී තිබේ. | 2022 මාර්තු 23 දින වන විටත් එම ණය ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. |
| (ඇ) | 2020 ජනවාරි 01 දිනට රු.160,584,098 ක් වූ විවිධ අත්තිකාරම් ගිණුමේ හිඟ ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා | 2020 වර්ෂය තුළදී අදාල හිඟ ශේෂයෙන් අයවී ඇත්තේ රු.477,298.72 ක් වන බවත් එය හිඟ මුදලින් | 2021 දෙසැම්බර් 31 දිනට විවිධ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.142,510,261 ක් වී |

| | | | | |
|---|---|---|---|---|
| | විට රු.160,106,800 ක් වී තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට එම හිඟ ණය ශේෂයෙන් රු.477,299 හෙවත් සියයට 0.30 ක් පමණක් අයකර තිබුණි. | ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | සියයට 0.30 වන ලෙස දක්වා තිබීම නිවැරදි වේ. | තිබුණි. 2021 වර්ෂය තුළදී රු.17,596,538.42 ක් අයකර ගෙන තිබුණු අතර එය හිඟහිටි ණය ශේෂයෙන් සියයට 12.35 ක් වී තිබුණි. |
| (ඈ) | ඉදිරිපත් කර තිබූ විවිධ අත්තිකාරම් ගිණුමෙහි 2020 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 10 කට අදාළව සමස්ථ හිඟහිටි අත්තිකාරම් ශේෂය රු.160,106,800 ක් වි තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තු 9 ක හිඟහිටි අත්තිකාරම් ශේෂය රු.153,785,015 ක් වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එමින් තිබුණි. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | මහා භාණ්ඩාගාරය විසින් සෘජුව දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත වී මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලබා දී ඇති අතර එම දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අනෙකුත් ආයතන වෙත උප අත්තිකාරම් ලබාදීම සිදුකරන ලදී.<br><br>රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් මෙහිදී අතරමැදියෙකු වශයෙන් පමණක් ක්‍රියා කරනු ලබන අතර, මෙම අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කිරීමේදී, නීතිමය ක්‍රියාමාර්ග අවසන් නොවීම, අත්තිකාරම් අයකර ගැනීම සඳහා අවශ්‍ය වන ලිපි ගොනු අස්ථානගත වීම හෝ විනාශ වීම, ඇතැම් ආයතන වර්තමානය වන විට අහෝසි වී තිබීම, ආර්ථික | 2022 මාර්තු 23 දින වන විටත් එම හිඟහිටි අත්තිකාරම් ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අපහසුතා මත පවත්වාගෙන යාම යනාදී කරුණු හේතුවෙන් හිඟ ශේෂ අයකර ගැනීමට නොහැකි වීම යන ප්‍රායෝගික ගැටළුවලටද මුහුණ දීමට සිදුව ඇති බව දන්වනු කැමැත්තෙමි. | |
| (ඉ) | 2004/2005 වර්ෂවලදී වී මිලදී ගැනීම සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් විසින් ලග්ගල විවිධ සේවා සමූපකාර සමිතියට නිදහස් කළ මුදලින් ඉතිරි රු. 2,183,000 ක ශේෂය 2020 ඔක්තෝබර් මාසයේ සිට රු. 10,000 ක් වූ මාසික වාරික වලින් අයකිරීමට කටයුතු කර තිබුණි. එසේ අයකර ගැනීම සිදු වුවහොත් ඉහත කී හිඟ මුදල අයවීමට ඉදිරි වර්ෂ 18 පමණ කාලයක් ගත වන බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, 2020 වර්ෂයේදී ඉන් අයවී තිබුණේ රු.75,000 ක් හෙවත් සියයට 9 ක් පමණි. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම | ලග්ගල විවිධ සේවා සමූපකාර සමිතිය මේ වන විට ආර්ථික අපහසුතාවයන් මත පවත්වාගෙන යනු ලබන බව එම සමිතියේ සාමාන්‍යාධිකාරී විසින් දන්වා ඇති බව මාතලේ දිස්ත්‍රික් ලේකම් විසින් මා වෙත දන්වා ඇත.<br>එසේම, ලග්ගල විවිධ සේවා සමූපකාර සමිතියට ලබාදුන් අත්තිකාරම් මුදලින් සමිතියේ පාලනයෙන් පරිබාහිර හේතු මත සිදුව ඇති රු.1,464,642 ක අලාභ කපා හැරීම සඳහා මු.රෙ.109 අයදුම්පත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශ සඳහා ඉදිරිපත් කර ඇත. | 2021 වර්ෂයේදී හිඟහිටි ණය ශේෂයෙන් රු.100,000 ක් මුදලින් අයකර ගෙන තිබුණු අතර, රු.1,464,642 ක් කපා හැර තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට රු.543,358 ක ණය ශේෂයක් පැවැති අතර 2022 මාර්තු 23 දින වන විටත් එම හිඟහිටි ණය ශේෂය අයකර ගැනිමට අපොහොසත් වි තිබුණි. |
| (ඊ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත 2006 වර්ෂයේදී ලබාදී තිබුණු වී | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් ගොවිජන | 2021 වර්ෂයේදී වැරදි නිවැරදි කිරිම නිසා හිඟ හිටි ණය ශේෂය |

| | | | | |
|---|---|---|---|---|
| | මිලදීගැනීමේ අත්තිකාරම්වලින් 2014 වර්ෂයේ පැවති හිඟ ශේෂය වූ රු.12,560,031 කින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.1,793,880 පමණක් අය වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.10,766,155 ක් හිඟ හිටි ණය ශේෂයක් පැවැත නමුත්, සමාලෝචිත වර්ෂයේදී ඉන් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල වෙත අත්තිකාරම් ලබාදීම සිදුකර ඇති බවත් එම ආයතන වෙතින් මුදල් අයනොවීම හේතුවෙන් බොහෝ ආයතන වෙත නඩු පවරා ඇති බවත් එම නඩු අවසන් වන තෙක් මුදල් අයකර ගැනීමට නොහැකි බවත් අප වෙත දන්වා ඇත. | රු.1,786,614 කින් වැඩි වී තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ණය ශේෂය රු.12,552,764 ක් වී තිබුණි. එම ශේෂය 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනිමට අපොහොසත් වී තිබුණි. |
| (උ) | කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව 2008 වර්ෂයට පෙර සිට පැවත එන රු.349,475 ක ණය ශේෂය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව 2020 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම | රු. 349,477.50 ක මුදල නිරවුල් කරන ලෙස අදාල ආයතනය දැනුවත් කර ඇත. | 2022 මාර්තු 23 දින වන විටත් එම ණය ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. |
| (ඌ) | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ඇති අනුරාධපුර ශික්ෂණ රෝහලේ සේප්පුවේ තිබී 2019 මාර්තු 02 දින රු. 6,321,785 ක මුදලක් සොරාගෙන තිබූ අතර ඒ සඳහා විවිධ අත්තිකාරම් ගිණුමෙන් රු.6,321,785 ක අත්තිකාරම් නිකුත් කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විටත් එම හිඟ හිටි අත්තිකාරම් ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | මීට අදාල විධිමත් පරීක්ෂණය කඩිනමින් සිදුකර වගකිව යුතු අයගෙන් අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙසත් විමර්ශන ක්‍රියාවලියෙන් පසු මේ සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් අදාල ආයතනයට උපදෙස් ලබා දී ඇත. | 2022 මාර්තු 23 දින වන විටත් එම හිඟහිටි අත්තිකාරම් ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 වර්ෂයට අදාලව අයවිය යුතුව පැවති හිඟ මුදල රු. 38,097,815 කින් 2020 දෙසැම්බර් 31 දින වනවිට හිඟ ශේෂය රු. 34,033,861 ක් වි තිබුණි. 2020 වර්ෂය අවසානය වනවිට අයවීම් රු. 4,063,954 ක් හෙවත් සියයට 11 ක් විය. මේ අනුව හිඟ මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලියෙහි මන්දගාමී බවක් විගණනයට නිරීක්ෂණය විය. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අනුරාධපුර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය හා විවිධි සේවා සමූපකාර සමිති වෙතින් නිරවුල් කළයුතු මුදල පිළිවෙලින් රු.12,971,207 හා රු. 21,062,654 කි. නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙතින් හා විවිධ සේවා සමූපකාර සමිති වෙතින් හිඟ මුදල් අයකර ගත හැක්කේ අදාල නඩු තීන්දු ලැබීමෙන් පසුව බව දන්වමි. | 2021 වර්ෂයේදී රු.1,786,614 ක් වැරදි නිවැරදි කිරම නිසා හිඟහිටි ණය ශේෂයෙන් අඩු වී තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විටත් රු.32,247,248 ක හිඟහිටි ණය ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. |
| (ඒ) | පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ ශේෂය රු. 55,927,666 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂයේ සමස්ථ හිඟ මුදලින් සියයට 35 ක් ලෙස ඉහළම ප්‍රතිශතය වී තිබුණි. ඉන් 2018 වර්ෂයේදී වී අලෙවි මණ්ඩලයේ කුරුප්පු හන්දියේ සහල් මෝල පැවැත්වීමේ රු. 769,428 ක හා ආහාර කොමසාරිස් වෙත සහල් නිකුත් කිරීමේ රු.13,018,114 ක අලාභයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 109 හා 113 අනුව කටයුතු කර ස්වදේශ කටයුතු | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වී අලෙවි මණ්ඩලයේ වී මෝල පැවැත්වීමේ අලාභය වන රු.769,428.10 ක මුදල පොත්වලින් කපා හැරීම සඳහා අයදුම්පත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත යොමු කර ඇති අතර ආහාර කොමසාරිස් වෙත සහල් නිකුත් කිරීමේදී දැරීමට සිදුවූ රු.13,018,114.00 ක අලාභය කපා හැරීම සඳහා | 2021 වර්ෂයේදි එකතුව රු.13,787,542 ක් කපා හැර තිබුණි. ඒ අනුව රු.42,127,825 ක් 2022 මාර්තු 23 දින වන විටත් හිඟහිටව පැවැතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අමාත්‍යාංශයට යොමුකර ඇති බවත් දන්වා තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | අනුමැතිය ලබා ගැනීමට අදාළ තොරතුරු ඇතුළත් වාර්තාවක් පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් ලිඛිතව ඉල්ලුම් කර ඇත. | |
| (ඔ) | කොළඹ මහරෝහලේ දන්තායතනයේ 2002 ජනවාරි 22 දින සිදුවී තිබූ වැටුප් මංකොල්ලයට අදාලව අධ්‍යක්ෂ මහ රෝහල - කොළඹ වෙත ලබා දී තිබූ රු.2,408,460 ක අත්තිකාරම් ශේෂය, 2020 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගැනීමට හෝ අලාභ ලෙස පොතෙන් කපා හැරීමට කටයුතු කර නොතිබුණි . | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. | කොළඹ දන්තායතනයේ සිදුවූ වැටුප් මංකොල්ලයට අදාලව මාළිගාකන්ද උසාවියේ නඩු අංක බී/67/02 යටතේ නඩුවක් විභාගවන අතර, විනය නියෝග අනුව චූදිත නිලධාරියාගේ වැටුපෙන් අයකරන ලද 5% ක මුදල රාජ්‍ය ආදායමට බැර කර ඇති බැවින් එම මුදල ආපසු ගෙන මෙම අත්තිකාරම් ගිණුමට බැර කරන ලෙස උපදෙස් ලබාදී ඇත. | 2021 වර්ෂයේදී රු.120,423 ක් මුදලින් ලැබී තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට රු.2,288,037 ක ශේෂයක් හිඟහිටව පැවැතුණි. |
| (ඕ) | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 වර්ෂයේ සිට පැවත එන රු.1,652,917 ක හිඟ ශේෂය නිරවුල් කිරීමට සතොස ආයතනයට මූල්‍ය හැකියාවක් නොමැති බව දන්වා තිබුණි. එමෙන්ම අදාල ශේෂය කපා හැරීම සඳහා මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම | සතොස ආයතනය වෙතින් අයවිය යුතු මුදල් අවශ්‍ය ලියකියවිලි රැස්කරමින් පවතින බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත. | 2022 මාර්තු 23 දින වන විටත් හිඟහිටි ණය ශේෂය අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. |
| (ක) | අම්පාර දිස්ත්‍රික් ලෙක්ම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට හිඟ | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ | ගෙවීම් පැහැර ඇති ගොවිජන සංවර්ධන | 2021 වර්ෂයේදී රු.1,823,931 ක ණය |

| | | | | |
|---|---|---|---|---|
| | ශේෂය රු.45,499,095 ක් වූ අතර එය සමස්ත හිඟ මුදලින් සියයට 28 ක් විය. මෙම හිඟ ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව 2020 දෙසැම්බර් 31 දින වන විටත් අපොහොසත් වී තිබුණි. | ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම | මධ්‍යස්ථාන වෙත නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් නඩු කටයුතු හරහා අදාල මුදල් අයකර ගැනීමට බලාපොරොත්තු වන බවත් කාරුණිකව දන්වමි.<br>ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත නොපමාව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇති අතර ඊට අදාළ පසු විපරම් කිරීමට සටහන් කරගතිමි.<br>සතොස ආයතනය වෙතින් අයවිය යුතු මුදල් කපා හැරීම සඳහා අනුමැතිය ලැබී ඇති අතර අවශ්‍ය ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලුම් කර ඇත. | ශේෂ කපා හැර තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ණය ශේෂය රු.43,675,164 ක් වී තිබුණි. |
| (කා) | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 ජනවාරි 01 දිනට පැවති හිඟ ශේෂය වූ රු.1,441,687 කින් 2020 දෙසැම්බර් 31 වන විට අයවී තිබුණේ රු.390,000 ක් හෙවත් සියයට 27 ක් පමණි. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් අයවිය යුතු මුදල් මසකට රු. 30,000.00 බැගින් පියවීමට එකඟ වී ඇත්තේ අදාල විවිධ සේවා සමූපකාර සමිතිය ආර්ථික අපහසුතා මත පවත්වාගෙන යාම හේතුවෙනි. නමුත් මෙම මාසික වාරිකය සැලකිය මුදලක් දක්වා වැඩිකිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | 2021 වර්ෂය තුළදී රු.300,000 ක් අය වී තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට රු.751,687 ක හිඟහිටි ණය ශේෂයක් පැවැතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (කැ) | පොදු තැන්පත් ගිණුම්වල දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය (6003) තැන්පත් ගිණුම් 04 කට හා අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු (6000) තැන්පත් ගිණුමකට අදාළව එකතුව රු. 10,943,683 ක් වූ හර ශේෂයන් පැවතුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම ශේෂ කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් 02 කට අයත් හර ශේෂ කපා හැර ඇති අතර අනෙක් ගිණුමේ ශේෂය, නිරවුල් කරන ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා තිබුණි. |
| (කෙ) | වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකිරීම සඳහා උපදෙස් ලබාදීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වී තිබුණි. එසේ වුවද, නියැදි පදනම මත තෝරාගත් ආයතන 46 ක තැන්පතු ගිණුම් 125 ක වර්ෂ 02 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන එකතුව රු.2,854,723,825 ක තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කල වීම. | අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත එවනු ලබන වාර්ෂික සැසඳුම් ප්‍රකාශයන් හා කාල විශ්ලේෂණ වාර්තා අනුව වර්ෂ 02 කට වැඩි ශේෂ පිළිබඳව මු.රෙ.570 ප්‍රකාරව විශ්ලේෂණයන් සිදුකර ඊට අනුකූල නොවන තැන්පතු පිළිබඳව මු.රෙ. 571 ට අනුව කටයුතු කරන ලෙස අදාළ ආයතන වෙත උපදෙස් ලබා දී ඇත. එමෙන්ම, 2020.12.31 දිනට තැන්පතු ගිණුම් සම්බන්ධ වාර්ෂික සැසඳුම් වාර්තා පදනම් කර ගනිමින් වර්ෂ 02 කට වඩා වැඩි ශේෂ පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකිරීමට ද දැනට සැලසුම් කර ඇත. | දෙපාර්තමේන්තුව විසින් ආයතන 187 ක කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කරන ලෙස ලිඛිතව දන්වා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (කේ) | ඉහත පොදු තැන්පත් ගිණුම්වල ශුද්ධ ශේෂය තුළ පැවති තැන්පත් ගිණුම් 108 ක එකතුව රු.1,937,815,718 ක ආරම්භක ශේෂ, 2020 වර්ෂය අවසාන වනවිටත් එසේම පැවතුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කල වීම. | නොකඩවා වර්ෂ කිහිපයක් අක්‍රීයව පවතින ශේෂ පිළිබඳව පසුවිපරම් කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකර ඇත. එමෙන්ම, අනෙකුත් ශේෂයන් පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකිරීමට සටහන් කර ගතිමි. | ආයතන 58 ක් වෙත ඉකුත් තැන්පතුවල තවදුරටත් අවශ්‍යතාවය විමසා ඇති අතර, පිළිතුරු එවා නැති ආයතන පිළිබඳ පසුවිපරම් කරමින් පවතී. |
| (කො) | 2018 වර්ෂයේ අයවැය යෝජනා අනුව, ඉදිරි වසර 10 ඇතුළත මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම යටතේ පිළියෙල කිරීම සඳහායෝජනා සම්මත වී තිබුණු අතර ඒ සඳහා 2018 ඔක්තෝබර් 02 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එහෙත් එම අමාත්‍ය මණ්ඩල අනුමැතියට අදාලව ඉදිරිපත් කළ මාර්ග සැලැස්මේ (Road Map) ඇතුළත් කාර්යයන් වලට අදාල කාල රාමුව විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කර තිබුණි. තවදුරටත් මේ සම්බන්ධව පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ. | | | |
| | (i) මූලික මාර්ග සැලැස්ම අනුව 2020 වර්ෂයේදීත් , සංශෝධිත මාර්ග සැලැස්ම අනුව 2022 වර්ෂයේදීත් අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණු රාජ්‍ය වත්කම් හඳුනා ගැනීම ,මැනීම් කිරීම | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කල වීම. | රාජ්‍ය වත්කම් හඳුනාගැනීම, මැනීම් කිරීම හා හෙළිදරව් කිරීමට අදාළව ප්‍රමාණාත්මක ප්‍රගතියක් පෙන්නුම්කරන අතර ඒ අනුව 2019 වර්ෂය අවසානයට මූල්‍ය | 2021 නොවැම්බර් මස අවසාන වනවිට මූල්‍ය නොවන වත්කම් අගය රු. බිලියන 1,849 කි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | හා හෙළිදරව් කිරීමට අදාල කාර්යයන් 2022 වර්ෂය අවසන් වර්ෂයේදී නිමකිරීමට අපේක්ෂාකර තිබුණි. ඒ අනුව, මේ යටතේ ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳව පමණක් අවධානය යොමුවී තිබුණු අතර ඉඩම් හා ගොඩනැඟිලි පවතින රජයේ ආයතන 214 ක් පවතින බවත් ඉන් 60 ක ඉඩම් හා ගොඩනැඟිලි නොමැති බවත් ඉන් සම්පූර්ණයෙන් තක්සේරු ගිණුම් ගත කර අවසන් ආයතන 10 ක් පමණක් බවත් විගණනයට දන්වා තිබුණි. ඒ අනුව, ඉඩම් හා ගොඩනැඟිලි පවතින ආයතන වත්කම් ගිණුම්ගත කිරීමේ ප්‍රතිශතය සියයට 07 ක් පමණක් වී තිබුණි. | | ප්‍රකාශනවල දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම්වල අගය රුපියල් බිලියන 1,355 ක් වූ අතර 2020 වර්ෂයේ එහි අගය රුපියල් බිලියන 1,776 ක් විය. ඒ අනුව, 2020 වර්ෂයේ පැවති වසංගත තත්ත්වය හමුවේදී පවා රුපියල් බිලියන 421 ක වත්කම් ගිණුම්ගත කිරීමට හැකිවිය. ඒ අනුව, සංශෝධිත මාර්ග සැලැස්මට අනුව මෙම කාර්යය 2022 වර්ෂය අවසන් වන විට නිම කිරීමට අපේක්ෂිතය. | |
| | (ii) | මූලික සැලැස්ම අනුව 2020 වර්ෂයේදී අවසන් කිරීමට යෝජිතව තිබූ වගකීම් හඳුනාගැනීම ,මැනීම හා හෙළිදරව් කිරීමේ කාර්යය සංශෝධිත සැලැස්ම මඟින් 2022 දක්වා ප්‍රමාද කර තිබුණු අතර ඒ යටතේ වූ මූලික කාර්යයන් | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කල වීම. | මාර්ග සැලැස්මේ ඇතුළත් වගකීම් හඳුනාගැනීමේ කාර්යයන් ආරම්භ කර ඇති අතර 2020 වසර තුළ ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය තුළ එම කාර්යයන් නිම කිරීමට 2022 දක්වා දීර්ඝ කිරීමට සිදුවිය. එමෙන්ම, එම මාර්ග සැලැස්මේ ඇතුළත් | ගෙවිය යුතු අයිතමයන් හඳුනාගැනීම ඉදිරියේදී ආරම්භ කිරීමට අපේක්ෂා කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | පමණක් මේ වනවිට ආරම්භ කර තිබුණි. | | ගෙවිය යුතු අයිතමයන් හඳුනාගැනීමේ කාර්යයන්හි කටයුතු මේ දක්වා ආරම්භ කර නොමැති අතර එම කාර්යයන් 2021 වසරේදී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. | |
| | (iii) | මූලික මාර්ග සැලැස්ම අනුව 2021වර්ෂයේ දී අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණු ආදායම් හා වියදම් හඳුනාගැනීම, මැනීම හා හෙළිදරව් කිරීමේ කාර්යයන් සංශෝධිත සැලැස්ම මඟින් 2026 වර්ෂයෙන් පසුවට ප්‍රමාද කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කල වීම. | සංශෝධිත මාර්ග සැලැස්ම අනුව උපචිත පදනම මත ආදායම් හා වියදම් හඳුනාගැනීම, මිනුම්කරණය හා හෙළිදරව් කිරීම 2026 වර්ෂයෙන් පසු පූර්ණ උපචිත පදනම යටතේ ගිණුම් තැබීමේ අවධියේ දී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. | පූර්ණ උපචිත පදනම මත ගිණුම් තැබීමේ අවධියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. |
| | (iv) | ඉහත කී අමාත්‍ය මණ්ඩල සටහන අනුව, සෑම වසරක් අවසාන වී මසකට පසු අදාළ ක්‍රියාවලියේ ප්‍රගතිය අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කළ යුතු වුවත්, මෙතෙක් එක් ප්‍රගතිය හෝ වාර්තා කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කල වීම. | මෙතෙක් අදාළ ක්‍රියාවලියේ ප්‍රගතිය වාර්තා කර නොමැති බව පිළිගන්නා අතර මෙම වර්ෂය අවසානයේ දී අදාළ පරිදි ප්‍රගතිය වාර්තා කිරීමට සටහන් කර ගතිමි. | ප්‍රතිපත්තිමය තීරණයකට එළඹීමෙන් අනතුරුව ඉහත අයිතමයන්ද ඇතුළත් කර සංශෝධිත මාර්ග සැලැස්මක්ද සමඟ ප්‍රගතිය වාර්තා කිරීමට අපේක්ෂිතය. |
| (කෝ) | 2019 වර්ෂයේ අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය ලබාදීමේ දූත මණ්ඩලය විසින් ලබාදුන් ක්‍රියාකාරී සැලැස්මේ 2020 අනුව දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන රාජ්‍ය මූල්‍ය | | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කල වීම. | අන්තර් ජාතික මූල්‍ය අරමුදල ලබා දුන් ක්‍රියාකාරී සැලැස්ම 2020 වසර වෙනුවෙන් පමණක්ම ලබා දුන්නක්, නොවන අතර 2020 වසරේ රටේ පැවති | පළාත් පාලන ආයතන අතුරින් කොළඹ මහ නගර සභාවට අදාල මූල්‍ය තොරතුරු ලබාගැනීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | තොරතුරු, රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන (Government Finance Statistics) මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 4 ක රාජ්‍ය අංශයට අයත් සියලුම ව්‍යාපාර ආයතනවල මූල්‍ය තොරතුරු රැස් කරගැනීම හා ඒකාබද්ධ කරගැනීමට අදාළ සැලසුම් ක්‍රියාත්මක කිරීම 2020 වර්ෂයෙන් ආරම්භ කර සිදු කළ යුතුව තිබුණද, මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල එම කටයුතු ආරම්භ කර තිබුණද පළාත් පාලනවලට අදාළ එම කටයුතු මෙතෙක් ආරම්භ වී තිබුණු බව නිරීක්ෂණය නොවීය. | | වසංගත තත්ත්වය හේතුවෙන් පළාත් පාලන ආයතන වලට අදාල කටයුතු ආරම්භ කිරීම ප්‍රායෝගිකව අපහසු විය. | |

**රජයේ මූල්‍ය ප්‍රකාශන**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල එකතුව රු.මිලියන 731,732 ක මූල්‍ය නොවන වත්කම් දක්වා තිබුණි. එම වත්කම්වල ක්ෂය කළ හැකි අගය, එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමානුකූලව වෙන් කරමින් විචක්ෂණ ගිණුම්කරණ සංකල්පයට අනුව ක්ෂය ප්‍රතිපාදනය සිදු කර නොතිබුණි. ඒ අනුව මෙම වත්කම්වල සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ වෙතොත් එය අඩු කිරීමෙන් පසු ලැබෙන ධාරණ අගය සාධාරණ අයුරින් දක්වා නොතිබුණි. | මූලික ගිණුම්කරණ සංකල්පවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. | රජය සතු සියළු මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර යෝජිත ගිණුම්කරණ රාමුවක් හා ප්‍රමිත හඳුන්වාදීමෙන් අනතුරුව සුදුසු ක්ෂය ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට අපේක්ෂිතය. | 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින්ද එය නිවැරදි කර නොතිබුණි. |
| (ආ) | 2020 වර්ෂයේදී රු.මිලියන 811,773 ක් ආයෝජන වශයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණු නමුත් මූල්‍ය නොවන වත්කම් ලෙස දක්වා තිබුණේ රු. මිලියන 42,864 ක් පමණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ආයෝජන වියදමෙන් | වත්කම් මිලදීගැනීම මත වියදම් පමණක් මූලධන වියදම් ලෙස වාර්තා කළ යුතුවීම. | රජයේ ආයෝජන වියදම තුළ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් ඇතුළත් වුවද මූලධන | 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින්ද එය නිවැරදි කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 768,909 ක් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එසේම මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 10 ප්‍රකාරව මූලධන වත්කම් අත්පත් කරගැනීම සඳහා රු.මිලියන 141,843 ක් දක්වා තිබුණද සටහන් අංක 16 හි වර්ෂය තුළ මිලදී ගැනීම් රු.මිලියන 42,864 ක් පමණක් දක්වා තිබුණි. | | වත්කම් අත්පත් කරගැනීම් යටතේ වන වියදම පමණක් මූල්‍ය නොවන වත්කම් යටතේ ප්‍රාග්ධනීත කෙරේ. | |
| (ඇ) | ඉකුත් වර්ෂ වලදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශන තුළ රාජ්‍ය ණය ලෙස වර්ගීකරණය නොකළ ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම 2020 වර්ෂයේදී, රාජ්‍ය ණය ලෙස වර්ගීකරණය කර තිබුණි. එය ඒකාබද්ධ අරමුදල හරහා අනෙකුත් ණය ලබා ගැනීම් ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයට පටහැනි ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව ඒකාබද්ධ අරමුදලේ වටිනාකම රු.මිලියන 153,079 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි හා අඛණ්ඩ තොරතුරු මත මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කළයුතුය. | පිළිතුරු ලබාදී නොමැත. | 2021 රජයේ මූල්‍ය ප්‍රකාශන 2020 වර්ෂයට පෙර පැවැති ලෙස රාජ්‍ය ණය වර්ගිකරණය කර ඇත. |
| | (i) වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද 2017 ජූලි 20 දිනැති අංක MPS/SEC/2017/32 "හම්බන්තොට වරාය සහන ගිවිසුම" නම් වූ අමාත්‍ය මණ්ඩල | රජයේ මූල්‍ය ප්‍රකාශනවල රාජ්‍ය ණය ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුවීම. | හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගත් ණය මුදල 2017 වර්ෂය දක්වා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගෙවනු ලැබූ අතර 2017 අගෝස්තු 04 දිනැති අමාත්‍ය මණ්ඩල | හම්බන්තොට වරාය ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු වත්මකමක් බැවින් මෙම වගකීම වරාය අධිකාරියේ පොත්වලට ඇතුළත් කරන ලෙස සභාපතිවරයා වෙත දන්වා යවා ඇත. කෙසේ වෙතත්, 2020 වර්ෂය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | සංදේශයට අදාළව 2017 අගෝස්තු 04 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ණය වලින් තවදුරටත් ගෙවිය යුතුව තිබූ ශේෂය ආපසු ගෙවීමේ වගකීම, එකී සහන ගිවිසුම බලාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මහා භාණ්ඩාගාරය විසින් බාර ගෙන තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට එසේ ගෙවිය යුතු රු.මිලියන 164,602 ක් වූ ණය ශේෂය රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. එසේම, එම ණය ශේෂය වරාය අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවලින්ද ඉවත්කර තිබුණි. | | තීරණය ප්‍රකාරව ණය සේවාකරණය භාණ්ඩාගාරය විසින් සිදුකරනු ලබයි. හම්බන්තොට වරාය ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු වත්කමක් බැවින් අධිකාරියේ පොත්වලට ඇතුල්කරන ලෙස සභාපතිවරයා වෙත දන්වා යවා ඇත. | වනවිටත් මෙම ණය වගකීම අධිකාරියේ පොත් වලට ඇතුළත් කර නොතිබුණි. |
| | (ii) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව, 2020 වර්ෂයේදී විදේශ ණය ආපසු ගෙවීම් වටිනාකම රු. මිලියන 504,209 ක් වී තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල සටහන 28 (විදේශ ණය ශේෂ ප්‍රකාශන) අනුව | රජයේ මූල්‍ය ප්‍රකාශනවල රාජ්‍ය ණය ගෙවීම නිවැරදිව ගිණුමගත කළ යුතුවීම. | මෙම වෙනසට හේතුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ගිණුම්ගත කර ඇති රු.මිලියන 15,152.44 ක් වූ ණය ශේෂයන්ට අදාළව ණය ප්‍රදායක ආයතන වෙත 2020 | ඉහත ණය මුදල සම්බන්ධයෙන් ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග මත එම ණය මුදලට අදාල ණය ආපසු ගෙවීම් සටහන් කළ යුතු වැය විෂයය තීරණය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 2020 වර්ෂයේදී විදේශ ණය ගෙවීම් රු. මිලියන 489,057 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව විදේශ ණය ආපසු ගෙවීම්වල වෙනස හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ගෙවනු ලැබූ රු. මිලියන 15,152 ක ණය වාරික සටහන් 28 හි ඇතුළත් කර නොතිබුණි. | | වර්ෂයේදී සිදුකළ ණය ආපසු ගෙවීම් වේ. | |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලබන විදේශ ණය ශේෂය එදිනට පැවති විනිමය අනුපාතයට (Closing Rate) පරිවර්තනය කිරීමේදී රු.මිලියන 282,565 ක විනිමය අලාභයක් ඇති වී තිබුණි. එම අලාභය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගැලපීම් කළ යුතුව තිබුණත් එසේ නොකොට ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමට (Net Assets Adjustment Account) ගලපා තිබුණි. | නිවැරදි ගිණුම් ප්‍රතිපත්ති මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | උපචිත පදනම මත ගිණුම් පිළියෙල කිරීමක් සිදු නොකරනු ලබන බැවින් අදාළ අලාභය මූල්‍ය කාර්යසාධනයට ගලපනු නොලැබේ. | 2021 වර්සයේ මූල්‍ය ප්‍රකාශනවලින්ද නිවැරදි කර නොමැත. |
| (ඉ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන විදේශාධාර ගිණුම් තැබීමට අදාළ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ ආධාර සම්බන්ධ සියළු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කළ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විදේශ ආධාර ලබා ගැනීම හා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතුවීම. | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව සියළු විදේශාධාර ප්‍රදාන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හරහා | මෙම දෙපාර්තමේන්තුව මඟින් සහ භාණ්ඩාගාරයේ අනෙකුත් දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණයෙන් යුක්තව සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන වෙත විදේශ ප්‍රදාන ලබාගැනීමේ |

| | | | | |
|---|---|---|---|---|
| | යුතුව තිබුණි. 2020 වර්ෂයේදී විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් එකතුව රු. මිලියන 1,266 ක විදේශ ප්‍රදාන සෘජුව ලබාගෙන තිබුණි. එම ප්‍රදානයන් සඳහා ප්‍රතිපාදන සලසාගෙන මුල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරිමට කටයුතු කර නොතිබුණි. එසේම 2018 හා 2019 වර්ෂවල මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 24 ක් විසින් ව්‍යාපෘති 77 ක් සඳහා සෘජුවම රු. මිලියන 2,026 ක විදේශ ප්‍රදානද ලබාගෙන තිබුණත්, ඒවා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගිණුම් ගත කර නොතිබුණි. | | ලබාගැනීම සිදු කළ යුතුවිය. | නිවැරදි ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කරමින් ඒ අනුව කටයුතු කරන ලෙස චක්‍රලේඛ හා උපදෙස් නිකුත් කර ඇත. |
| (ඊ) | 2020 වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ 118-2-3-50-2301/11 වැය විෂයය යටතේ රු. මිලියන 773 ක්, වී අලෙවි මණ්ඩලය සඳහා හා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ 421-2-4-12-2301/11 වැය විෂයය යටතේ නිමිති තාක්ෂණික වැඩසටහන සඳහා රු.මිලියන 10 ක් වශයෙන් එකතුව රු.මිලියන 783 ක ප්‍රාග්ධන දායකත්වය ලබාදී තිබුණ | නිවැරදි ගිණුම් ප්‍රතිපත්ති මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | 2020 මාර්තු 05 දිනැති අංක අමප/20/0513/204/042 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම හිමිකම් ලබාදී ඇති බැවින් රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 21 ට ඇතුළත් කර නොමැත. 2021 වර්ෂය තුළදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකරනු ලැබේ. | වී අලෙවි මණ්ඩලය සඳහා වන නිවැරදි කිරීම් 2021 වර්ෂයේ සිට සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නමුත්, එය මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර නොතිබුණි. | | | |
| (උ) | රජයේ ප්‍රාග්ධන දායකත්වය ලෙස රු.මිලියන 1,358 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබුණත්, එය රජයේ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 100 ක් අඩුවෙන් රු. මිලියන 1,258 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි මගපෙන්වීම් හා උපදෙස් මත ප්‍රාග්ධන දායකත්වය ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. | රු. මිලියන 1,257 ක මුදල මහා භාණ්ඩාගාරය විසින් ආයතනය වෙත ප්‍රාග්ධන දායකත්වයක් ලෙස ලබාදුන්නද, අධිකාරිය විසින් එය මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර ඇත. මේ සම්බන්ධයෙන් ආයතනය දැනුවත් කරනු ලැබේ. | නාගරික සංවර්ධන අධිකාරියේ ගිණුම් අනුව මහා භාණ්ඩාගාරයෙන් ලද රු.මිලියන 100 ක් ආරම්භක ප්‍රාග්ධනය ලෙස ගිණුම්ගත වී ඇති නමුත් ආරම්භක ප්‍රාග්ධනය ලෙස ලබා දී ඇති රු.මිලියන 100 ක මුදල රජයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත වී නොමැත. |
| (ඌ) | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල IV වන උපලේඛනයේ රු.මිලියන 152,826 ක් ලෙස බැරකම් දක්වා තිබුණු නමුත් විගණනයට ඉදිරිපත් කළ බැරකම් ප්‍රකාශය අනුව මුළු බැරකම් ප්‍රමාණය රු. මිලියන 181,906 ක් වී තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනයේ IV වන උපලේඛනයේ සඳහන් බැරකම් ප්‍රමාණය රු.මිලියන 29,080 ක් අඩුවෙන් සඳහන් කර තිබුණි. | නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුවීම. | 2020 වර්ෂය තුළ සිදුවූ අමාත්‍යාංශ වසාදැමීම්, ඒකාබද්ධ කිරීම්, වෙනස් කිරීම් හා විෂය පථය වෙනස්වීම් හේතුවෙන් එම වෙනස පැනනැඟී ඇත. | 2020 වර්ෂය තුළ සිදුවූ අමාත්‍යාංශ වසා දැමීම, ඒකාබද්ධ කිරීම, වෙනස් කිරීම් හා විෂය පථය වෙනස්වීම් හේතුවෙන් අදාල වෙනස්කම් පැන නැඟී තිබුණි. ඉදිරි වර්ෂවල නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. |
| (ඔ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රතිපාදන සලසා තිබුණු හා ඉන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා නොයන පරිදි බැරකම්වලට එළඹිය හැකි වුවත් | නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන පරිදි ආයතන කටයුතු කිරීමට පෙළඹවීම සිදුකළ යුතුවීම. | වාර්ෂික විසර්ජන පනත යටතේ වෙන්කරනු ලබන හෝ අතිරේක ප්‍රතිපාදන සීමාව තුළ බැරකම්වලට එළඹිය යුතු බව අංක 255/2017 දරන රාජ්‍ය | වාර්ෂික විසර්ජන පනත යටතේ වෙන්කරනු ලබන හෝ අතිරේක ප්‍රතිපාදන සීමාව තුළ බැරකම්වලට එළඹිය යුතු බව 255/2017 දරන රාජ්‍ය ගිණුම් |

| | | | | |
|---|---|---|---|---|
| | ඊට පටහැනිව 2020 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් වැය ශීර්ෂ 49 ක් යටතේ වැය විෂයයන් 619 ක් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණත්, එම වැය විෂයයන් යටතේ එකතුව රු.මිලියන 29,369 ක බැරකම්වලට එළඹ තිබුණි. | | ගිණුම් චක්‍රලේඛය මඟින් උපදෙස් ලබාදී ඇත. | චක්‍රලේඛය මඟින් උපදෙස් ලබාදී ඇත. |
| (ඕ) | ආයතන 4 ක් සමඟ රජය රු. මිලියන 44,253 ක බැරකම්වලට එළඹී තිබුණද එම බැරකම් රජයේ මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කර නොතිබුණි. | නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුවීම. | පිළිතුරු සපයා නැත. | මේ සම්බන්ධයෙන් ආයතනයට අදාල බැරකම් නිසි පරිදි වාර්තා කිරීම අදාල ආයතනයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීමක් ලෙස සලකා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී තිබුණි. |
| (ක) | රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත ණය ගිවිසුම් අංක 2019011 දරන සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතියේ ණය ගිවිසුම අවසන් කිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට උපදේශන කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීම මත අදාල උපදේශන ආයතනය විසින් අලාභ හා හානි ලෙස රු.මිලියන 5,896 ක හිමිකම්පෑමක් සිදුකර තිබුණු අතර ඒ පිළිබඳව රජයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නිවැරදි මගපෙන්වීම් හා උපදෙස් මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | මේ සඳහා පත්කර ඇති කමිටුව මේ වනවිට වාර දෙකක් රැස්වී ඇති අතර අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | මීට අදාල කමිටුව වාර 07 ක් රැස්වී ඇති අතර, මේ පිළිබඳ ඉදිරි කටයුතු සාකච්ඡා කර ඇත. 2021 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවලින්ද හෙළිදරව් කර නොතිබුණි. |
| (කා) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් | නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන පරිදි ආයතන | වාර්ෂික විසර්ජක පනත යටතේ වෙන්කරනු | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ඒ |

| | | | | |
|---|---|---|---|---|
| | චක්‍රලේඛය ප්‍රකාරව කිසිදු බැරකමක් ඉදිරි වර්ෂය සඳහා ගෙන ගිය නොහැකි බවට උපදෙස් දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වැය ශීර්ෂ 42 ක් යටතේ වන වැය විෂයයන් 86 කට සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනය පූර්ණ ලෙස උපයෝජනය කර තිබීම නිසා ඉතිරිවීම් අනාවරණය වී නොතිබුණි. එසේ තිබියදී එම වැය විෂයයන් යටතේ ප්‍රතිපාදන රහිතව රු. මිලියන 41,601 ක බැරකම්වලට එළඹ තිබුණි. | කටයුතු කිරීමට පෙළඹවීම සිදු කළ යුතුවීම. | ලබන හෝ අතිරේක ප්‍රතිපාදන සීමාව තුළ බැරකම්වලට එළඹිය යුතු බව අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය මඟින් උපදෙස් ලබාදී ඇත. | සඳහා අවශ්‍ය උපදෙස් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 මඟින් නිකුත් කර ඇත. |
| (කැ) | ශීර්ෂ 105 ක් යටතේ වැය විෂයයන් 676 කට සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු රු. මිලියන 10,262 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. එම ඉතිරි ප්‍රතිපාදනය රු. මිලියන 69,745 කින් ඉක්මවා රු.මිලියන 80,013 ක බැරකම්වලට එළඹ තිබුණි. | නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියාත්මක කිරීමට වගබලා ගත යුතුවීම | වාර්ෂික විසර්ජන පනත යටතේ වෙන්කරනු ලබන හෝ අතිරේක ප්‍රතිපාදන සීමාව තුළ බැරකම්වලට එළඹිය යුතු බව අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය මඟින් උපදෙස් ලබාදී ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා අවශ්‍ය උපදෙස් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 මඟින් නිකුත් කර ඇත. |
| (කෑ) | ශ්‍රී ලංකා මහා බැංකුවේ පවතින තොරතුරු අනුව, ශ්‍රී ලංකා මහා බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රජය වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන වක්‍රීය ණය යෝජනා ක්‍රමවලට අදාල රු. මිලියන 13,209 ක ගිණුම් ශේෂ 10 ක්, ශ්‍රී ලංකා මහා බැංකුවට අයත් | අවශ්‍ය සියළු තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන යාවත්කාලීනව හා නිවැරදිව ඉදිරිපත් කළ යුතුවීම. | මෙම ණය යෝජනා ක්‍රමවලට අදාළ ගිණුම් ශේෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කර සැබවින්ම රජයේ ගිණුම්වලට ගත යුතු ගිණුම් ශේෂ පවතී නම් එකඟතාවයකට | ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරම්භක ආයෝජනයෙන් ක්‍රියාත්මක කරන ලද විවිධ සංවර්ධන ණය යෝජනා ක්‍රමවල ශේෂයන් වන අතර එම ශේෂ වැඩිපුර ප්‍රමාණයක් අයවිය යුතු ප්‍රතිමූල්‍ය ලැබීම් වන අතර මේ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ |

| | | | | |
|---|---|---|---|---|
| | නොවන බවත් එම ශේෂ ශ්‍රී ලංකා රජය සතු ආයෝජන හා ප්‍රතිමූල්‍යායන ණය ගැනීම් බවත් විගණනයට දන්වා තිබුණත්, එම ගිණුම් ශේෂ රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | | පැමිණීමෙන් අනතුරුව සුදුසු පරිදි ගිණුම්වලට ඇතුළත් කිරීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වමි. | සාකච්ඡා කර තීරණයක් ගැනීමට පියවර ගෙන ඇත. |
| (කෙ) | 2020 රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් 10 කට අදාලව රු. මිලියන 7,407 ක ශේෂ දීර්ඝ කාලයක් මුළුල්ලේ අක්‍රීයව පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන තුළ නිරවුල් හා යාවත්කාලීන අගයන් ඇතුළත් කළ යුතුවීම. | ප්‍රධාන ලෙජර් ගිණුම් දිගුකාලයක් අක්‍රීයව පැවතිය ද ඒවා පොත්වලින් කපාහැරීමට පෙර එකී ගිණුම් තවදුරටත් පද්ධතිය තුළ පවත්වාගත යුතු ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ ලැබුණු පසු ඒ අනුව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. | අක්‍රීය ගිණුම්වලට අදාල ආයතන සමඟ සාකච්ඡා පවත්වා එම ගිණුම් නිරවුල් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. |
| (කේ) | නියැදි පදනම මත තෝරාගත් ආයතන 51 ක 2020 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ඉඩම්වල වටිනාකම, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කළ වටිනාකමට වඩා | නිවැරදි මගපෙන්වීම් හා උපදෙස් මත මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුවීම. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් තක්සේරු කර වාර්තා කල පසු එම වටිනාකම් | තක්සේරු වාර්තාවන්හි පිටපතක් තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය විසින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන |

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 130,886 ක් අඩුවෙන් හා රු. මිලියන 3,016 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | CIGAS පද්ධතිය හරහා ගිණුම්ගත කිරීම අදාළ ආයතනය සතු වගකීමකි. | අතර එම තක්සේරු වාර්තාවෙහි පිටපත ලද විගස එම තක්සේරු අගයන් CIGAS පද්ධතිය හරහා ගිණුම්ගත කරන ලෙස දන්වමින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් අදාල ආයතනය වෙත ලිපි යොමු කරනු ලබයි. |
| (කො) | නියැදි පදනම මත තෝරාගත් ආයතන 73 ක රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගොඩනැඟිලිවල වටිනාකම, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කළ වටිනාකමට වඩා රු.මිලියන 22,936 ක් අඩුවෙන් හා රු. මිලියන 37,362 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි මගපෙන්වීම් හා උපදෙස් මත මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කළ යුතුවීම. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉඩමක් හෝ ගොඩනැඟිල්ලක් තක්සේරු කර වාර්තා කල පසු එම වටිනාකම් CIGAS පද්ධතිය හරහා ගිණුම්ගත කිරීම අදාළ ආයතනය සතු වගකීමකි. | තක්සේරු වාර්තාවන්හි පිටපතක් තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය විසින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන අතර එම තක්සේරු වාර්තාවෙහි පිටපත ලද විගස එම තක්සේරු අගයන් CIGAS පද්ධතිය හරහා ගිණුම්ගත කරන ලෙස දන්වමින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් අදාල ආයතනය වෙත ලිපි යොමු කරනු ලබයි. |
| (කෝ) | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් (Non - Financial Assets) වටිනාකම රු. මිලියන 1,776,368 ක් විය. ඊට අදාල, මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 16 හි ඇතුළත් ආයතන අතරින්, නියැදි පදනම මත තෝරාගත් ආයතන 102 ක, 2020 | නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුවීම. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එම මූල්‍ය ප්‍රකාශනවල භාණ්ඩාගාර පොත් සමඟ සැසඳෙන ගිණුම් ශේෂ පමණක් ඇතුළත් කරනු ලැබේ. | ආයතනවල මූල්‍ය නොවන වත්කම් ලේඛනවල ශේෂ ලැයිස්තු භාණ්ඩාගාර පොත් සමඟ සැසඳීම් කළ යුතු බවට අදාල ආයතන දැනුවත් කර ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඒ.සී.ඒ.- 6 ආකෘතියේ එනම් “මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ” ඇතුළත් 2020 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය නොවන වත්කම් ශේෂය, සමග සැසඳීමේදී වත්කම් වර්ග 05 කට අදාළව රු. මිලියන 15,220 ක් වැඩියෙන් හා වත්කම් වර්ග 06 කට අදාළව රු. මිලියන 26,641 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. ඒ අනුව රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ මූල්‍ය නොවන වත්කම් ශේෂය රු. මිලියන 11,421 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | | | | | |
| (ග) | 2020 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල නීති, රීති. රෙගුලාසි ආදියට අනුකූල නොවූ ගනුදෙනු පහත දක්වා ඇත. | | | | | |
| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | | **අනුකූල නොවීම** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
| | (i) | 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත | (i) 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ප්‍රකාරව, යම් | පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතුවීම. | දැනට මතු වී ඇති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අනපේක්ෂිත ලෙස රාජ්‍ය මූල්‍ය ක්‍රියාවලියට හා ආර්ථිකයට දැඩි බලපෑමක් එල්ලවී | උක්ත පනතෙහි 26 වැනි වගන්තිය ප්‍රකාරව එහි නිගමනයන්ගෙන් බැහැරවීම පිළිබඳව 2021.06.22 දින පාර්ලිමේන්තුව |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | වර්ෂයක් අවසානයට පැවතිය හැකි උපරිම බැරකම් වටිනාකම එම වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 80 නොඉක්මවිය යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දිනට ගිණුම් ගත නොකළ විදේශ ණය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට බැහැරින් ගිණුම් තබා තිබුණු විවිධ රාජ්‍ය ව්‍යවසාය වලට අදාල බැරකම් ද සැලකිල්ලට ගත්විට එම අදාල සීමාව සියයට 97.7 ක් බව නිරීක්ෂණය විය.<br>* මහා භාණ්ඩාගාරයේ ඇපකර මත රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන ඇති ණය සඳහා බැංකු වෙත ලබාදී ඇති ඇපකර හා සහන ලිපි වටිනාකම වූ රු.බිලියන 1,059 ක් සහ අමාත්‍යාංශ, | | ඇති බැවින් සෞඛ්‍ය හා අනෙකුත් අංශ කෙරෙහි ඉහළ රාජ්‍ය වියදමක් දැරීමට සිදුව ඇත. | දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ප්‍රකාශන වල ඇතුළත් රු.බිලියන 153 ක වටිනාකම් ඉහත බැරකම් තුළට ඇතුළත් කර නොමැත. | | | |
| | | | (ii) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන පරිදි ඇස්තමේන්තු කිරීමටත්, සමාලෝචිත වර්ෂය අවසානයට වූ තථ්‍ය අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන පරිදි පවත්වාගෙන යාමට මුදල් අමාත්‍යාංශය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. | පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකල යුතුවීම. | 2020 වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය පරතරය රු. බිලියන 1,266 ක් වන අතර, ඒ අනුව එය එවකට ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය වන රු. බිලියන 16,003 න් සියයට 7.9 ක් විය. 2015 වර්ෂයේ සිට අඛණ්ඩව ආර්ථික වර්ධනය අඩුවීම හා 2019 වර්ෂයේ සිදුවූ පාස්කු ප්‍රහාරයෙන් වූ බලපෑම හේතුවෙන් ආර්ථික කටයුතු අඩපණ වීම හා කොවිඩ් 19 | 2019 වර්ෂයේ ඇතිවූ පාස්කු ඉරු දින ප්‍රහාරය හා 2020 වර්ෂයේ මාර්තු මස සිට මේ දක්වා ශ්‍රී ලංකාව පෙර නොවූ විරූ ලෙස අත්විඳිමින් සිටින කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් දේශීය ආර්ථිකය කෙරෙහි අහිතකර ලෙස බලපෑම ආදිය තුළින් රජයේ ආදායම හා වියදමද ඇතුළුව සමස්ථ රාජ්‍ය මූල්‍ය ක්‍රියාවලියම දැඩි අභියෝගයකට ලක්වී ඇත. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | වසංගතය හේතුවෙන් රාජ්‍ය මූල්‍ය ක්‍රියාවලියට හා ආර්ථිකයට දැඩි බලපෑමක් එල්ලවී ඇති බැවින් සෞඛ්‍ය හා අනෙකුත් අංශ කෙරෙහි ඉහළ රාජ්‍ය වියදමක් දැරීමට සිදුව ඇත. | |
| | (ii) | 2020 අංක 6 දරන විසර්ජන පනත | අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමැතිය ඇතිව, පනතේ තෙවන උපලේඛනයේ සඳහන් උපරිම සීමා අතුරින් කිසිවක් හා අවම සීමා නියමයක් මඟින්, 2021 මැයි 31 දින වන විට හෝ එදිනට පෙර වෙනස් කිරීම හෝ විචර්තනය කිරීම හෝ කරනු ලැබිය හැකි වුවද, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව ආයතන 07 ක එම සීමා එසේ වෙනස් කිරීමට/ විචර්තනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකල යුතුවීම. | ශීර්ෂ 06 ක සීමා සංශෝධනයන් සඳහා ඉල්ලීම් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් ඉදිරිපත් වී නොතිබුණු අතර ශීර්ෂ 04 ක සංශෝධනයන්ට ඉදිරිපත් නොවූ සීමාවන් පවතී. | සීමාවලට අනුකූල නොවීම පිළිබඳ විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. |
| | (iii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | * | මු. රෙ. 373 | සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අග්‍රිම ගිණුම් ශේෂ පියවිය යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ ගණනාවක සිට පැවත එන අග්‍රිම ගිණුම් 03 ක එකතුව රු. මිලියන 118 ක ශේෂ නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් සිදුකළ යුතුවීම. | මෙම ගිණුම් 03 න් එක් ශේෂයක් ධීවර සංස්ථාවේ පවතින දැඩි මූල්‍ය දුෂ්කරතා මත පියවීමට නොහැකි වී ඇති අතර තවත් ශේෂයක් විදේශ දූත මණ්ඩල වලින් තොරතුරු රැස්කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. අනෙක් ශේෂය පියවිය යුතු ආකාරය පිළිබඳ උපදෙස් දෙමින් අදාළ අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇත. | අග්‍රිම ගිණුම නොපියවා ඇති ආයතන සඳහා වාර්ෂික අක්මුදල් නිකුත් කිරීම සීමා කිරීමට දැනටමත් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව එකී ආයතනවලට අක්මුදල් නිකුත් කිරීම සීමා කිරීමට ඉදිරියේදී කටයුතු කිරීමට පියවර ගෙන ඇත. |
| | * | මු.රෙ. 518 | වසර ගණනාවක සිට පැවත එන භාණ්ඩාගාර අනුමත අත්තිකාරම් ගිණුම් 19 ක එකතුව රු. මිලියන 1,353 ක් වූ ශුද්ධ ශේෂ, එම අත්තිකාරම් ගිණුම්වලට අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විමසා වසා දැමීමට අවශ්‍ය | දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය මඟපෙන්වීම් හා උපදෙස් ලබාදිය යුතුවීම. | මුදල් රෙගුලාසි මඟින් අවශ්‍ය මඟපෙන්වීම් ලබා දී ඇති අතර ඒ අනුව අදාල වැය ශීර්ෂ විසින් කටයුතු කළ යුතු බව දන්වමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මඟින් අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබාදී ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | | |
| | * | මු.රෙ. 571 | වසර 02 ඉක්මවූ තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතු වුවද, නියැදි පදනම මත තෝරාගත් ආයතන 46 ක පැවති තැන්පතු ගිණුම් 125 ක එකතුව රු.මිලියන 2,804.73 ක තැන්පතු ගිණුම් ශේෂ වර්ෂ 02 ක සිට වර්ෂ 05 කට වඩා වැඩි කාලපරාසයක සිට පැවත එමින් තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය මඟපෙන්වීම් හා උපදෙස් ලබාදිය යුතුවීම. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත එවනු ලබන වාර්ෂික සැසඳුම් ප්‍රකාශයන් හා කාල විශ්ලේෂණ වාර්තා අනුව වර්ෂ 02 කට වැඩි ශේෂ පිළිබඳව මු.රෙ. 571 ට අනුව කටයුතු කරන ලෙස අදාළ ආයතන වෙත උපදෙස් ලබා දී ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මඟින් අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබාදී ඇත. |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (ගා) | 2020 දෙසැම්බර් 31 දිනට ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල මඟින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට රු.මිලියන 26,673.20 ක් ගෙවිය යුතුව තිබුණි. එම අගයට අදාළ භාණ්ඩාගාර බිල්පත්වල මුහුණත වටිනාකම රු. මිලියන 29,200.75 ක් වී තිබුණි. ඒ අනුව අදාල භාණ්ඩාගාර බිල්පත් වල වට්ටම් වටිනාකම වන රු. මිලියන 2,527.55 ක් වූ වෙනස මෙම ක්‍රියාවලියට අදාලව ඒකාබද්ධ අරමුදලට වැය බරක් වී තිබුණි. | ඒකාබද්ධ අරමුදලට වැය බරක් නොවන අයුරින් කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල තීරණ ලබා ගැනීමෙන් පසු අදාල වගකීම් මහා භාණ්ඩාගාරයේ වගකීමක් වන අතර ඉන්පසු 100% අදාල වගකීම් පියවීමට කටයුතු කරනු ඇත. | 2022 මාර්තු 23 දින වන විටත් අවශ්‍ය සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ගැ) | 2014 ජූලි 23 දිනැති අංක 2/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව, ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබාදුන් යතුරුපැදි වල ලියාපදිංචි අයිතිය වසර 5 ක කාලයකට පසුව පුද්ගලික නමට පැවරෙන අතර එම කාලය තුළදී යතුරුපැදිය විකිණීම හෝ අන්සතු කිරීම සම්බන්ධ විධිවිධාන සලසා තිබුණු | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්‍රියාකළ යුතුවීම. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | මේ සම්බන්ධව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක BD/GPS/130/9/14/MC-8 හා 2019.11.22 දිනැති පොදු උපදෙස් පත්‍රිකාව මඟින් උපදෙස් ලබාදී ඇති අතර කටයුතු කඩිනම් කිරීමට අදාල ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | නමුත් 2020 වර්ෂය වනවිට වර්ෂ 05 ක කාලය අවසන් වන රු. මිලියන 17,410 ක් වටිනාකමැති යතුරුපැදි වල නීත්‍යානුකූල අයිතිය එම නිලධාරීන්ගේ නමට පැවරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ගැ) | 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් රාජ්‍ය ආයතන වෙනුවෙන් මූල්‍ය කල්බදු යටතේ මිලදී ගන්නා ලද එකතුව රු. මිලියන 3,099 ක් වූ වාහනවල කල්බදු කාලය අවසාන වී තිබුණත් ඒවා අදාළ ආයතනවලට පවරාදීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්‍රියාකළ යුතු වීම. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | වාහන පැවරීමේ කටයුතු අවසන් අදියරයේ පවතී. |
| (ගෙ) | 2005 වර්ෂයේ සිට හඳුන්වාදුන් ගිණුම් ආකෘතියට අනුව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ආරම්භ කර තිබුණු අතර 2018 වර්ෂයේ අයවැය යෝජනා 254 අනුව, වසර 10 ක් තුළ දැනට භාවිතා කරන වැඩිදියුණු කළ මුදල් පදනම් ක්‍රමයේ සිට උපචිත පදනම් ගිණුම් ක්‍රමය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පරිවර්තනය | අයවැය යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. | ඉදිරියේදී අනුමැතිය ලබාගැනීමට අපේක්ෂා කෙරේ. මෙතෙක් අදාළ ක්‍රියාවලියේ ප්‍රගතිය වාර්තා කර නොමැති බව පිළිගන්නා අතර මෙම වර්ෂය අවසානයේ දී අදාළ පරිදි ප්‍රගතිය වාර්තා කිරීමට සටහන් කර ගතිමි. | රජයේ ගිණුම් උපචිත පදනමට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමෙන් අනතුරුව සංශෝධිත මාර්ග සැලැස්ම සමඟ ප්‍රගතිය වාර්තා කිරීමට අපේක්ෂිතය. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමට තීරණය කර තිබුණි. එම අමාත්‍ය මණ්ඩල අනුමැතියට අදාලව ඉදිරිපත් කළ මාර්ග සැලැස්මේ (Road map) ඇතුළත් කාර්යන්වලට අදාල කාල රාමුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කර තිබුණද, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. තවද අමාත්‍ය මණ්ඩල සටහන අනුව සෑම වර්ෂයක් අවසාන වී මසකට පසු අදාළ ක්‍රියාවලීන්වල ප්‍රගතිය අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තාකළ යුතු වුවත්, 2021 නොවැම්බර් 05 දින වනවිටත් එලෙස ප්‍රගතිය වාර්තා කර නොතිබුණි. | | | |
| (ගේ) | රජයේ මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අතර සෘජු සම්බන්ධතාවයක් නොතිබුණි. එනම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළින් හුදෙක්ම සමාලෝචිත වර්ෂයේ අයවැයට අදාළ සත්‍ය තත්ත්වය නිරූපණයක් පමණක් සිදුකර තිබුණි. | විධිමත් ගිණුම්කරණ රාමුවක් මත හා ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | ඉදිරියේදී හඳුන්වාදීමට අපේක්ෂිත ගිණුම්කරණ රාමු හා ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් පිළියෙල කිරීමේදී මෙම තත්ත්වය නිවැරදි වේ යැයි අපේක්ෂා කෙරේ. | ඉදිරියේදී හඳුන්වාදීමට අපේක්ෂිත ගිණුම්කරණ රාමුව හා ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව ගිණුම් පිළියෙල කිරීමේදී මෙම තත්ත්වය නිවැරදි වේ යැයි අපේක්ෂිතය. |

| | | | | |
|---|---|---|---|---|
| (ගො) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව මුළු බාහිර වගකීම්වල වටිනාකම රු.මිලියන 15,321,652 ක් වුවද, එයට සාපේක්ෂව මුළු වත්කම්වල වටිනාකම රු. මිලියන 2,671,465 ක් පමණක් වීම හේතුවෙන් මුළු වත්කම් වලට වඩා මුළු බාහිර වගකීම් රු.මිලියන 12,650,187කින් ඉක්මවා තිබුණි. | නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුවීම. | රාජ්‍ය ව්‍යාපාරද ඇතුළුව මුළු රාජ්‍ය අංශයටම අදාළ ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම තත්ත්වය නිරාකරණය වෙතැයි අපේක්ෂා කෙරේ. | 2021 මාර්තු 23 දින වන විටත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |
| (ගෝ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ව්‍යවස්ථාපිත සහ වෙනත් අරමුදල්වල ඇතුළත් වන ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ හර ශේෂය වන රු.මිලියන 12,072,662 ක වටිනාකම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුවීම. | ස්කන්ධය තුළ ඇති එක් එක් සංචිතයේ/ අරමුදලේ ස්වභාවය හා අරමුණු මෙතෙක් ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන ආකෘතිය මඟින් හෙළිදරව් කර නැත. ඉදිරියේදී අවශ්‍ය හෙළිදරව් කිරීම සිදුකිරීමට සටහන් කර ගනිමි. | 2021 වර්සයට අදාළ මූල්‍ය ප්‍රකාශනවලද ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුම ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශයේ දක්වා නැත. |
| (ච) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ඇතුළත් වත්කම් හා වගකීම්, ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කර නොතිබුණි. | විධිමත් ගිණුම්කරණ රාමුවක් මත හා ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් පිළියෙල කළයුතුවීම. | ඉදිරියේදී හඳුන්වාදීමට සැලසුම් කර ඇති ගිණුම්කරණ රාමුව හා ගිණුම් ප්‍රමිත අනුව ගිණුම්කරණය වැඩිදියුණු කිරීමේදී අදාළ වර්ගීකරණයන් කිරීමට අපේක්ෂිතය. | 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල එම වර්ගීකරණය ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඡ) | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉන්ධන ස්ථායීකරණ අරමුදලෙන් | නිවැරදි ගිණුම් ප්‍රතිපත්ති මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. | 2020 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්ව වාර්තාවේ විවිධ ගිණුම් යටතේ ඉන්ධන මිල | 2022 මාර්තු 23 දින වන විටත් ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල් මෙහෙයුම් කමිටුව රැස්කර |

| | | | | |
|---|---|---|---|---|
| | 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. මිලියන 26,673.20 ක් 2020 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම් තුළ (ඍන වටිනාකමක් ලෙස දක්වා) විවිධ ගිණුම් යටතේ ඉන්ධන මිල ස්ථායීකරණ ගිණුම ලෙස නම් කර වරදවා දක්වා තිබුණි. | | ස්ථායිකරණ ගිණුම ලෙස රු. 26,673,196,758 ක ඍණ ශේෂයක් ලෙස පෙන්වා තිබීම නිවැරදිවේ. මෙම ගනුදෙනු ගිණුම්ගත කිරීම සඳහා ප්‍රධාන ලෙජරයේ ලෙජර් ගිණුමක් වශයෙන් ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල ලෙස ගිණුමක් 2020 වර්ෂයේ විවෘත කර තිබූ බැවින් එම ගිණුමේ ශේෂය මේ ආකාරයට 2020 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. | සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (වැ) | 2020 මාර්තු 31 දින අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇති අංක 20/0684/204/060 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලෙහි සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ප්‍රසිද්ධ කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව ක්‍රියාකළ යුතුවීම. | එකඟ වෙමි. 2019 වර්ෂයේ අමාත්‍යාංශ වාර්ෂික වාර්තාවට සාරාංශගත ඡේදයක් ඇතුළත් කර ඇත. 2021 වර්ෂය සඳහා මේ සම්බන්ධව වාර්තාවක් ඇතුළත් කිරීමට සටහන් කර ගතිමි. | 2022 මාර්තු 23 දින වන විටත් ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල් මෙහෙයුම් කමිටුව රැස්කර සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

**3.17 ශීර්ෂය 251 - තක්සේරු දෙපාර්තමේන්තුව**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට හිඟ තක්සේරු ආදායමෙන් රු.457,328,864 ක් හෙවත් සියයට 98 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 12 ක් දක්වා කාල පරාසයක සිට හිඟහිටව පවතින බව නිරීක්ෂණය විය. | වර්ෂ ගණනාවක සිට හිඟව පවතින ආදායම් අයකර ගැනීම සඳහා අප්‍රමාදව කටයුතු කිරීමේ අවශ්‍යතාවය | අදහස් දක්වා නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දින වන විට රු.692,250,571 ක හිඟ තක්සේරු ගාස්තු ආදායමින් රු.459,388,974 ක් හෙවත් සියයට 66 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 13 ක් දක්වා කාල පරාසයක සිට හිඟහිටව පැවැත එමින් තිබුණි. |
| (ආ) | 2020 වර්ෂයේදී පසුගිය වර්ෂයට අවසානයට පැවැති රු.512,531,243 ක හිඟ ආදායමෙන් රු.5,110,251 ක් හෙවත් සියයට 2 ක් පමණක් අයකර ගෙන තිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවය | අදහස් දක්වා නොතිබුණි | 2021 වර්ෂය තුළදී 2020 වර්ෂය අවසානයට පැවති රු. 467,046,699 ක හිඟ තක්සේරු ආදායමින් රු. 7,657,724 ක් හෙවත් සියයට 1.63 ක් පමණක් අයකරගෙන තිබූ බව නිරීක්ෂණය විය. |
| (ඇ) | 2020 වර්ෂයේදී හිඟ ශේෂයයන්ට අදාළව අත්හැර දැමීම්වල මුළු එකතුව රු.50,092,129 ක් වී තිබුණි. | හිඟ ආදායම් අත්හැර දැමීමට පූර්වයෙන් අයකර ගැනීම සඳහා උපරිම ප්‍රයත්නයන් දැරිය යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි | 2022 මාර්තු 23 දින වන විටත් අතහැර දැමූ හිඟ ආදායම් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | එකතු කර නොතිබුණි. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු හිඟ වාර්තාව අනුව දිගුකාලීනව විශාල ආදායම් හිඟහිටි පැවැති ආයතන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන ආයතනවලින් ඒකතුව රු.185,877,099 ක් අයකර ගත යුතුව පැවැතුණි. එම හිඟහිටි ආදායම 2008 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. | මෙම ආයතන සමග සාකච්ඡා කර හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවය | අදහස් දක්වා නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දින වන විට නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන ආයතනවලින් එකතුව රු.252,075,609 ක ආදායමක් 2008 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාල පරිසයක සිට හිඟහිටව පැවැත එමින් තිබුණි. |
| (ඉ) | මහ කොළඹ පළාත් තක්සේරු කාර්යාලයේ 2020 වර්ෂය අවසානයට හිඟව පවතින ආදායම රු.268,108,023 ක් බව නිරීක්ෂණය විය. මෙම හිඟ ආදායම 2020 වර්ෂය අවසානයට පැවැති මුළු හිඟ ආදායමෙන් සියයට 58 ක් බව නිරීක්ෂණය විය. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. | 2021 වර්ෂය අවසානයට හිඟව පවතින ආදායම රු.478,092,636 ක් වී තිබුණු අතර එය 2021 වර්ෂය අවසානයට වූ මුළු හිඟහිටි ආදායමෙන් සියයට 69 ක් වී තිබුණි. |
| (ඊ) | 2020 වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයයන් 08 කට හා මූලධන වැය විෂයයන් 04 ක් සඳහා පිළිවෙලින් රු.මිලියන 33.4 ක් හා රු.මිලියන | වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කළ යුතු වීම. | කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හේතුවෙන් 2020 මාර්තු මාසයේ සිට ඇඳිරි නීතිය පනවා රට | 2021 වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයයන් 15 ක හා මූලධන වැය විෂයන් |

| | | | | |
|---|---|---|---|---|
| | 20.44 ක් වශයෙන් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය පිළිවෙලින් රු.මිලියන 10.96 ක් හා රු.මිලියන 4.7 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | | වසා තැබීම හේතුවෙන් සැලැසුම් කළ පරිදි වියදම් කිරිමට නොහැකි විය. | 05 කට අධි ප්‍රතිපාදන සලසා තිබුණි. |
| ( උ) | දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ 2020 වර්ෂය අවසානයේ අයවිය යුතු ශේෂය රු. 91,234,063.83 ක් වුවද, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ අනුව අයවිය යුතු ශේෂය රු. 91,165,205.83 ක් විය. ඒ අනුව රු. 71,024 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 01අනුව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. | 2018, 2019 හා 2020 වර්ෂවල ද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත හා දෙපාර්තමේන්තු පොත් අනුව රු. 71,024ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමට 2021 වර්ෂයේ දී ද කටයුතු කර නොතිබුණි. 2021 වර්ෂය අවසන් වන විටත් එම වෙනස හඳුනාගෙන නිවැරදි කිරිමට කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | 2020 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කර තිබුණු නිලධාරීන්ගෙන් වර්ෂ 05 ක සිට වර්ෂ 08 ක් දක්වා කාල පරාසයක සිට අයවිය යුතු එකතුව රු.308,614 ක ණය ශේෂ 03 ක් | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 01අනුව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 වන විට ද අයකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අයකර ගැනීමෙන් තොරව පැවැතුණි. | | | |
| (එ) | 2020 වර්ෂයේ දෙසැම්බර් 31දිනට කාර්යයන් ඉටුනොකළ පොදු ලිපි ගොනු 9,528ක් ද වරිපනම් සම්බන්ධ ලිපි ගොනු 3,182 ක් ද ඉතිරි වී තිබුණි. | | | |
| (ඒ) | 2020 දෙසැම්බර් 31 දිනට කාර්යයන් ඉටු නොකළ පොදු ලිපිගොනු 9,528 ක්ද, වරිපනම්වලට සම්බන්ධ ලිපිගොනු 3,182 ක කටයුතු ඉටු කිරිමට පැවැතුණි. | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටු කිරීමේ අවශ්‍යතාවය. | අදහස් දක්වා නොතිබුණි. | පළාත් කාර්යාල වලට දන්වා යවා ඇති නමුත් 2022 මාර්තු 23 දින වන විට ද තොරතුරු ලැබී නොතිබුණි. |
| (ඔ) | 2020 වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 49 ක් හෙවත් පුරප්පාඩු 540 ක් පැවැතුණි. | පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතු විම. | අදහස් දක්වා නොතිබුණි. | 2021 දෙසැම්බර් 01 දින වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 46 ක් එනම් පුරප්පාඩු 512ක් පැවතුණි. |

**3.18 ශීර්ෂය 252 - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| (අ) | 2017 මැයි 04 දිනැති අංක 02/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව එකතුව රු.9,324,361 ක් වූ පොත්, සඟරා හා ලේඛනවලට අදාළව 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදුකර වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. | 2022 මාර්තු 23 දින වන විටත් සමීක්ෂණය සිදු කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1991 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ සේවය අතහැර ගිය නිලධාරීන් 12 දෙනෙකුට අදාළව එකතුව රු.553,207 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 01 අනුව කටයුතු කළ යුතු වීම. | පදිංචි ස්ථානය සොයා ගැනීමට කටයුතු කරන බව හා නීතිපති මඟින් කටයුතු කරන බව. | 2021 දෙසැම්බර් 31 දින වන විට නිලධාරීන් 11 දෙනෙකුගෙන් එකතුව රු.524,261 ක ණය ශේෂ හිඟහිටව පැවතුණි. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දින වන විට මියගිය නිලධාරීන් 04 දෙනෙකුට අදාළව අයවිය යුතු ණය ශේෂවල එකතුව රු.165,450 ක් වී තිබුණි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 01 අනුව කටයුතු කළ යුතු විම. | රු.92,750 ක ණය ශේෂය සම්බන්ධයෙන් මරණ පාරිතෝෂිකය සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව, රු.65,000 ක ණය ශේෂය අයකර ගැනීම සඳහා මරණ පාරිතෝෂිකයේ වූ | 2021 දෙසැම්බර් 31 දින වන විට මියගිය නිලධාරීන් 02 දෙනෙකුට අදාළව එකතුව රු.158,650 ක ණය ශේෂ හිඟහිටව පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අඩුපාඩුවක් සකස් කර 2020 ජුනි 17 දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අදාළ ලිපි ලේඛන යොමු කර ඇත. | |
| (ඈ) | කාලීනවූත්, නිවැරදිවූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර විය. එහෙත් දෙපාර්තමේන්තුවේ දත්ත නිකුත් කිරීම් දින දර්ශනය අනුව දත්ත නිකුත් කිරීමට නියමිත දිනවලට වඩා මාස 01ක සිට මාස 11 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද වී දත්ත නිකුත් කර තිබුණු අවස්ථා 45 ක් නිරික්ෂණය විය. | නියමිත දින වකවානු තුළ දත්ත නිකුත් කිරීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. | 2022 අප්‍රේල් 06 දින වන විටද දත්ත නිකුත් කිරීමේ කාල සටහන අනුව අවස්ථා 137 කදී නියමිති දිනයට වඩා මාසයක සිට වර්ෂයක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව දත්ත නිකුත් කර තිබුණි. |
| (ඉ) | විදේශාධාර ව්‍යාපෘති යටතේ රු.මිලියන 130.16 ක් සඳහා ව්‍යාපෘති 06 ක් හඳුනා ගෙන තිබුණු අතර එම ව්‍යාපෘති 2018 ජනවාරි මාසයේ සිට ආරම්භ කර 2020 වර්ෂය අවසාන කිරිමට නියමිතව තිබුණි. එහෙත් එම ව්‍යාපෘතිවලින් කිසිවක් 2020 වර්ෂයේදී අවසන් කිරිමට නොහැකි වි තිබුණි | දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගත යුතු වීම. | අදහස් දක්වා නැත. | 2022 මාර්තු මාසය වන විට ව්‍යාපෘති 03 ක් නිම කර තිබුණු අතර ව්‍යාපෘති 03 ක් නිම කර නොතිබුණි. |
| (ඊ) | 2020 වර්ෂය අවසන් වන විට අනුමත කාර්ය මණ්ඩලයයෙන් සියයට 33 ක් හෙවත් පුරප්පාඩු 619 ක් පැවැතුණි. ද්විතීයක පදනම මත මෙම | දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්ය මණ්ඩලය නිවැරදි ලෙස ගණනය කර ඇස්තමේන්තුවලට ඇතුළත් කර යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. | 2022 මාර්තු 15 දින වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 21.5 ක් හෙවත් පුරප්පාඩු 402 ක් |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවෙන් මුදා හරින ලද නිලධාරීන්ගේ සංඛ්‍යාව 03 දෙනෙකු වී ඇත. | | | පැවැතුණි. එදින වන විට ද්විතියික පදනම මත මුදා හරින ලද නිලධාරීන් තිදෙනෙකුද විය. |
| (උ) | දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණු මානව සම්පත් සංවර්ධන සැලැස්ම 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ ඇමුණුම 02 ප්‍රකාරව පිලියෙල කර නොතිබුණි. | චක්‍රලේඛයේ සඳහන් පරිදි තොරතුරු ඇතුළත් කර සකස් කළ යුතු විම. | අදහස් දක්වා නොතිබුණි. | 2021 වර්ෂය අවසන් වන විටත් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මානව සංවර්ධන සැලැසුම් පිළියෙල කර නොතිබුණි. |
| (ඌ) | 2020 වර්ෂයේදි පුනරාවර්තන වැය විෂයයන් 07 කට හා මූලධන වැය විෂයයන් 09 කට එකතුව රු.මිලියන 394.87 ක අදිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කල පසු ඉතිරිය රු.මිලියන 218.51 ක් වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 70.42 ක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්ත්වික ඇස්තමේන්තු පිලියෙල කල යුතුවීම. | චක්‍රලේඛ සීමාවට අනුකූලවීම, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ඇස්තමේන්තු ලබාදිම, අක් මුදල් නොලැබීම, ප්‍රතිපාදන ලබා දිම වර්සය අවසානයේදී සිදු කිරිම යන කරුණු හේතු වූ බව සහන් කර ඇත. | 2021 වර්ෂයේදි වැය විෂයයන් 19 ක් වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 30 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. |
| (එ) | දෙපාර්තමේන්තුවේ නිලධාරින් හතර දෙනෙකු අධ්‍යයන කටයුතු හා විදේශ රැකියාවක් සඳහා විදේශගත වී තිබුණි. එම නිලධාරින් අදාළ කාල සීමාව අවසානයේදී සේවය වාර්තා කර නොතිබුණත්, ඔවුන්ගෙන රජයට අයවිය යුතු රු.1,126,133 ක් වර්ෂ 03 ක සිට වර්ෂ 13 ක් | රජයට අයවිය යුතු මුදල් අයකර ගැනිමට කටයුතු කළ යුතුවිම | අදහස් දක්වා නැත. | 2022 මාර්තු මාසය වන විටත් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දක්වා කාල පරාසයක සිට අයකර ගෙන නොතිබුණි. ඉන් එක් නිලධාරියෙකු අධ්‍යයන නිවාඩු ලබා ගෙන විදේශගත වී තිබුණත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | | | |

**3.19 ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේදි දේශිය ව්‍යාපෘති 1,141 ක් හා විදේශිය ව්‍යාපෘති 257 ඇතුළුව මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 1,398 ක් වුවද, එයට අදාලව ක්ෂේත්‍ර චාරිකා 26ක් පමණක් ලඟා කර ගැනිම, මුළු ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 1.86 ක් වැනි පහළ මට්ටමක් බව නිරික්ෂණය විය | සැලසුම් කිරිමේදි ප්‍රමාණවත් ව්‍යාපෘති සංඛ්‍යාවක් ආවරණය වන බව තහවුරු විය යුතුය. | සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සඳහා ක්‍රමෝපායන් කිහිපයක් යොදා ගනු ලබන අතර, ක්ෂේත්‍ර චාරිකා මඟින් නිරීක්ෂණය ඉන් එක් ක්‍රමයකි.මෙම ක්ෂේත්‍ර චාරිකා සිදු කරනු ලබන්නේ ව්‍යාපෘති අධීක්ෂණයේදී වැඩිමනත් වශයෙන් ගැටලු මතු වී තිබෙන ව්‍යාපෘති සම්බන්ධයෙනි. එහෙයින් ව්‍යාපෘති ප්‍රමාණය සංඛ්‍යාත්මකව විශාල වුවද, කාර්ය මණ්ඩල හිඟකම හා කාල වේලාව මත ක්ෂේත්‍ර චාරිකා අඩු ප්‍රමාණයක් සිදු කළ බව | 2022 මාර්තු 23 දින වන විට 2021 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපාතිවල සම්බන්ධයෙන් ක්ෂේත්‍ර චාරිකා පිළිබඳ තොරතුරු ඇතුළත් ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් නොකරන ලදී. |
| (ආ) | 2018 ජුනි මසදී එළි දක්වන ලද ජාතික ඇගයිම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිම පිණිස වන ජාතික ඇගයිම් ප්‍රතිපත්ති රාමුව සැකසිම 2020 අගෝස්තු 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කළ යුතුවීම. | එම ප්‍රතිපත්ති රාමුවෙහි අමතර අදියරේ පැවති කෙටුම්පත තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ඒ පිළිබඳව දැනුම, පලපුරුද්ද සහිත ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් රැස්කොට එය | ජාතික ඇගැයීම් ප්‍රතිපත්ති රාමුව පිළියෙල කර ඇති බවත්, 2022 මාර්තු 23 දින වන විටත් එය මුද්‍රණය කර ප්‍රකාශයට පත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වැඩිදියුණු කර විස්තරාත්මක ප්‍රතිපත්ති රාමුවක් සැකසීමට හැකිවූ බව. | |
| (ඇ) | වටිනාකම රු.4,995,000 ක් වූ මෝටර්රථ දෙකක් වෙනත් ආයතන වෙත පැවරීම් කර තිබූ නමුත් එය මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් නොකිරීම නිසා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය නොවන වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගැනීම. | එකඟ වෙමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. | 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කර නොතිබුණි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිමය රු. 91,558,475 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිමය රු.91,370,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවායෙහි රු.188,475 ක වෙනසක් නිරීක්ෂණය විය. | මුදල් ප්‍රවාහයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළයුතුවීම. | එකඟ වෙමි. | 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කර නොතිබුණි |
| (ඉ) | භාණ්ඩාගාර පොත් අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු ශේෂයක් පෙන්වා නොතිබිය දීත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි භාණ්ඩාගාරයට පියවන ලද මුදල රු.76,673 ක් ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළයුතුවීම. | එකඟ වෙමි. | 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කර නොතිබුණි |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 880 ප්‍රකාරව ඇප තැබිය යුතු නිළධාරීන් විසින් ඇප තැන්පත් තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම. | ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැබීමට ඉදිරියේදී කටයුතු කරමි. | 2022 මාර්තු 23 දින වන විටත් අදාළ නිලධාරින්ගෙන් ඇප ගබා ගත් තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ල) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර, සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම. | ඉහත චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ බව පිළිගනිමි. එහෙත් මේ වනවිට මෙම දෙපාර්තමේන්තුව සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කරමින් පවතී. | 2022 මාර්තු 23 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ළු) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ **xxiv** වෙනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාර සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කල යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු ශේෂය වූ රු. 139,921 ක් වර්ෂ 5 ක කාලයක සිට අයකර ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කලයුතුවීම. | සේවය අතහැර ගොස් ඇති එම්.එස්.පී. පෙරේරා මහතාගෙන් අයවිය යුතු රු. 139,921 ක මුදල අයකර ගැනීමේ කටයුතු 2015.09.03 දින සිට ආරම්භ කර ඇත. අද දින වන විට මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් නෛතික කටයුතු සිදුකරමින් පවතී. | 2022 මාර්තු 23 දින වන විටත් ණය ශේෂය අයකර ගෙන නොතිබුනි. |
| (එ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුළ වර්ෂයට අදාලව යාවත්කාලීන කරන ලද දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය, අනුමත හා තථ්‍ය කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර හා වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා අක්මුදල් අවශ්‍යතා සැලැස්ම අන්තර්ගත කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර නොතිබූ පෙන්වා දී ඇති විස්තර ඉදිරි ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී ඇතුලත් කිරීමට කටයුතු කරමි. තවද දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය දැනටමත් යාවත්කාලීන කර ඇත. | 2022 වර්ෂයට ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්මේද එම අවශ්‍යතාවයන් ඉටු කර නොතිබුනි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | දෙපාර්තමේන්තුව තුළ අනුමත තනතුරු 107 ක් පැවතියද තථ්‍ය කාර්ය මණ්ඩලය 70ක් පමණක් විය. ඒඅනුව තනතුරු 37 ක පුරප්පාඩු පැවැති අතර එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 35 ක් වී තිබුණි. එම පුරපුපාඩු තුළ ජේෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක්, තෘතියික මට්ටමේ තනතුරු 04 ක් හා ද්විතීයික මට්ටමේ තනතුරු 20 ක්ද පවතින බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දැනුම්දීමට කටයුතු කර ඇත. තවද, අනපේක්ෂිත ලෙස ඇති වූ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ඇති වූ අපහසුතා හමුවේ මෙම වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් නැවතත් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමට අවස්ථාවක් නොවුණි.<br>පුරප්පාඩු පැවතුණද පවත්නා කාර්ය මණ්ඩලය උපයෝගී කරගෙන දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමට උපරිම උත්සාහය දරා ඇත. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 04 ක්ද, ද්විතීයික මට්ටමේ තනතුරු 14 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක්ද පුරප්පාඩුව පැවැතුණි. |

### 3.20 ශීර්ෂය 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2019 වර්ෂයේදී ඉටු කළ යුතුව තිබුණු කාර්යන්ට අදාළ ප්‍රගතිය කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණු අතර එම කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කිරීමට නොහැකිව පැවැතුණි. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් නියමිත පරිදි ඉටු කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. | 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී (සංශෝධන) පනතේ කෙටුම්පත් කටයුතු නීති කෙටුම්පත් සම්පාදක විසින් ආරම්භ කර ඇති බවත්, 2019 නොවැම්බර් මාසයෙන් පසු නව රජයක් පත්වීම හේතුවෙන් යළිත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු බව නීති කෙටුම්පත් සම්පාදක විසින් දන්වා ඇති බවත් 2020 පෙබරවාරි සිට 2020 අගෝස්තු දක්වා පාර්ලිමේන්තුවක් නොපැවැති බැවින් එකී කාලය තුළද එම කටයුතු සිදු කිරීමට නොහැකි වූ බවත් ඉදිරියේදී එම අනුමැතින් ලබා ගැනීමට කටයුතු කරන බවත් දන්වා එවා තිබුණි. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යයන් නිම කර නොතිබුණි. |
| (ආ) | 2018 වර්ෂයේ සිට පැවත එන පනත් කෙටුම්පත් 05 ක සංශෝධන කටයුතු 2019 දෙසැම්බර් 31 දින දක්වා නිම කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් නියමිත පරිදි ඉටු කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. | ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පනත් කෙටුම්පත සඳහා ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇති අතර, අමාත්‍ය | 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට නොහැකි වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොමැත. නව රජයේ ප්‍රතිපත්ති අනුව මෙම පනතේ ඉදිරි කටයුතු සිදු කරනු ඇත.<br>සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත සඳහා නව රජයේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුව ඇත.<br>ශ්‍රී ලංකා විගණන හා ගිණුම්කරණ ප්‍රමිත පනත් කෙටුම්පත සඳහා නව රජයේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කර ඇතත්, ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.<br>මූල්‍ය ක්ෂේත්‍ර යේ නියාමකයන්ගේ තොරතුරු හුවමාරුව සඳහා පනත් කෙටුම්පත සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව සංශෝධනද ඇතුළත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දින වන විට සමස්ථ අනුමත සේවක සංඛ්‍යාව 19 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 14 ක් වූ බැවින් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 26 ක් හෙවත් 05 දෙනෙකු ඌනව පැවැතුණි. | කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන කාර්ය මණ්ඩල පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | අධ්‍යක්ෂ ජනරාල් තනතුර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ යුතු තනතුරක් බවත්, තනතුරු දෙකක් 2020 වර්ෂය තුළදී පුරප්පාඩු වූ බවත් ඉතිරි පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කරන බවත් දන්වා එවා තිබුණි. | 2021 දෙසැම්බර් 31 දින වන විට තනතුරු පුරප්පාඩු 07 ක් පැවතින අතර ඉන් තනතුරු 04 ක් ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරු වේ. |

## 3.21 ශීර්ෂය 324 - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| (අ) | 2014 දෙසැම්බර් 30 දිනැති අංක 03/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට පටහැනිව විධායක නිලධාරීන්ට අන්තර්ජාල පහසුකම් සහිත ටැබ් පරිගණක ලබා දී ඒ වෙනුවෙන් රු.304,039 ක බිල්පත් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. | අදාල චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | කාර්යාලයෙන් පිටත පැවැත්වෙන රැස්වීම් සඳහා දත්ත ගබඩා කර ගෙන යාමට ලබා දී ඇත. අනුමත වියදම් සීමාවේ පමණක් කටයුතු කරන අතර ඒ තුළින් නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය පෙරට වඩා වැඩි වී ඇති බව දන්වමි. | 2022 මාර්තු 23 දින වන විටත් මේ සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ ආවරණ අනුමැතිය ලබා ගත් බවට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දින වන විට සමස්ථ අනුමත සේවක සංඛ්‍යාවෙන් 05 දෙනෙක් හෙවත් සියයට 09 ක් පුරප්පාඩුව පැවතුණි | මේ අයුරින් කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් එම පුරප්පාඩුව පිරවීමට හෝ එසේ නොවන්නේ නම් එම තනතුරු අහෝසි කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික මට්ටමේ සේවක පුරප්පාඩු 05 ක් පැවැති අතර ඉන් එක් තනතුරක් කාර්ය සහයක පුරප්පාඩුවක් මේ වන විට සම්පූර්ණ කර ඇත. ඉතිරි පුරප්පාඩු 04 රියදුරු සේවයේ වූ අතර එම පුරප්පාඩු පිරිවීමේ අවශ්‍යතාවය මෙතෙක් පැන නැගී නොතිබුණි. එම තනතුරු අහෝසි කිරිම සඳහා අදාළ අංශ දැනුවත් කර මේ වන විට කටයුතු | 2021 දෙසැම්බර් 31 දින වන විට සමස්ථ අනුමත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු 07 ක් පැවැතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කරමින් පැවැතින බව සඳහන් කර ඇත. | |
| (ඇ) | අභ්‍යන්තර විගණන කාර්යමණ්ඩලයේ ධාරිතාවය දියුණු කිරීමට ප්‍රධාන අභ්‍යන්තර විගණක හා අභ්‍යන්තර විගණකයින් සහ අනෙකුත් කාර්යමණ්ඩල සඳහා වන පුහුණු වැඩසටහන් සංඛ්‍යාවේ අපේක්ෂිත නිමැවුම සියයට 50 – 74 ක් වුවද, තථ්‍ය නිමැවුම සියයට 50 කට අඩු මට්ටමක පැවතුණි. | ඉලක්කගත කාර්යසාධන මට්ටම් කරා ළඟාවීමට උපරිම අයුරින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය | වාර්ෂික කාර්යසාධන වාර්තාවේ දක්වා ඇති අරමුණු ඉටුකිරීමේදී 2020 වර්ෂය සඳහා අපේක්ෂිත කාර්යසාධනය දක්වා ඇත. වර්ෂය තුළ අපේක්ෂා කල කාර්යසාධන පරාසය තුල මෙම සත්‍ය කාර්යසාධනය ලබාගෙන ඇත්තේ 2020 වර්ෂය තුල ඇති වූ කොවිඩ් වසංගත තත්වය මත වේ. එහිදී අපේක්ෂා නොකල හේතු මත අපේක්ෂිත කාර්යසාධනයේ උපරිමය වෙත ලගාවීමට නොහැකි වී ඇත. | 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ අපේක්ෂිත නිමවුම් මට්ටම හා තථ්‍ය නිමවුම් මට්ටම දක්වා නොතිබුණි. |
| (ඈ) | අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් මඟින්, විගණන හා කළමනාකරණ කමිටුවෙහි සුමට ක්‍රියාවලිය සහතික කිරීම සහ රාජ්‍ය අංශ ගිණුම් කටයුතු ශක්තිමත් කිරීමේ අපේක්ෂිත නිමැවුම සියයට 50 සිට 74 ක් දක්වා පරාසයක වුවද, තථ්‍ය නිමැවුම සියයට 52 ක්ව පැවතුණි. | ඉලක්කගත කාර්යසාධන මට්ටම් කරා ළඟාවීමට උපරිම අයුරින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය | 2020 වර්ෂය තුළ සැලැසුම් කළ පරිදි අමාත්‍යාංශ 30 ක්, දෙපාර්තමේන්තු 45 ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක්, පළාත් පාලන ආයතන 09 ක් හා විශේෂ වියදම් ඒකක 10 කට අදාළව ප්‍රසස්ථ මට්ටමින් විගණන හා කළමනාකරණ කමිටු සඳහා නියෝජිතයන් පත් කරන ලදී. ගෝලීය කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ දෙවන කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමේ | 2021 වර්ෂයේ පැවැත්වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 320 කින් 300 කට දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් සහභාගී වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දුෂ්කරතාවය හේතුවෙන් විගනන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරන ලදී. තුන්වන හා හතරවන කාර්තුවල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විමට උපදෙස් ලබා දෙන අතර මෙම කොවිඩ් වසංගත තත්ත්වය හමුවේද 2020 වර්ෂය අවසානයේ විගණන හා කළමනාකරණ කමිටු 241 කට දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් සහභාගී වී ඇත. | |

### 3.22 ශීර්ෂය 329 - තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබූ කාර්යසාධක දර්ශක 18 කින් ITMIS ක්‍රියාත්මක කිරීම සම්බන්ධව දිස්ත්‍රික්ක 25 තුළ රජයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, තොරතුරු තාක්ෂණ සඳහා රජයේ අනුබලදීමේ ව්‍යාපෘතියක් ලෙස Application Mobile App සංවර්ධනය කිරීමේ තරඟ රාජ්‍ය සේවක, විශ්වවිද්‍යාල සහ පාසල් මට්ටමෙන් පැවැත්වීම හා කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරීන් සඳහා වාර්ෂික බාහිර පුහුණු වැඩසටහනක් පැවැත්වීම යන දර්ශක 03 සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලසුම් කරන ලද අරමුණු ළඟා කරගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු විම. | සමස්ථ පුහුණු වැඩ සටහන් සඳහා වෙන් කළ ප්‍රතිපාදන 2019 ජූනි මස වෙනත් පුහුණු කටයුත්තක් සඳහා වැය කිරීමට සිදුවීම හේතුවෙන් ප්‍රතිපාදන නොමැතිවීමේ ගැටළුව මත සැලසුම් කළ පුහුණු වැඩ සටහන් පැවැත්වීමේ හැකියාවක් නොමැති වූ බව තවද, 2019 වර්ෂයේ රට තුළ සිදුවූ ත්‍රස්ත ප්‍රහාරය, සහ ජනාධිපතිවරණය හේතුවෙන් 2019 වර්ෂයේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් වියදම් කළමනාකරණය සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛවලට අනුව මෙම තරඟාවලිය සඳහා මුදල් වෙන් කිරීමටද හැකියාවක් නොපැවතුණු බව සහ බාහිර පුහුණු වැඩ සටහන සඳහා වැය කිරීමට ඉතිරි මුදල ප්‍රමාණවත් නොවූ බැවින් එම වැඩ සටහන පැවැත්වීමේ හැකියාවක් නොතිබුණු බව | 2022 මාර්තු 23 දින වන විටත් ITMIS වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| **(ආ)** | 2019 වර්ෂයේදි තනි කවුළු පද්ධතිය දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් හඳුනාගැනීම ප්‍රමාණවත් ලෙස සිදු කර නොතිබුණු අතර ක්‍රියාවලි ඩිජිටල්කරණය සිදු කර නොතිබුණි. | අපේක්ෂිත නිමවුම් මට්ටම ලඟාකර ගැනීම සඳහා කටයුතු කල යුතු වීම. | Single Window මෘදුකාංග 2018 නොවැම්බර් 26 දින සිට සජීවීව (live run) ක්‍රියාත්මක වේ. එම මෘදුකාංගය භාවිතයෙන් අන්තර්ජාලය මගින් ගෙවීමට මෘදුකාංගයද සංවර්ධනය කර ඉහත පද්ධතියට එක්කර ඇත. ගෙවීම් කවුළුවේ (Payment Gateway) පරීක්ෂණ කටයුතු අවසන් කර ඇත. නමුත් දේශීය බැංකු මඟින් මාර්ගගත ගෙවීම් සඳහා (Online Payment) අවශ්‍ය පහසුකම සපයා දිය යුතුය. කෙසේ වුවද ICTA ආයතනය ජාතික වෙළෙඳ කවුලුවක් (National Trade Portal) ආරම්භ කිරීමට කටයුතු කරමින් සිටී. එම ව්‍යාපෘතිය ප්‍රායෝගික වී පසු Single Window ව්‍යාපෘතියද එහි කොටසක් බවට පත්වනු ඇති බව | 2022 මාර්තු 23 දින වන විටත් තනි කවුළු පද්ධතිය දිවයින පුරා ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | මු.රෙ. 880 ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැන්පත් තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඇප තැන්පත් තැබීම සඳහා අදාළ වන නීත්‍යානුකූල පසුබිම සොයා බලා නිසි උපදෙස් ලබා ගෙන ඉදිරියේදී ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. | 2022 මාර්තු 23 දින වන විටත් ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප ලබා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | වැටුප් ගෙවීම් පද්ධතිය පුළුල් කිරීමේ අරමුණින් ඊ වැටුප් පද්ධතිය හඳුන්වා දී තිබුණු අතර, මූලිකව හඳුනාගත් දෙපාර්තමේන්තු අටෙහි හා ඉතිරි දෙපාර්තමේන්තු හයෙහි එම අරමුණ සියයට 70 ක් දක්වා පමණක් ලගාකරගෙන තිබුණි. | කාර්යභාරයන් යම් නියමිත කාලවකවාණුව තුළ සම්පූර්ණ කළ යුතු වීම. | e-Payroll වැටුප් ගෙවීම් පද්ධතිය මූලිකව හඳුනාගත් දෙපාර්තමේන්තු අටෙහි (ITMD, SAD, TOD, DFD, DMA, PED, LAD, TIPD) Parallel run, 2020 දෙසැම්බර් මස 31 වන දින වන විට 85% කින් අවසන්ව තිබු අතර, ඉතිරි දෙපාර්තමේන්තු හයෙහි 70% ක සාර්ථකත්වයක් ළඟා කර ගෙන තිබුණි. පද්ධතිය ක්‍රියාත්මක වීමේදී හඳුනාගත් නව අවශ්‍යතා සහ ගැටලු සකසා ගැනීමට තවදුරටත් කාලය අවශ්‍ය වූ බැවින් සහ රටේ උද්ගත වූ Covid -19 තත්ත්වය හේතුවෙන් පද්ධතිය භාවිතා කරන්නන් සහභාගී කරවා ගැනීමේදී ඇති වූ දුෂ්කරතා හේතුවෙන් Live run ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | 2022 මාර්තු 23 දින වන විටත් පද්ධතිය සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි. |
| (ඉ) | ආනයන/ අපනයන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක තනි කවුළු මෘදුකාංගය ක්‍රියාවට නැංවීමට අදාළව, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DAPH) සඳහා වන පද්ධතියේ සංවර්ධන කටයුතු සියයට 70 ක් දක්වා සම්පූර්ණ කර තිබුණි. | කාර්යභාරයන් යම් නියමිත කාලවකවාණුව තුළ සම්පූර්ණ කළ යුතු වීම. | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DAPH) සඳහා වන මෘදුකාංග පද්ධතියේ සංවර්ධන කටයුතු 70% අවසන්ව ඇත. ආනයන අපනයන ක්‍රියාවලිය සඳහා පොදුවේ සම්බන්ධ වන රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛත්වයෙන් යුතුව Single Window වැඩ සටහන | 2022 මාර්තු 23 දින වන විටත් පද්ධතිය පූර්ණ ලෙස ක්‍රියාත්මක කර නොතිබුනි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඉදිරියට ගෙන යාමට කටයුතු කර ඇති අතර, මේ සම්බන්ධව භාණ්ඩාගාර ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් විසින් අධීක්ෂණය සිදු කෙරේ. | |
| (ඊ) | රජයේ නිලධාරීන්ට තීරු බදු රහිතව වාහන ආනයනය කිරීමේ අයදුම්පත් මාර්ගගතව යොමු කිරීමේ පද්ධතිය සංවර්ධනය කොට 2020 වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොපැවතුණි | කාර්යභාරයන් යම් නියමිත කාලවකවාණුව තුළ සම්පූර්ණ කළ යුතු වීම. | වාහන ආනයනය කිරීමේ අයදුම්පත් මාර්ගගතව යොමු කිරීමේ පද්ධතියේ මුල් අවස්ථාවේදී හඳුනාගත් අවශ්‍යතාවලට අමතර TIPD වෙතින් නව අවශ්‍යතා අප වෙත ලබා දුන් අතර ඒ අනුව පද්ධතිය සංවර්ධනය කරමින් පවතී. | 2022 මාර්තු 23 දින වන විටත් අදාළ පද්ධතිය ක්‍රියාත්මකකර නොතිබුණි. |
| (උ) | තෘතියික මට්ටමේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුර 2020 ඔක්තෝබර් මාසයේ සිට පුරප්පාඩුව පවතින බවත් මෙතෙක් එම තනතුර පිරවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අයත් වන බැවින්, එම පුරප්පාඩුව සම්පූර්ණ කර දෙන ලෙස රාජ්‍ය සේවා හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් කර ඇත. | 2022 මාර්තු 23 දින වන විටත් පුරප්පාඩු වූ තනතුර පුරවා නොතිබුණි. |

**3.23 ශීර්ෂය - 333කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති මතය තත්ත්වාගණනය කළ මතය - 2018

තත්ත්වාගණනය නොකළ මතය - 2019

තත්ත්වාගණනය නොකළ මතය - 2020

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10:1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව 2020 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් වැයකිරීම් යටතේ පුද්ගල පඩිනඩි වියදම් රු.29,708,387 ක් ද වෙනත් වැය ශීර්ෂයයන් වෙනුවෙන් දරන ලද වියදම් රු.167,344 ක් ද වශයෙන් දැක්විය යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු නොකර පුද්ගල පඩිනඩි වියදම් ලෙස රු.29,875,732 ක් දක්වා තිබුණි. | අදාළ මාර්ගෝපදේශය අනුව ගෙවීම් වෙන් වෙන්ව දැක්විය යුතුවීම. | මෙම වෙනස වන්නේ මෙම කාර්යාලයේ නිලධාරීන්ගේ මැතිවරණ දීමනා වශයෙන් ගෙවූ රු. 167,344 ක් බවත්, මෙම කාර්යාලයට අදාල අක්මුදල් වලින් ගෙවීම් කර ඇති අතර රු. 167,344 ක මුදල් ගලායෑමක් සිදුව ඇති බැවින් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර ඇති බවත් දන්වා එවා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල 2020 වර්ෂයට අදාල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අගයන් නැවත ගලපා ඇත. |
| (ආ) | 2020 වර්ෂය තුළ අත්තිකාරම් අයකර ගැනීම් රු.2,164,817 ක් වී තිබුණත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම අගය රු.1,311,927 ක් ලෙස දක්වා තිබුණි. ඒ නිසා මුදල් ගලාඒම් රු. 882,890 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මාර්ගෝපදේශය අනුව දල වටිනාකම් අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළයුතු වීම. | වර්ෂය තුළ අත්තිකාරම් අයකර ගැනීම් වටිනාකම රු. 2,164,817 ක් බවත්, එම වටිනාකමින් රු.1,311,927 ක් මුදලින් අයකර ගෙන ඇති බවත් රු.852,890 ක් හරස් සටහන් අයකර ගෙන | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල 2020 වර්ෂයට අදාල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අගයන් නැවත ගලපා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඇති බැවින් එහි මුදල් ගලා ඒමක් සිදුව නැති බැවින් එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | |
| (ඇ) | රජයට අයත් සියලුම මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම සඳහා මධ්‍යගත දත්ත පද්ධතියක් ඇති කිරීමට නව මෘදුකාංගයක් ආරම්භ කිරීමේ නිමැවුම සියයට 50 – 74 අතර ප්‍රමාණයක් විය. | ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ඉලක්ක උපරිමව ළඟාකර ගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | අදාළ මෘදුකාංගය සකස් කිරීම ITMIS ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලැබිය යුතු අතර කටයුතු ඉතා ඉක්මනින් සිදු කරන ලෙස ඉල්ලීම් ගණනාවක් සිදු කර සාකච්ඡා කිහිපයක් පවත්වා ඇති බවත් එම කටයුතු කඩිනම් කිරීම මෙම කාර්යාලයේ පාලනයෙන් බැහැර බව | 2022 පෙබරවාරි මාසය වන විටත් කටයුතු අවසන් වී නොතිබුණි. |

ඇමුණුම **01**

**එක් එක් මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය**

| ශීර්ෂය | ආස්ථිතොයේ නම | | 2018 | | | 2019 | | | 2020 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 1 | අතිගරු ජනාධිපති | 10,888 | 8,049 | 2,839 | 15,297 | 10,258 | 5,039 | 7,423 | 5,903 | 1,520 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 1,963 | 951 | 1,012 | 1,721 | 881 | 840 | 983 | 903 | 80 |
| 24 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | 85 | 68 | 17 | 105 | 89 | 16 | 88 | 75 | 13 |
| 102 | මුදල් අමාත්‍යාංශය | 6,290 | 4,130 | 2,160 | 6,385 | 3,452 | 2,933 | 39,451 | 37,848 | 1,603 |
| 413 | මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 31 | 19 | 12 |
| 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 211 | 122 | 89 | 438 | 150 | 288 | 149 | 143 | 6 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 4,082 | 61 | 4,021 | 1,757 | 65 | 1,692 | 59 | 51 | 8 |
| 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 4,411 | 4,354 | 57 | 2,805 | 2,750 | 55 | 1,764 | 1,575 | 189 |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 7,087 | 6,244 | 843 | 22,406 | 6,067 | 16,339 | 54,244 | 28,214 | 26,030 |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 9,147 | 8,718 | 429 | 27,426 | 26,767 | 659 | 59,344 | 51,744 | 7,600 |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 87 | 82 | 5 | 96 | 80 | 16 | 85 | 77 | 8 |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 15,285 | 12,463 | 2,822 | 28,615 | 14,163 | 14,452 | 87,522 | 84,146 | 3,376 |
| 244 | වෙළෙඳ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 292 | 287 | 5 | 61 | 56 | 5 | 57 | 50 | 7 |
| 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 217 | 190 | 27 | 116 | 83 | 33 | 74 | 73 | 1 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 2,108,659 | 2,093,930 | 14,729 | 2,232,925 | 2,013,110 | 219,815 | 1,999,326 | 1,944,180 | 55,146 |
| 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 57 | 54 | 3 | 92 | 62 | 30 | 83 | 66 | 17 |
| 251 | තක්සේරු දෙපාර්තමේන්තුව | 807 | 519 | 288 | 652 | 641 | 11 | 672 | 645 | 27 |
| 252 | ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 998 | 911 | 87 | 1,064 | 1,028 | 36 | 1,332 | 1,072 | 260 |
| 280 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 104 | 98 | 6 | 104 | 99 | 5 | 98 | 94 | 4 |
| 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | 12 | 12 | 0 | 14 | 13 | 1 | 16 | 13 | 3 |
| 324 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 53 | 49 | 4 | 57 | 52 | 5 | 56 | 52 | 4 |
| 329 | තොරතුරු තාක්ෂණ කළමනාකරණ | 271 | 130 | 141 | 404 | 340 | 64 | 465 | 407 | 58 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දෙපාර්ත මේන්තුව | | | | | | | | | |
| 333 | කො ම්ට්‍රෝලර් ජනරාල් කාර්යාල ය | 47 | 23 | 24 | 48 | 27 | 21 | 35 | 31 | 4 |
| | එකතුව | **2,171,053** | **2,141,445** | **29,608** | **3,342,588** | **2,080,233** | **262,355** | **2,253,357** | **2,157,381** | **95,976** |

**ඇමුණුම 02**

**එක් එක් මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, සත්‍ය ආදායම සහ ඇස්තමේන්තුගත ආදායම ඉක්මවීම හෝ ඌනතාවය**

| ශීර්ෂය | ආදායම් සංකේතය | ආදායම | | 2018 | | | 2019 | | | 2020 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඇස්තමේන්තුග ත රු.මිලියන | සත්‍ය රු.මිලියන | වෙනස රු.මිලියන | ඇස්තමේන්තුග ත | සත්‍ය රු.මිලියන | වෙනස රු.මිලියන | ඇස්තමේන්තුග ත | සත්‍ය රු.මිලියන | වෙනස රු.මිලියන |
| 238 | **10.02.10.00** | සමාජ වගකීම් බද්ද | 0 | 0 | 0 | 0 | 172 | (172) | 0 | 16 | (16) |
| 238 | **20.05.01.00** | මහ බැංකුවේ ලාභ | 10,000 | 15,000 | (5,000) | 15,000 | 0 | 15,000 | 24,000 | 24,009 | (9) |
| 240 | 20.03.04.00 | රජයේ නිලධාරීන්ට ලබා දෙන යතුරු පැදි සම්බන්ධ මූලික ගෙවීම | 0 | 39 | (39) | 0 | 7 | (7) | 0 | 1 | (1) |
| 241 | **20.02.03.00** | ලාභ | 50,000 | 37,230 | 12,770 | 63,900 | 22,833 | 41067 | 16,500 | 14,768 | 1,732 |
| 241 | **20.02.04.00** | ලාභාංශ | 5,600 | 4,598 | 1,002 | 6,100 | 5,024 | 1,076 | 3,500 | 2,855 | 645 |
| 241 | 20.02.05.00 | රාජ්‍ය අරමුදල්වල අතිරික්ත අරමුදල් මාරු කිරීම | 0 | 0 | | 0 | 0 | 0 | 0 | 0 | 0 |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 241 | 20.03.02.20 | ගිණුම් හා විගණන ප්‍රමිති සෙස් බද්ද | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 241 | 20.06.01.00 | පැවැරීමෙන් ලත් මුදල් | 0 | 107,883 | (107,883) | 0 | 3,111 | (3,111) | 0 | 0 | 0 |
| 249 | 10.03.06.00 | පරිසර සංරක්ෂණ බද්ද | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 249 | 10.03.07.07 | තරු පහේ හෝටල් කාමර සඳහා බද්ද | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 249 | 20.02.01.99 | අනෙකුත් කුලී | 120 | 1,792 | (1,672) | 2,350 | 956 | 1,394 | 8,800 | 8,555 | 245 |
| 249 | 20.02.02.01 | ණයදිම් වෙනුවෙන් පොලී | 4,300 | 6,213 | (1,913) | 7,000 | 6,700 | 300 | 5,500 | 5,783 | (283) |
| 249 | 20.02.02.99 | අනෙකුත් කුලී | 1,300 | 1,928 | (628) | 3,000 | 7,119 | (4,119) | 1,500 | 1,514 | (14) |
| 249 | 20.03.01.00 | දෙපාර්තමේන්තුමය විකිණීම් | 117 | 162 | (45) | 170 | 117 | 53 | 100 | 88 | 12 |
| 249 | 20.03.02.99 | විවිධ ලැබීම් | 11,500 | 8,643 | 2,857 | 10,000 | 6,689 | 3,311 | 7,000 | 5,694 | 1,306 |
| 249 | 20.03.03.02 | දඩ මුදල් හා රාජසංස්තක කිරීම් - අනෙකුත් | 2,100 | 1,582 | 518 | 1,700 | 1,779 | (79) | 1,100 | 1,744 | (644) |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 249 | 20.03.05.00 | භාණ්ඩාගාර බැඳුම්කර අධිභාර | 1 | 582 | 581 | 880 | 1,700 | (820) | 5,000 | 5,536 | (536) |
| 249 | 20.03.99.00 | අනෙකුත් ලැබීම් | 15,000 | 37,456 | (22,456) | 47,500 | 10,484 | 37,016 | 8,500 | 11,701 | (3,201) |
| 249 | 20.05.99.00 | ජාතික ලොතරැයි මණ්ඩල හා අනෙකුත් පැවැරුම් | 2,000 | 3,261 | (1,261) | 4,000 | 3,141 | 859 | 3,000 | 2,959 | 41 |
| 249 | 20.06.04.00 | ණය ආපසු අයකර ගැනීම් | 16,800 | 25,584 | (8,784) | 28,000 | 18,271 | 9,729 | 15,000 | 19,429 | (4,429) |
| 249 | 30.01.01.00 | විදේශ ප්‍රදානයන් | 10,000 | 12,486 | (2,486) | 13,000 | 7,909 | 5,091 | 8,000 | 5,348 | 2,652 |
| 333 | 20.06.02.01 | වාහන | 135 | 313 | (178) | 350 | 188 | 162 | 175 | 201 | (26) |
| 333 | 20.06.02.02 | වෙනත් | 31 | 27 | 4 | 50 | 2,686 | (2,636) | 25 | 56 | (31) |
| | එකතුව | | **129,004** | **264,779** | **(135,775)** | **203,000** | **98,886** | **104,114** | **107,700** | **110,257** | **(2,557)** |

ඇමුණුම 03

**එක් එක් මුදල් වර්ෂය අවසානයට පැවැති අග්‍රිම ගිණුම්වල ශේෂ**

| ශීර්ෂය | ආයතනයේ නම | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 1 | අතිගරු ජනාධිපති | 21,378 | 68 | 0 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 0 | 0 | 0 |
| 24 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | 49,289 | 0 | 1,222,837 |
| 102 | මුදල් අමාත්‍යාංශය | 21,984,435 | 1,136,016 | 0 |
| 413 | මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය | 0 | 0 | 460 |
| 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 93,099 | 15,227 | 912 |
| 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 305,024 | 310,093 | 4,373 |
| 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 27,815 | 31,925 | 944,817 |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 83,325 | 635,608 | 347,871 |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 132,085 | 516,088 | 0 |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 161,288 | 607,023 | 134,677 |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 0 | 212,059 | 0 |
| 244 | වෙළෙඳ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 12,188 | 523,285 | 37,670 |
| 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 436,066 | 1,045,734 | 0 |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 15,301 | 824,983 | 14,810 |
| 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 333,273 | 161,972 | 3,600 |
| 251 | තක්සේරු දෙපාර්තමේන්තුව | 821 | 1,761,830 | 46,982,051 |
| 252 | ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 3,192,199 | 464,931 | 307,874 |
| 280 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 0 | 0 | 0 |
| 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | 231,695 | 128,335 | 0 |
| 324 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 124 | 200 | 15,309 |
| 329 | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | 1,027,515 | 204,040 | 316,061 |
| 333 | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය | 697 | 4,985 | 29,983 |
| | **එකතුව** | **28,107,617** | **8,584,402** | **50,363,305** |

ඇමුණුම **04**

**එක්.එක් මුදල් වර්ෂය අවසානයට පැවැති තැන්පත් ගිණුම්වල ශේෂ**

| ශීර්ෂය | ආස්ථිතොයේ නම | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 1 | අතිගරු ජනාධිපති | 626,517,845 | 625,196,063 | 303,949,862 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 28,056,950 | 31,648,944 | 31,827,802 |
| 24 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | 330,107 | 320,487 | 0 |
| 102 | මුදල් අමාත්‍යාංශය | 48,720,172 | 123,286,374 | 113,767,918 |
| 413 | මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය | 0 | 0 | 0 |
| 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 0 | 0 | 7,450 |
| 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 41,027 | 41,400 | 41,400 |
| 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 0 | 0 | 0 |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 227,604,740 | 177,534,240 | 10,877,272 |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 0 | 44,875 | 6,200 |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 0 | 12,845 | 100 |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 32,318,374 | 16,364,247 | 734,614 |
| 244 | වෙළෙඳ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 0 | 0 | 0 |
| 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 0 | 0 | 0 |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 5,807,376,835 | 6,358,801,170 | 2,564,194,998 |
| 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 0 | 0 | 4,525 |
| 251 | තක්සේරු දෙපාර්තමේන්තුව | 51,374,420 | 12,232,291 | 50,217,219 |
| 252 | ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 24,981,663 | 12,496,478 | 8,398,545 |
| 280 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 0 | 0 | 1,000 |
| 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | 0 | 0 | 0 |
| 324 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 0 | 0 | 0 |

| | | | | |
|---|---|---|---|---|
| 329 | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | 0 | 0 | 211,739 |
| 333 | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය | 0 | 0 | 0 |
| | **එකතුව** | **6,847,322,133** | **7,357,979,414** | **3,084,240,644** |

ඇමුණුම 5

**එක් එක් මුදල් වර්ෂය අවසාන වන විට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ශේෂ**

| ශීර්ෂය | ආස්ථිතොයේ නම | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 1 | අතිගරු ජනාධිපති | 105,165,600 | 105,985,040 | 78,285,473 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 41,127,609 | 47,892,354 | 51,226,288 |
| 24 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | 1,754,777 | 3,287,856 | 2,315,634 |
| 102 | මුදල් අමාත්‍යාංශය | 79,203,551 | 63,782,908 | 80,546,572 |
| 413 | මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය | 0 | 0 | 4,671,114 |
| 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 16,838,169 | 14,335,196 | 14,042,155 |
| 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 9,862,527 | 9,218,710 | 7,056,670 |
| 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 19,554,496 | 22,254,524 | 21,153,730 |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 27,082,353 | 26,471,732 | 24,914,348 |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 14,941,519 | 14,422,449 | 12,966,600 |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 16,191,148 | 15,040,803 | 13,054,062 |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 8,587,968 | 7,718,269 | 6,947,352 |
| 244 | වෙළෙඳ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 9,994,410 | 10,249,669 | 8,941,045 |
| 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 12,411,833 | 12,584,017 | 13,319,385 |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 24,391,967 | 25,280,777 | 23,258,233 |
| 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 9,812,741 | 9,458,570 | 8,614,721 |
| 251 | තක්සේරු දෙපාර්තමේන්තුව | 90,197,826 | 93,119,762 | 91,234,604 |
| 252 | ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 117,571,630 | 118,554,297 | 97,583,284 |
| 280 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 12,540,163 | 12,865,279 | 10,666,254 |
| 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | 2,289,838 | 2,384,254 | 2,179,936 |
| 324 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 9,173,835 | 9,344,776 | 9,321,799 |

| | | | | |
|---|---|---|---|---|
| 329 | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | 5,827,473 | 6,683,138 | 5,832,058 |
| 333 | කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය | 4,799,510 | 6,194,948 | 5,987,908 |
| | **එකතුව** | **639,320,943** | **637,129,328** | **594,119,225** |

ඇමුණුම **06**

**එක් එක් මුදල් වර්ෂය අවසානයට පැවැති මූල්‍ය නොවන වත්කම්**

| ශීර්ෂය | ආස්ථිතෙයේ නම | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 1 | අතිගරු ජනාධිපති | 648 | 41,506 | 41,554 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 19,740 | 19,877 | 19,900 |
| 24 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | 0 | 23 | 0 |
| 102 | මුදල් අමාත්‍යාංශය | 11,374 | 13,169 | 14,323 |
| 413 | මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය | 0 | 0 | 20 |
| 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 101 | 103 | 87 |
| 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 43 | 33 | 33 |
| 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 118 | 114 | 143 |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 24,897 | 21,737 | 21,744 |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 33 | 35 | 35 |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 42 | 40 | 33 |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 1,636 | 1,706 | 1,712 |
| 244 | වෙළෙඳ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 57 | 59 | 59 |
| 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 35 | 35 | 63 |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 40 | 38 | 71 |
| 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 37 | 37 | 38 |
| 251 | තක්සේරු දෙපාර්තමේන්තුව | 0 | 392 | 392 |
| 252 | ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 2,773 | 2,915 | 2,942 |
| 280 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 54 | 67 | 68 |
| 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | 7 | 7 | 7 |
| 324 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 25 | 25 | 25 |
| 329 | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | 0 | 42 | 43 |
| 333 | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය | 0 | 10 | 12 |
| | **එකතුව** | **61,660** | **101,970** | **103,304** |

ඇමුණුම 07

**එක් එක් මුදල් වර්සය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිගේ මතය**

| ශීර්ෂය | විගණන ආස්‍රිතායය | විගණන මතය | | |
|---|---|---|---|---|
| | | **2018** | **2019** | **2020** |
| 1 | අතිගරු ජනාධිපති | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 24 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 102 | මුදල් අමාත්‍යාංශය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 413 | මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය | - | - | තත්ත්වාගණනය නොකළ මතය |
| 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 244 | වෙළෙඳ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |

| | | | | |
|---|---|---|---|---|
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 251 | තක්සේරු දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 252 | ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 280 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 324 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| 329 | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |
| 333 | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය නොකළ මතය | තත්ත්වාගණනය නොකළ මතය |
| - | රජයේ මුල්‍ය ප්‍රකාශන | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |